මූලික පිරිවෙන් අවසාන විභාගය

# පාලි භාෂාව

## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සංග්‍රහය



පදියතලාවේ ඤාණවිමල හිමි

# පොත ගැන වචනයක්

පිරිවෙන් විෂය මාලාවේ පාලි විෂයයට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. එය පිරිවෙන් අධ්‍යාපනයේ ජීවනාලිය බඳු ය. මූලික පිරිවෙන් පන්තියට පැමිණෙන ගිහි පැවිදි ශිෂ්‍යයෝ මූලික පිරිවෙන් අවසාන විභාගයට පෙනී සිටීමෙන් අනතුරුව මූලික අධ්‍යාපනයට සමු දී උසස් අධ්‍යාපනයට ප්‍රවිෂ්ට වෙති. පාසල් ශිෂ්‍යයන්ට මෙන් පිරිවෙන් ශිෂ්‍යයන්ට උපකාරක පන්ති ක්‍රියාත්මක වන්නේ ඉතාමත් අවම මට්ටමෙනි. එසේම අද වන විට පාසල් විෂය ආවරණය කරමින් ආදර්ශ ප්‍රශ්නෝත්තර සංග්‍රහ සහ සා.පෙළ/ උ.පෙළ විභාග පසුගිය ප්‍රශ්නපත්‍ර ඇතුළත් ප්‍රශ්නෝත්තර සංග්‍රහ ඕනෑතරම් තිබේ. එහෙත් පිරිවෙන් ශිෂ්‍යයාට එවැනි දායකත්වයක් ලැබෙන්නේ කලාතුරකිනි. පිරිවෙන් විෂය මාලාවට අදාළව ප්‍රශ්නෝත්තර සංග්‍රහ රචනා වන්නේ නැත. මෙවැනි තත්ත්වයක් යටතේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ගිහිපැවිදි ශිෂ්‍යයන් ඉලක්ක කරගනිමින් පාලි විෂයයට ප්‍රශ්නාවලී සංග්‍රහයක් ලිවීමේ අභිලාෂයෙන් පෙළඹුණේ නව විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමත් සමග ය.

පැරණි විෂය නිර්දේශය බැහැර කොට නව විෂය නිර්දේශයක් හඳුන්වා දීමත් සමග එක් පැත්තකින් ශිෂ්‍යයාට සතුටුදායක තත්ත්වයක් උදා වූ අතර තවත් පැත්තකින් උදා වූයේ කණස්සලු තත්ත්වයකි. ඔවුන්ගේ කණස්සලු තත්ත්වය ඇති වීම කෙරෙහි බලපෑයේ ප්‍රශ්න පත්‍ර සකස් වන්නේ කෙසේදැයි ස්ථිර සාර නිගමනයක් ඔවුන් තුළ නොමැති වීමෙනි. එහෙත් නව විෂය නිර්දේශයට අදාළව අලුතින් ප්‍රශ්න පත්‍ර ආකෘති ඇතුළත් කෘතියක් ලැබීමෙන් ඔවුන් තරමක් හෝ සතුටු වන්නට ඇත.

පිරිවෙන් අධ්‍යාපනය ලබන ගිහි පැවිදි ශිෂ්‍යයන් වෙනුවෙන් ආචාර්ය භික්ෂූන් වහන්සේ හා ගිහි ආචාර්ය මණ්ඩලය විශාල කැපකිරීමක් සිදු කරති. මූලික පිරිවෙන් අවසාන විභාගයෙන් ඉහළ සාමර්ථ්‍යයක් ලබා දීම සඳහා ඔවුහු අත්‍යන්තයෙන් කැපවෙති. මෙහි ඇතුළත් ප්‍රශ්න පත්‍ර ද මා පිරිවෙණේ අධ්‍යාපනය හදාළ හා වත්මනේ අධ්‍යාපනය ලබන සිසුන් ඉලක්ක කරගනිමින් නිර්මාණය කළ ඒවා ය. ඒවා එක්කොට ගනිමින් පොතක් වශයෙන් පළ කරන්නේ සමස්ත පිරිවෙන් පද්ධතියේ ම මූලික පිරිවෙන් අවසාන විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන ශිෂ්‍යයන්ට උපකාර කිරීමක් වශයෙනි.

ප්‍රශ්න පත්‍රයක් නිර්මාණය කොට නිම කිරීම යනු සුළු පටු කටයුත්තක් නොවේ. ශිෂ්‍යයාට ගැළපෙන, දැනුමට සරිලන අන්දමෙන් එය මුසු විය යුතු ය. එසේම සමස්ත විෂය නිර්දේශය ආවරණය විය යුතුය. ආකෘතියට ගැළපිය යුතු ය. මේ කාර්යයේ දී මා දිරිමත් කළ පිරිස් බොහෝ වෙති. ඒ සැමට මෙහි දී තුති පුද කරමි. මෙහි පරිගණක අක්ෂර දෝෂ තිබිය හැකිය. ඒවා ඇතොත් සකස් කරගෙන පරිශීලනය කරන්න. කර්තෘ අයිතිය සුරකින්න.

නවතිමි.


රාජකීය පණ්ඩිත පදියතලාවේ ඤාණවිමල හිමි

මො / ශ්‍රී විද්‍යානන්ද පිරිවෙණ

යල්කුඹුර - බිබිල

077 84 38 4 17

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

## පාලි භාෂාව 1

## ආදර්ශ ප්‍රශ්න පත්‍ර 01

කාලය පැයයි.

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 1 බැගින් 40කි.**
- **අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.**
- **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) යොදන්න.**

**1.** පාලි අක්ෂර මාලාවේ දීර්ඝ ස්වර සංඛ්‍යාව,

1. 3කි. 2. 5කි. 3. 4කි. 4. 8කි.

**2.** වර්ගාක්ෂර හඳුන්වන තවත් නාමයක් වන්නේ,

1. වර්ගාන්තාක්ෂර 2. අන්තස්ථාක්ෂර 3. ස්පර්ශාක්ෂර 4. ඊෂත්පෘෂ්ට

**3.** සත්තමී විභක්තියේ ප්‍රත්‍යය මාලාව වන්නේ,

1. සි, යො 2. නා, හි 3. ස, නං 4. ස්මිං, සු

**4.** සර්වනාම ශබ්ද පමණක් ඇතුළත්ව ඇති වර්ණය වන්නේ,

1. එත, ත, ඉම 2. සබ්බ, පුබ්බ, අසුර 3. රාජ, අඤ්ඤ, තුම්හ 4. ඉතර, කතම, බ්‍රහ්ම

**5.** තතියා හා කරණ විභක්ති සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. මෙම විභක්ති දෙක වරනැගීම සමාන වුව ද අර්ථ දෙකක් ප්‍රකාශ වේ.
2. සම්ප්‍රදානාර්ථය සඳහා මෙම විභක්ති දෙක යෙදේ.
3. තතියා යනු උක්තාර්ථය වන අතර කරණ යනු අනුක්ත අර්ථය යි.
4. නාම වරනැගීමේ දී කරණ විභක්තිය පළමුවත් තතියා විභක්තිය දෙවනුවත් වරනැගේ.

**6.** සමානාර්ථ පදයක් නොවන්නේ,

1. තෙවීසති තෙවීස 2. අට්ඨාරස අට්ඨාදස 3. චුද්දස චතුද්දස 4. සත්ත සත්තති

**7. යොජනං වනරාජී හවති** යන වැකියෙහි අංකිත පදයේ විභක්ති ප්‍රයෝගය වන්නේ,

1. අච්චන්ත සංයෝගය 2. ක්‍රියා විශේෂණාර්ථය

3. කාලවාචී පද දුතියා 4. කර්මප්‍රවචනීයාර්ථ

**8. බ්‍රහ්මාති ......................... පුබ්බාචරියාති වුච්චරෙ** යන පාඨයෙහි හිස් තැනට වඩාත් උචිත පදය වන්නේ,

1. රාජපුරිසො 2. මාතුභගිනි 3. මාතාපිතරො 4. පුත්තධීතා

**9.** සහාදි යෝගය සඳහා නිදසුනක් වන්නේ,

1. තෙන සද්ධිං පඤ්චසතා භික්ඛූ මග්ගං පටිපජ්ජිංසු.

2. සො එරසුනා රුක්ඛං ඡින්දි.

3. වනිතා සරෙ ජීවති.

4. පුබ්බණ්හ සමයෙ භගවා පිණ්ඩාය පාවිසි.

**10.** ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලද්දේ,

1. ලෝවාමහා ප්‍රාසාදයේ දී ය. 2. අළුවිහාරේ දී ය.

3. මිහින්තලාවේ දී ය. 4. ජේතවනාරාමයේ දී ය.

**11.** ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ පමණක් ඇතුළත් වරණය වන්නේ,

1. උදාන, ඉතිවුත්තක, නිධාන 2. ථෙර ගාථා, ථෙරීගාථා, ඉතිවුත්තක

3. පරිවාර පාළි, සුත්ත නිපාත, ජාතක 4. ධම්මපද, ඛුද්දක පාඨ, මිලින්ද පඤ්හ

**12.** ඛුද්දක නිකායට අයත් 'උදාන' ,

1. පළමු ග්‍රන්ථය යි. 2. දෙවන ග්‍රන්ථය යි.

3. තෙවන ග්‍රන්ථය යි. 4. සිව්වන ග්‍රන්ථය යි.

**13.** සොමනස්සඤාණමයිකඤ්ච ........................... ද්වෙ අසීති සුත්තන්තා උදානන්ති වේදිතබ්බං මෙහි හිස් තැනට යෙදිය යුතු පදය වන්නේ,

1. ගාථාපටිසංයුත්තා 2. දීසමාදිකෙ 3. කෙනත්ථෙන 4. බුද්ධවචනං

**14.** සුඛිනො ....... යෙ අකිඤ්චනා ............ හි ජනා අකිඤ්චනා යන පාඨයේ හිස්තැන් සඳහා යෝග්‍ය පද යුගල වන්නේ,

1. ධම්මො සංඝො 2. වත වෙදගුණො 3. ජාතා දුක්ඛා 4. සත්තා තිරච්ඡානා

**15.** අපදාන ප්‍රධාන කොටස් 4ට අයත් නොවන්නේ,

1. බුද්ධාපදාන 2. ථෙරාපදාන 3. පච්චෙකබුද්ධාපදාන 4. ධම්මාපදාන

**16.** ථෙරී අපදානයට අයත් වර්ග ගණන වන්නේ,

1. 4 කි. 2. 6 කි. 3. 5 කි. 4. 3 කි.

**17.** භික්ඛුණී උපස්සයෙ යන්නෙහි නිවැරදි අර්ථය වන්නේ,

1. භික්ෂුණීන්ගේ පරපුරෙහි යන්න ය. 2. භික්ෂුනියගේ තනතුරෙහි යන්න ය.

3. භික්ෂුණී ආරාමයෙහි යන්න ය. 4. භික්ෂුණී නිකායෙහි යන්න ය.

**18.** ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ පිරිවර භික්ෂුණීන් ගණන වන්නේ,

1. දහසකි 2. තුන්සියයකි 3. පන්සියයකි 4. පන්දහසකි

**19.** ප්‍රජාපතී ගෝතමී තෙරණිය චිරරාත්‍රඥ අග්‍ර තනතුර සඳහා ප්‍රාර්ථනා ඇති කරගත්තේ,

1. කස්සප බුදුරජාණන් වහන්සේගේ සාසනයේ දී ය.

2. පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ සාසනයේ දී ය.

3. කකුසඳ බුදුරජාණන් වහන්සේගේ සාසනයේ දී ය.

4. කෝණාගම බුදුරජාණන් වහන්සේගේ සාසනයේ දී ය.

**20.** න **භජෙ** පාපකෙ මිත්තෙ න **භජෙ** පුරිසාධමෙ මෙහි ඇති **භජෙ** යනු,

1. පඤ්චමී ආඛ්‍යාත පදයකි. 2. සත්තමී ආඛ්‍යාත පදයකි.

3. වත්තමාන ආඛ්‍යාත පදයකි. 4. අජ්ජතනී ආඛ්‍යාත පදයකි.

**21.** අනුමති අර්ථය ප්‍රකාශ කරන්නේ,

1. භවිස්සන්ති ආඛ්‍යාතයෙන් ය. 2. පඤ්චමී ආඛ්‍යාතයෙන් ය.

3. සත්තමී ආඛ්‍යාතයෙන් ය. 4. පරොක්ඛා ආඛ්‍යාතයෙන් ය.

**22.** අඤ්ඤතරා දෙවතා භගවතො සන්තිකෙ ධම්මසවණත්ථාය නිසීදිංසු මෙහි ඇති උක්ත පදය වන්නේ,

1. අඤ්ඤතරා 2. දෙවතා 3. භගවතො 4. ධම්මසවණත්ථාය

**23.** ව්‍යඤ්ජන ආගමයක් සිදුවන සන්ධිය ඇතුළත් සූත්‍රය වන්නේ,

1. සරා සරෙ ලොපං 2. යවමදනතරළාවාගමා

3. ක්වචාසවණ්ණං ලුත්තෙ 4. වග්ගන්තං වා වග්ගෙ

**24.** බාලාවතාරයේ සන්ධි කොටසේ මුලින්ම ඇත්තේ,

1. ස්වර සන්ධිය යි. 2. ව්‍යඤ්ජන සන්ධිය යි.

3. නිග්ගහීත සන්ධිය යි. 4. වෝමිස්සක සන්ධිය යි.

**25.** **බන්ධුස්සෙව** යන සන්ධි පදයේ නිවැරදි විසන්ධි වන්නේ,

1. බන්ධුස්ස + එව 2. බන්ධුස් + ඉව

3. බන්ධුස්ස + ඉව 4. බන්ධුස් + සෙව

**26.** පාලි භාෂාවේ ආඛ්‍යාත විභක්ති ගණන වන්නේ,

1. 8 කි. 2. 7 කි. 3. 9 කි. 4. 6 කි.

**27.** උපසර්ග සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය,

1. උපසර්ග නාම හෝ ආඛ්‍යාත පදයකට මුලින් යෙදේ.

2. සංඛ්‍යා ශබ්දවලට උපසර්ග යෙදිය හැකිය.

3. උපසර්ගවල ලිංග භජනයක් පවතී.

4. බාලාවතාරයට අනුව උපසර්ග ගණන 25කි.

**28.** සංඛ්‍යා නාමයක් ඇතුළත් නොවන වර්ණය වන්නේ,

1. සත්ත, අට්ඨ 2. නව, දස 3. පඤ්ච, ඡ 4. අඤ්ඤ, ඉතර

**29.** පාලි භාෂාවේ සම්ප්‍රදානාර්ථය යෙදෙන්නේ,

1. දුතියා විභක්තියෙනි. 2. පඤ්චමී විභක්තියෙනි.

3. කරණ විභක්තියෙනි. 4. චතුත්ථී විභක්තියෙනි.

**30.** පඤ්ච ශබ්දය සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1. එය ඒක වචනයේ පමණක් වරනැගේ.
2. එය බහු වචනයේ පමණක් වරනැගේ.
3. එය ලිංගත්‍රයේ ම යෙදේ.
4. පඤ්ච යනු සංඛ්‍යා ශබ්දයකි.

**31.** ඉච්ඡිත, අනිච්ඡිත, ඉච්ඡිතානිච්ඡිත කම්ම, අකථිත කම්ම යෙදෙන්නේ,

1. පඨමා විභක්තියේ දී ය.
2. දුතියා විභක්තියේ දී ය.
3. තතියා විභක්තියේ දී ය.
4. චතුත්ථී විභක්තියේ දී ය.

**32.** ධාතු ගණ අතර අ, ණා යන විකරණ ප්‍රත්‍යය යෙදෙන්නේ පිළිවෙළින්,

1. භුවාදි ගණය, ස්වාදි ගණය සඳහා ය.
2. කියාදි ගණය, රුධාදි ගණය සඳහා ය.
3. චුරාදි ගණය, දිවාදි ගණය සඳහා ය.
4. භුවාදි ගණය, තනාදි ගණය සඳහා ය.

**33. සන්ධාරෙතුං** යන්නෙහි අර්ථය වන්නේ,

1. ගෙන යන්නට
2. උසුලන්නට
3. වැළපෙන්නට
4. දැකගන්නට යන්න යි.

**34. මාතුච්ඡාපුත්තො** යනු,

1. මවගේ පුත්‍රයා යන්න යි.
2. සුළුමවගේ පුත්‍රයා යන්න යි.
3. මිත්තණියගේ පුත්‍රයා යන්න යි.
4. පියාගේ පුත්‍රයා යන්න යි.

**35.** '**සංඝෙ** ගොතමී දෙහි' අංකිත පදයේ විභක්ති ප්‍රයෝගය වන්නේ,

1. සම්ප්‍රදානාර්ථයේ සත්තමී
2. භාවාර්ථයේ සත්තමී
3. ක්‍රියාප්‍රවර්ගාර්ථයේ තතියා
4. හෙත්වාර්ථයේ පඤ්චමී

**36. තඤ්ඤෙව** යන සන්ධියේ රීතිය දැක්වෙන සූත්‍රය වන්නේ,

1. මදාසරෙ
2. එහෙඤ්ඤං
3. සයෙච
4. වග්ගන්තං වා වග්ගෙ

**37.** කැමතිතාක් යන අදහස දෙන පාලි පදය වන්නේ,

1. යථාභිරන්තං
2. විප්පසන්නානි
3. අනුපලිත්තො
4. උද්දිසෙය්‍ය

**38.** කාලාර්ථය හැඟවෙන නිපාත පදයක් නොමැති අංකය වන්නේ,

1. සුවෙ, පාතො
2. නිච්චං, සතතං
3. භූතපුබ්බං, අභිණ්හං
4. හෙට්ඨා, සමන්තා

**39.** උපසර්ගයක් රහිත වරණය වන්නේ,

1. ඔනද්ධා
2. අක්කමති
3. නික්ඛමති
4. නිසීදති

**40. ආදාය** යනු,

1. තුමන්ත ක්‍රියාවකි.
2. පූර්ව ක්‍රියාවකි.
3. ප්‍රයෝජ්‍ය ක්‍රියාවකි.
4. මිශ්‍ර ක්‍රියාවකි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

## පාලි භාෂාව 2

## ආදර්ශ ප්‍රශ්න පත්‍ර - 01

කාලය පැය තුනයි.

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.

**1 කොටසටත් 11 කොටසින් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**

### 1 කොටස

**1. (අ)** පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

තෙන ඛො පන සමයෙන රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරෙ සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සප්පිස්ස වා තෙලස්ස වා යාවදත්ථං පාතුං දියාති, නො නීහරිතුං. අථ ඛො තස්ස පරිබ්‍රාජකස්ස එතදහොසිඃ "රඤ්ඤො ඛො පන පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරෙ සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සප්පිස්ස වා තෙලස්ස වා යාවදත්ථං පාතුං දියාති, නො නීහරිතුං. යන්නූනා'හං රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරං ගන්ත්වා තෙලස්ස යාවදත්ථං පිවිත්වා ඝරං ආගන්ත්වා උග්ගිරිත්වාන දදෙය්‍යං; යං ඉමිස්සා විජාතාය භවිස්සතී'ති. අථ ඛො සො පරිබ්බාජකො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරං ගන්ත්වා තෙලස්ස යාවදත්ථං පිවිත්වා ඝරං ආගන්ත්වා නෙව සක්කොති උද්ධං කාතුං, න පන අධො. සො දුක්ඛාහි තිබ්බාහි ඛරාහි කටුකාහි වෙදනාහි ඵුට්ඨො ආවට්ටති, පරිවට්ටති.

**(ආ)** පහත සඳහන් පද්‍ය සිංහලට නගන්න.

බුද්ධො තස්ස ච සද්ධම්මො අනූනො යාව තිට්ඨති,
නිබ්බාතුං තාව කාලො මෙ මා මං සොචථ පුත්තිකා.

කොණ්ඩඤ්ඤානන්දනන්නාදී තිට්ඨන්ති රාහුලො ජිනො,
සුඛිතො සහිතො සංඝො හතදප්පා ච තිත්ථියා.

ඔක්කාකවංසස්ස යසො උස්සිතො මාරමද්දනො,
නනු සම්පති කාලො මෙ නිබ්බනත්ථාය පුත්තිකා. (ලකුණු 6+6 = 12 යි)

**2. (අ)** පාලියට නගන්න.

i. මහරජතුමා භික්ෂූන් වහන්සේලාට විහාරයක් පූජා කළේය.
ii. වනිතාවෝ නදියට ගොස් ස්නානය කොට මල් නෙළාගෙන ආපසු පැමිණෙති.
iii. නිදි වරන්නාට රාත්‍රිය දිග ය. (ලකුණු 2x3 = 6යි)

**(ආ)** ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.

භූතපුබ්බං භික්ඛවෙ, ඉමිස්සායෙව සාවත්ථියා වෙදෙහිකා නාම ගහපතානී අහොසි. වෙදෙහිකාය භික්ඛවෙ ගහපතානියා එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතොඃ සොරතා වෙදෙහිකා ගහපතානි, නිවාතා වෙදෙහිකා ගහපතානි, උපසන්තා වෙදෙහිකා ගහපතානීති. වෙදෙහිකාය ඛො පන භික්ඛවෙ පහපතානියා කාළී නාම දාසී අහොසි, දක්ඛා අනලසා සුසංවිහිතකම්මන්තා. අථ ඛො භික්ඛවෙ කාළියා දාසියා එතදහොසිඃ මය්හං ඛො අය්‍යාය එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතොඃ සොරතා වෙදෙහිකාය ගහපතානී, නිවාතා වෙදෙහිකා ගහපතානී, උපසන්තා වෙදෙහිකා ගහපතානීති. කින්නු ඛො මෙ අය්‍යා සන්තංයෙව නු ඛො අජ්ඣත්තං කොපං න පාතුකරොති? උදාහු අසන්තං? උදාහු මය්හමෙවෙතෙ කම්මන්තා සුසංවිහිතා, යෙන මෙ අය්‍යා වීමංසෙය්‍යන්ති. අථ ඛො භික්ඛවෙ කාළී දාසී දිවා උට්ඨාසි. අථ

බො භික්ඛවෙ වෙදෙහිකා ගහපතානී කාළිං දාසිං එතදවොච. හෙ ජෙ කාළීති. කිං අයෙයාති? කිං ජෙ දිවා උට්ඨාසීති? න බො අයෙය කිඤ්චීති.' නො වත රෙ කිඤ්චි පාපී දාසී දිවා උට්ඨාසී'ති කුපිතා අනත්තමනා භාකුටිං අකාසි.

i. වේදේහිකාව වාසය කළේ කොහිද?
ii. වේදේහිකාවගේ ස්වභාවය කෙබඳු ද?
iii. වේදේහිකාවගේ ගති ලක්ෂණ පිරික්සීම සඳහා කාළි දාසිය කුමක් කළා ද?
iv. මෙහි ඇති යහපත් අයෙකු සතු විය යුතු ගති ලක්ෂණ මොනවාද? (ලකුණු 1+1+1+3 = 6යි)

## 11 කොටස

**3. (අ)** ඝෝෂාක්ෂර කියවෙන බාලාවතාර සූත්‍රය ලියන්න.

**(ආ)** වර්ගාක්ෂර පිළිබඳ කියවෙන බාලාවතාර සූත්‍ර පාඨය ලියා දක්වන්න.

**(ඉ)** පහත සඳහන් පද විසන්ධි කර සන්ධි වර්ගය ලියන්න.

i. බන්ධුස්සෙව ii. පරොසහස්සං iii. අත්ථදත්ථං iv. උග්ඝොසො v. බුද්ධොපි vi. ලොකස්සාති

(ලකුණු 2+4+6= 12යි)

**4. (අ) ඔකාසෙ සත්තමී** යන සූත්‍රයේ අර්ථ ලියා නිදසුනක් සපයන්න.

**(ආ)** ධාතු ගණ අට නම් කරන්න.

**(ඉ)** පහත දැක්වෙන ක්‍රියා පදයන්හි ආඛ්‍යාත විභක්තිය නම් කරන්න.

i. ගච්ඡෙය්‍ය ii. වදාහි iii. පපච iv. බාදිස්සාම v. අදදි vi. උදෙති

(ලකුණු 2+4+6= 12යි)

**5. (අ)** පහත දැක්වෙන වචන පාලියෙන් ලියන්න.

i. සවස ii. මනාකොට

**(ආ)** පහත දැක්වෙන වාක්‍යවල ඇති පූර්ව ක්‍රියා පද සොයා ඒවායින් වෙනත් වාක්‍ය 04ක් ගොඩනගන්න.

i. මාතා ඛීරං දත්වා පුත්තං ලාලෙති.

ii. රාජා අමච්චෙහි සද්ධිං නගරං ගන්ත්වා පුන පාසාදං ගච්ඡති.

iii. භික්ඛු පිණ්ඩාය චරිත්වා විහාරං පවිසති.

iv. දාරිකා පුප්ඵානි ඔචිනිත්වා බුද්ධං පූජෙති.

**(ඉ)** පහත සඳහන් මාතෘකාවකට අනුව වාක්‍ය හයක් ලියන්න.

i. මම පරිවෙණං ii. වසන්තකාලං iii. සිද්ධත්ථ කුමාරො

(ලකුණු 2+4+6= 12යි)

**6. (අ)** භුවාදි සහ රුධාදි ධාතු ගණ හඳුන්වන බාලාවතාර සූත්‍ර 02 ලියන්න.

**(ආ)** කුමාර හා ලතා ශබ්දවල තතියා හා පඤ්චමී විභක්ති රූප ලියා දක්වන්න.

**(ඉ)** උපසර්ග පද 12ක් ලියන්න.

(ලකුණු 2+4+6= 12යි)

**7. (අ)** ප්‍රධාන හෙළටුවා ග්‍රන්ථ අතරින් 02ක් ලියන්න.

**(ආ)** අභිධර්ම පිටකයේ 'ප්‍රකරණ' 07 ලියන්න.

**(ඉ)** නන්ද සූත්‍රයේ සාරාංශය ලියා දක්වන්න.

(ලකුණු 2+4+6= 12යි)

**8. (අ)** අපදාන පාලිය බුද්දක නිකායට අයත් කී වැනි ග්‍රන්ථය ද?

**(ආ)** අපදාන පාලියේ ප්‍රධාන කොටස් 04 සහ ථෙරී අපදානයේ වර්ග 04 ලියා දක්වන්න.

**(ඉ)** ප්‍රජාපති ගෝතමී තෙරණියගේ ශාසනික ජීවිතය පිළිබඳ කෙටි ඇගයීමක් කරන්න.

(ලකුණු 2+4+6= 12යි)

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

## පාලි භාෂාව 1

## ආදර්ශ ප්‍රශ්න පත්‍ර 02

කාලය පැයයි.

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 1 බැගින් 40කි.
- අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) යොදන්න.

**1.** මොග්ගල්ලාන ව්‍යාකරණ සම්ප්‍රදාය අනුව පාලි අක්ෂර මාලාව ගණනින්,

1. 41කි. 2. 42කි. 3. 43කි. 4. 44කි.

**2.** පාලි අක්ෂර මාලාවේ අසවර්ණ අක්ෂර දෙක වන්නේ,

1. අ, ආ 2. ඉ, ඊ 3. උ, ඌ 4. එ, ඔ

**3.** අඝෝෂාක්ෂරයක් ඇතුළත්ව නොමැති වරණය වන්නේ,

1. ක, ඛ 2. ච, ඡ 3. ට, ඨ 4. බ, භ

**4.** '**ළන්තාඤ්ඤෙ ඝොසා**' යන බාලාවතාර පාඨයෙන් හඳුන්වන්නේ,

1. ස්වර පිළිබඳව ය. 2. ඝෝෂාක්ෂර පිළිබඳව ය.
3. වර්ගාන්තාක්ෂර පිළිබඳව ය. 4. අඝෝෂාක්ෂර පිළිබඳව ය.

**5.** අක්ෂර උත්පත්ති ස්ථානයක් නොවන්නේ,

1. කණ්ඨජ 2. ඔට්ඨජ 3. ජිව්හජ 4. තාලුජ

**6.** අක්ෂර උත්පත්ති ස්ථාන අනුව 'මුද්ධජ' අක්ෂර ඇතුළත් වරණය වන්නේ,

1. ත ථ ද ධ න ල ස 2. අ ආ ක ඛ ග ඝ ජ ඞ හ
3. ට ඨ ඩ ඪ ණ ර ළ 4. උ ඌ ප ඵ බ භ ම

**7.** **ඌෂ්මාක්ෂරයක්** රහිත වචනයක් ඇති වරණය වන්නේ

1. සංකථා, අංකුස, සංකප්ප 2. සංකර, අසංකත, අසාර
3. හදයගත, හත්ථසාර, හත්පීකුච්ඡි 4. හදයස්සිත, ලංඝති, හසිතුප්පාද

**8.** අක්ෂර වින්‍යාසය සාවද්‍ය ලෙසින් ඇති වර්ණය වන්නේ,

1. භගවා, බුද්ධො 2. අනන, සම්බතං 3. උච්චාරණ, අට්ඨාරස 4. සෙට්ඨී, සාරථී

**9.** පාලි භාෂාවේ **ස්‍යාදන්ත** පද යනුවෙන් හඳුන්වන්නේ,

1. උපසර්ග පද ය. 2. නාම පද ය. 3. ක්‍රියා පද ය. 4. නිපාත පද ය.

**10.** පාලියේ ඇති 'නාම විභක්ති ප්‍රත්‍යය' ගණනින්,

1. 14 කි. 2. 12 කි. 3. 16 කි. 4. 18 කි.

**11.** ස්වාමි අර්ථය ප්‍රකාශ කෙරෙන නාම විභක්තිය වන්නේ,

1. තතියා විභක්තිය යි. 2. චතුත්ථී විභක්තිය යි.

3. පඤ්චමී විභක්තිය යි. 4. ඡට්ඨී විභක්තිය යි.

**12.** සර්ව නාම සම්බන්ධයෙන් ඇති සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1. සර්ව නාම පොදුවේ යෙදිය හැකිය.

2. සර්ව නාම ලිංගත්‍රයෙහිම වරනැගිය හැකිය.

3. සර්ව නාමයන්හි ඒක වචන බහුවචන භේදයක් නැත.

4. සර්ව නාම පද විශේෂණ පද ලෙස භාවිත කළ හැකිය.

**13. 11, 19, 21, 29** යන සංඛ්‍යා සඳහා යොදන පාලි වචන නිවැරදිව දැක්වෙන වරණය වන්නේ,

1. ඒකාදස, එකූනතිංසති, එකූනවීසති, එකවීසති

2. එකවීසති, ඒකාදස, එකූනතිංසති, එකූනවීසති

3. එකවීසති, එකූනතිංසති, එකූනවීසති, ඒකාදස

4. එකාදස, එකූනවීසති, එකවීසති, එකූනතිංසති

**14.** පාලි භාෂාවේ **කාරක** ගණනින්,

1. 5 කි. 2. 6 කි. 3. 7 කි. 4. 8 කි.

**15.** අනුක්ත කර්තෘ පදය තබනුයේ,

1. දුතියා විභක්තියෙනි. 2. තතියා විභක්තියෙනි.

3. චතුත්ථී විභක්තියෙනි 4. පඤ්චමී විභක්තියෙනි.

**16.** අකර්මක ධාතු පමණක් අඩංගු වර්ණය වන්නේ,

1. හස, ජර, රුජ, කන්ද

2. ලිඛ, පූජ, ඡින්ද, ඛාද

3. ගමු, භූ, තන, චුර

4. ගහ, කර, සු, දිව්

**17.** අතීත කාලය හඟවන ආඛ්‍යාත විභක්ති පමණක් ඇතුළත් වර්ණය වන්නේ,

1. පඤ්චමී, සත්තමී, අජ්ජතනී, පරොක්ඛා ය.

2. භවිස්සන්ති, කාලාතිපත්ති, හීයත්තනී, වත්තමාන ය.

3. අජ්ජතනී, කාලාතිපත්ති, හීයත්තනී, පරොක්ඛා ය.

4. භවිස්සන්ති, වත්තමාන, සත්තමී, පඤ්චමී ය.

**18.** '**ආ ඌ ඒ ත්ථ අ ම්හ ත්ථ රෙ ත්ථො ව්හො ඉ ම්හෙ**' යන ප්‍රත්‍ය මාලාව අයත් ආඛ්‍යාත විභක්තිය වන්නේ,

1. පඤ්චමී 2. පරොක්ඛා 3. අජ්ජතනී 4. හීයත්තනී

**19.** තුමන්ත ක්‍රියා යනුවෙන් හඳුන්වන්නේ,

1. මිශ්‍ර ක්‍රියා ය. 2. පූර්ව ක්‍රියා ය. 3. අපර ක්‍රියා ය. 4. ප්‍රයෝජ්‍ය ක්‍රියා ය.

**20.** පූර්ව ක්‍රියා පමණක් ඇතුළත් වර්ණය වන්නේ,

1. ආදාය, ගන්ත්වා, වන්දිතුං, රක්ඛිත්වා 2. ආගම්ම, උට්ඨාය, නිසීදිත්වා, වදමානො

3. නික්ඛම්ම, අභිභූය, උට්ඨාය, බාධිත්වා 4. ආහරිත්වා, කසිත්වා, කිණිතුං, පචමානො

**21.** අටුවාචාර්ය බුද්ධඝෝෂ හිමියන්ගේ තොරතුරු ඇතුළත් ග්‍රන්ථ දෙකක් වන්නේ,

1. දීපවංසය, සහස්සවත්ථුව 2. මහාවංසය, බුද්ධඝොසුප්පත්ති

3. සමන්තකූටවණ්ණනා, දාඨාවංසය 4. ථූපවංසය, පරිවාර පාලි

**22.** බුද්ධඝෝෂ හිමියන් එම නාමයෙන් ප්‍රසිද්ධ වූයේ,

1. බුද්ධ මන්ත්‍ර කියූ නිසා ය. 2. බුදුරදුන්ගේ හඬට සමාන හඬක් ඇති නිසා ය.

3. අටුවා කෘති රචනා කළ නිසා ය. 4. දඹදිව උපන් නිසා ය.

**23.** සිව් නිකායාගත අට්ඨකථා ග්‍රන්ථ පිළිවෙළින් ඇතුළත් වරණය වන්නේ,

1. සුමංගලවිලාසිනී, පපඤ්චසූදනී, සාරත්ථප්පකාසිනී, මනොරථපූරණී

2. පපඤ්චසූදනී, සාරත්ථප්පකාසිනී, මනොරථපූරණී, සුමංගලවිලාසිනී

3. සුමංගලවිලාසිනී, සාරත්ථප්පකාසිනී, මනොරථපූරණී, පපඤ්චසූදනී

4. සුමංගලවිලාසිනී, පපඤ්චසූදනී, මනොරථපූරණී, සාරත්ථප්පකාසිනී

**24.** විනය අට්ඨකථාව වන්නේ,

1. පරමත්ථජොතිකා 2. සම්මොහවිනොදනී

3. සමන්තපාසාදිකා 4. අත්ථසාලිනී

**25.** අටුවාචාරීන් වහන්සේලා නිවැරදිව දැක්වෙන වරණය වන්නේ,

1. බුද්ධඝෝෂ හිමි, උපසේන හිමි, බුද්ධදත්ත හිමි, ධම්මපාල හිමි
2. අනුරුද්ධ හිමි, බුද්ධඝෝෂ හිමි, ආනන්ද හිමි, ජෝතිපාල හිමි
3. බුද්ධදත්ත හිමි, බුද්ධඝෝෂ හිමි, කාලසුමන හිමි, රේවත හිමි
4. ධම්මකිත්ති හිමි, මහානාම හිමි, බුද්ධප්පිය හිමි, සුමනසිද්ධි හිමි

**26.** සීහළට්ඨකථාවක් ඇතුළත් නොවන වරණය වන්නේ,

1. මහාට්ඨකථා 2. මහාපච්චරියට්ඨකථා 3. කුරුන්දට්ඨකථා 4. ජාතකට්ඨකථා

**27.** සීහළට්ඨකථා අතර පැවතිණැයි සැලකෙන මහාට්ඨකථාව සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1. එය මුළු ත්‍රිපිටකයටම පොදුවේ කළ අටුවාවයි.
2. මහාට්ඨකථාව හෙළ බසින් රචනා වී තිබේ.
3. මහාට්ඨකථාව තිබී ඇත්තේ මහාවිහාරය සන්තකයේ ය.
4. මහාට්ඨකථාව විනය පිටකයට හෙළ බසින් කළ අටුවාව යි.

**28.** බුද්ධඝෝෂ හිමියන්ගේ ගුරුවරයා වූයේ,

1. රේවත හිමියන් ය. 2. ධර්මකීර්ති හිමියන් ය.

3. මහානාම හිමියන් ය. 4. ධම්මපාල හිමියන් ය.

**29.** දීඝනිකාය සඳහා අටුවා කෘතියක් ලියන ලෙස ආරාධනා කර ඇත්තේ,

1. ධම්මපාල හිමි ය. 2. දාඨානාග හිමි ය.
3. බුද්ධදත්ත හිමි ය. 4. රේවත හිමි ය.

**30.** දිඹුලාගල කාශ්‍යප හිමියන් විසින් රචිත කෘතියක් නොවන්නේ,

1. බාලාවබෝධන 2. අනාගතවංස
3. අභිධම්මත්ථපුරාණටීකාව 4. දාඨාවංසය යි.

**31.** පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් විසින් රචනා කළ කෘතියක් නොවන්නේ,

1. පාලිභාසප්පවෙසිනි 2. අභිධානප්පදීපිකා
3. බුද්ධගුණදීපනිය 4. සිරිමාවාදය යි.

**32.** පොල්වත්තේ බුද්ධදත්ත හිමියන්ට බුරුම දේශයෙන් ලැබුණු ගෞරව සම්මානය වන්නේ,

1. අග්ගමහාපණ්ඩිත උපාධිය යි. 2. සංඝරාජ තනතුර යි.
3. සංඝනායක තනතුර යි. 4. ත්‍රිපිටක විශාරද තනතුර යි.

**33.** රීස් ඩේවිඩ්ස් මැතිතුමා උපත ලැබූයේ,

1. ඉන්දියාවේ ගුජරාට් ප්‍රාන්තයේ ය.
2. එංගලන්තයේ කොල්චෙස්ටර්හි ය.
3. ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නගරයේ ය.
4. ඇමෙරිකාවේ නිව්යෝර්ක්හි ය.

**34.** අභිධර්ම පිටකයට අයත් ග්‍රන්ථයක් නොවන්නේ,

1. ධම්මසංගණී ප්‍රකරණය 2. ධාතුකථා ප්‍රකරණය
3. ඛුද්දක පාඨ ප්‍රකරණය 4. පට්ඨාන ප්‍රකරණය යි.

**35. උදාන පාළි** සඳහා අට්ඨකථාවක් රචනා කළේ,

1. ධම්මපාල තෙරුන් ය. 2. මහානාම තෙරුන් ය.
3. බුද්ධදත්ත තෙරුන් ය. 4. බුද්ධඝෝෂ තෙරුන් ය.

**36. උදාන පාළිය** වර්ග කිහිපයකින් යුක්තය. එම වර්ග යටතට ගත නොහැකි වර්ග ඇතුළත් වරණය වන්නේ,

1. බෝධිවග්ග, මුචලින්ද වග්ග 2. නාගවග්ග, මහාවග්ග
3. නන්දවග්ග, මේඝියවග්ග 4. චූලවග්ග, පාටලීගාමියවග්ග

**37. 'ආයන්තිං නාභිනන්දන්ති'** යන ගාථාව ඇතුළත් උදාන සූත්‍රය වන්නේ,

1. සංගාමජී සූත්‍රය යි. 2. ගබ්භිනී සූත්‍රය යි. 3. නන්ද සූත්‍රය යි. 4. උදපාන සූත්‍රය යි.

**38.** අපදාන පාළි සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1. අපදාන පාළි නවාංගසත්ථුසාසනයේ දී ගාථා කොටසට ඇතුළත් කර ඇත.
2. අපදාන පාළියේ ප්‍රධාන කොටස් 04 කි.
3. අපදාන පාලියේ වර්ග 65කි, අපදාන 592කි.
4. අපදාන යනු ඛුද්දක නිකායේ සිව්වන ග්‍රන්ථය යි.

**39.** ථෙරි අපදානයෙහි වර්ග ................ කින් සමන්විත ය.

1. 03 2. 04 3. 05 4. 06

**40.** ඒකපෝසථික වර්ගයට අයත් නොවන ථෙරි අපදානයක් වන්නේ,

1. ඛේමා අපදානය 2. උප්පලවණ්ණා අපදානය

3. පටාචාරා අපදානය 4. ධම්මදින්නා අපදානය

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

## පාලි භාෂාව 2

## ආදර්ශ ප්‍රශ්න පත්‍ර - 02

කාලය පැය තුනයි.

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.**

**1 කොටසටත් 11 කොටසින් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**

## 1 කොටස

**1. (අ)** පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා සංගාමජි සාවත්ථියං අනුප්පත්තො හොති භගවන්තං දස්සනාය. අස්සොසි ඛො ආයස්මතො සංගාමජිස්ස පුරාණදුතියිකා 'අයෙයා කිර සංගාමජි සාවත්ථියං අනුප්පත්තො'ති. සා දාරකං ආදාය ජෙතවනං අගමාසි. තෙන ඛො පන සමයෙන ආයස්මා අංගාමජි අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසින්නො හොති. අථ ඛො ආයස්මතො සංගාමජිස්ස පුරාණදුතියිකා යෙනායස්මා සංගාමජි තෙනුපසංකමි. උපසංකමිත්වා ආයස්මන්තං සංගාමජිං එතදවොචඃ 'ඛුද්දපුත්තා'ම්හි සමණඃ පොස ම'න්ති. එවං වුත්තෙ ආයස්මා සංගාමජි තුණ්හී අහොසි. දුතියම්පි ඛො ආයස්මතො සංගාමජිස්ස පුරාණදුතියිකා ආයස්මන්තං සංගාමජිං එතදවොචඃ 'ඛුද්දපුත්තා'ම්හි සමණ පොස ම'න්ති. දුතියම්පි ඛො ආයස්මා සංගාමජි තුණ්හී අහොසි.

**(ආ)** පහත සඳහන් පද්‍ය සිංහලට නගන්න.

පරිඤ්ඤාතං මයා දුක්ඛං දුක්ඛහෙතු විවජ්ජිතො,
නිරොධො මෙ සච්ඡිකතො මග්ගො චාපි සුභාවිතො.

පරිචිණ්ණො මයා සත්ථා කතං බුද්ධස්ස සාසනං,
ඔහිතො ගරුකො භාරො භවනෙත්ති සමූහතා.

යස්සත්ථාය පබ්බජිතා අගාරස්මානගාරියං,
සො මෙ අත්ථො අනුප්පත්තො සබ්බසඤ්ඤොජනක්ඛයො. (ලකුණු 6+6 = 12 යි)

**2. (අ)** පාලියට නගන්න.

i. වඳුරා ලොකු බල්ලෙකු දැක ගසෙන් බිමට වැටුණේ ය.
ii. සුමේධ තවුසා අහසින් ගොස් දීපංකර බුදුරදුන්ට වැන්දේ ය.
iii. තෙරුන් වහන්සේ ධර්මය අසමින් ගසමුල සිටියි. (ලකුණු 2x3 = 6යි)

**(ආ)** ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.

භූතපුබ්බං භික්ඛවෙ සක්කො දෙවානමින්දො මාතලිං සංගාහකං ආමන්තෙසි. යොජෙහි සම්ම, මාතලී, සහස්සයුත්තං ආජඤ්ඤරථං. උය්‍යානභූමිං ගච්ඡාම සුභූමිං දස්සනායාති. එවං භද්දන්තවාති ඛො භික්ඛවෙ මාතලී සංගාහකො සක්කස්ස දෙවානමින්දස්ස පටිසුත්වා සහස්සයුත්තං ආජඤ්ඤරථං යොජෙත්වා සක්කස්ස දෙවානමින්දස්ස පටිවෙදෙසි. යුත්තො ඛො තෙ, මාරිස, සහස්සයුත්තො ආජඤ්ඤරථො යස්සදානි කාලං මඤ්ඤසීති. අථ ඛො භික්ඛවෙ සක්කො දෙවානමින්දො වෙජයන්තපාසාදා ඔරොහන්තො පඤ්ජලිකො පුථුද්දිසා නමස්සති. අථ ඛො භික්ඛවෙ මාතලි සංගාහකො සක්කං දෙවානමින්දං ගාථාය අජ්ඣභාසි.



රාජකීය පණ්ඩිත පදියතලාවේ ඥානවිමල හිමි

තං නමස්සන්ති තෙවිජ්ජා - සබ්බෙ භුම්මා ච ඛත්තියා
චත්තාරො ච මහාරාජා - තිදසා ච යසස්සිනො
අථ කො නාම සො යක්ඛො - යං ත්වං සක්ක නමස්සසීති.

i. ශක්‍රයා මාතලීට ආමන්ත්‍රණය කොට කුමක් කීවේ ද?
ii. වෛජයන්ත ප්‍රාසාදයෙන් බසිමින් ශක්‍රයා කුමක් කළේ ද?
iii. ශක්‍රයාගේ වන්දනය දුටු මාතලී කුමක් ඇසී ද?
iv. යොජෙත්වා, ඔරොහන්තො, ආජඤ්ඤරථං යන පදවලට සිංහල අර්ථ දෙන්න.

(ලකුණු 1+1+1+3 = 6යි)

## 11 කොටස

**3. (අ)** 'හ්‍රස්ව අක්ෂර තුනකි' මෙය කියවෙන බාලාවතාර සූත්‍රය ලියන්න.

**(ආ)** සන්ධි හඳුන්වන බාලාවතාර සූත්‍ර පාඨය ලියා දක්වන්න.

**(ඉ)** පහත සඳහන් පද විසන්ධි කර සන්ධි වර්ගය ලියන්න.

i. කිංසූධ ii. ගංගොදය iii. යථරිව iv. ඡළභිඤ්ඤා v. සභික්ඛු vi. ඔනද්ධා

(ලකුණු 2+4+6= 12යි)

**4. (අ) සාමිස්මිං ඡට්ඨී** යන සූත්‍රයේ අර්ථ ලියා නිදසුනක් සපයන්න.

**(ආ)** වත්තමාන ආඛ්‍යාතය හඳුන්වන බාලාවතාර පාඨය හා එහි ප්‍රත්‍යය මාලාව ලියා දක්වන්න.

**(ඉ)** පහත දැක්වෙන ක්‍රියා පදයන්හි ආඛ්‍යාත විභක්තිය නම් කරන්න.

i. ඛාදසි ii. රක්ඛෙය්‍ය iii. අපචො iv. ඛභවිත්ථ v. අපවිස්සා vi. වන්දතු

(ලකුණු 2+4+6= 12යි)

**5. (අ)** පහත දැක්වෙන වචන පාලියෙන් ලියන්න.

i. නිතර ii. සෙමින්

**(ආ)** පහත දැක්වෙන වාක්‍ය යුගල **තුමන්ත ක්‍රියා** යොදමින් සම්බන්ධ කර තනි වාක්‍ය සේ නැවත ලියන්න.

i. පිතා නගරං ගච්ඡති. සො භණ්ඩානි කිණාති.

ii. භික්ඛු පඤ්ඤරසියං උපොසථාගාරං ගච්ඡති. සො තත්ථ විනයං වාචෙති.

iii. කම්මකාරො කොලම්බනගරං ගච්ඡති. සො කම්මකාරදිවසං සමනුස්සරති.

iv. දාරිකා පුප්ඵානි ඔචිනාති. සා විහාරං ගච්ඡති.

**(ඉ)** පහත සඳහන් මාතෘකාවකට අනුව වාක්‍ය හයක් ලියන්න.

i. මම මාතා ii. මම පබ්බජිත දිනං iii. වෙසාඛ මාසො

(ලකුණු 2+4+6= 12යි)

**6. (අ)** සබ්බධාතුක ආඛ්‍යාත විභක්ති සහ අසබ්බධාතුක ආඛ්‍යාත විභක්ති පිළිවෙළින් නම් කරන්න.

**(ආ) පුප්ඵ** හා **ධෙනු** ශබ්දවල **දුතියා හා ඡට්ඨී විභක්ති** ඒකවචන බහුවචන රූප ලියා දක්වන්න.

**(ඉ)** ප්‍රශ්නවාචී නිපාත පද 10ක් ලියා දක්වන්න.

(ලකුණු 2+4+6= 12යි)

**7. (අ)** අටුවා කෘති රචනා කළ තෙරුන් වහන්සේලා සිව් දෙනෙකු නම් කරන්න.

**(ආ)** අටුවා කෘති 04ක් ලියා ඊට පාදක කරගත් මුල් කෘති ද නම් කරන්න.

**(ඉ)** ගබ්භිනී සූත්‍රය කෙටියෙන් ලියා දක්වන්න.

(ලකුණු 2+4+6= 12යි)

**8. (අ)** ඛුද්දක නිකාය සම්බන්ධයෙන් වැදගත් කරුණු 02ක් දක්වන්න.

**(ආ)** ඛුද්දක නිකායේ කෘති 15න් 08ක් ලියා දක්වන්න.

**(ඉ)** අටුවාචාරී බුද්ධඝෝෂ හිමියන් පාලි සාහිත්‍යයට කළ සේවය කෙටියෙන් දක්වන්න.

(ලකුණු 2+4+6= 12යි)

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

### පාලි භාෂාව 1
### ආදර්ශ ප්‍රශ්න පත්‍ර 03

කාලය පැයයි.

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.**

- ❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 1 බැගින් 40කි.**
- ❖ **අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.**
- ❖ **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) යොදන්න.**

**1.** කච්චායන ව්‍යාකරණ සම්ප්‍රදායෙහි නැති මොග්ගල්ලායන ව්‍යාකරණ සම්ප්‍රදායේ යෙදෙන අක්ෂර දෙක වන්නේ,

1. ආ, ඒ  2. ශ, ෂ  3. ඒ, ඕ  4. ඓ, ඖ

**2.** කච්චායන ව්‍යාකරණ සම්ප්‍රදායට අනුව එ,ඔ ස්වර දෙක හ්‍රස්ව ලෙස උච්චාරණය වන්නේ,

1. ව්‍යඤ්ජන අකුරක් සමග සංයෝග වූ විට ය.
2. වචනයක අක්ෂර දෙකක් හෝ ඊට වැඩියෙන් යෙදී ඇති විට ය.
3. සංයෝග අක්ෂරයක් හෙවත් බැඳි අකුරකට මුලින් යෙදුණු විට ය.
4. සංයෝග අක්ෂරයක් හෙවත් බැඳි අකුරකට පසුව යෙදුණු විට ය.

**3.** ස්වර අක්ෂර සම්බන්ධයෙන් ඇති සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1. ස්වර යනු තනිව ශබ්ද කළ හැකි අක්ෂර යි.
2. ව්‍යඤ්ජනයක් උසුරුවීමට ආධාර වෙයි.
3. තමාම බැබලේ යන අදහස එහි ඇත.
4. ස්වර අක්ෂර අඝෝෂාක්ෂර වේ.

**4.** වර්ගාක්ෂර සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1. වර්ගාක්ෂර 25 කි.
2. වර්ගාක්ෂර සඳහා ස්පර්ශ යන නාමය පර්යාය පදයකි.
3. වර්ගාක්ෂර අතර ඝෝෂාක්ෂර හා අඝෝෂාක්ෂර ඇත.
4. වර්ගයකට අක්ෂර 06 බැගින් ඇත.

**5.** ඝෝෂාක්ෂර ගණන නිවැරදිව දැක්වෙන වරණය වන්නේ,

1. 23 කි.  2. 21 කි.  3. 20 කි.  4. 11 කි.

**6.** අන්ත්‍යස්ථාක්ෂර පිළිබඳ ඇති සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1. අන්ත්‍යස්ථාක්ෂර ගණනින් 05 කි.
2. අන්ත්‍යස්ථාක්ෂරවල ස්වර ස්වභාවයත් ව්‍යඤ්ජන ස්වභාවයත් ඇත.
3. අන්ත්‍යස්ථාක්ෂර ද්වීයාක්ෂර ලෙසින් ද හඳුන්වයි.
4. වර්ගාක්ෂරවලට පසුව යොදා ඇත.

**7. අන්ත්‍යස්ථාක්ෂරයක් රහිත පදයක්** ඇතුළත් වරණය වන්නේ,

1. යථා, ලංඝති, රස්සා, වස්සං  2. ආයති, රංසි, දරථ, පලක
3. අවකංස, දලති, අකලංක, ආනිසංස  4. නවනීත, දාරක, අස්ලීල, අවනත

**8.** සත්තමී නාම විභක්තිය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය ඇතුළත් වරණය වන්නේ,

1. ස්මං සු ප්‍රත්‍යය මාලාව වේ.
2. ස්මිං සු ඉති සත්තමී යනු බාලාවතාර පාඨයයි.
3. නාම විභක්තිවල අවසාන විභක්තිය යි.
4. ස්වාමි අර්ථය සත්තමියෙන් යෙදී ඇත.

**9.** අක්ෂර වින්‍යාස සාවද්‍ය ලෙස යෙදී ඇති වරණය වන්නේ,

1. භගවා, පරිබ්බාජකො, වෙසාලියං, භන්තෙ
2. පිණ්ඩං, වච්ඡගොත්ත, පීඨං, කූටාගාරසාලා
3. සාමනෙරො, ලෙඛනං, පුත්ථ, විභත්ති
4. රට්ඨපාලො, පදක්ඛිණං, මජ්ඣිම, උල්ලිඛාපෙති

**10.** බාලාවතාර සූත්‍රය සාවද්‍ය ලෙස යෙදී ඇති වරණය වන්නේ,

1. ලිංගත්ථෙ පඨමා  2. සම්පදානෙ දුතියා
3. සාමිස්මිං ඡට්ඨී  4. අභිමුඛීකරණමාලපනං

**11.** දුතියා විභක්තිය සහිත නාමයක් රහිත වරණය වන්නේ,

1. ගාමං, වස්සං, ලෙඛනං, ධනං  2. කන්දුකං, මුඛං, චන්‍දනං, භික්ඛූනං
3. පිණ්ඩං, සුඛං, ඡත්තං, දුක්ඛං  4. ආහාරං, ඵලං, මනං, කිරියං

**12.** සර්වනාම ශබ්දයක් රහිත වරණය වන්නේ,

1. සබ්බ, කතර, කතම, ඉතර
2. අඤ්ඤතම, අඤ්ඤතර, පුබ්බ
3. දක්ඛිණ, උත්තර, එක, ය
4. අමු, තුම්හ, මුසා, කිං

**13.** ඒකවචනයේ පමණක් වරනැගෙන සංඛ්‍යා ශබ්ද පමණක් ඇතුළත් වරණය වන්නේ,

1. ද්වි, ති, චතු, පඤ්ච
2. ඡ, සත්ත, අට්ඨ, නව
3. දස, එකාදස, චුද්දස, පඤ්චදස
4. එකූනවීසති, එකූනසත, කොටි, එකවීසති

**14.** සංඛ්‍යා නාම සම්බන්ධයෙන් නොගැළපෙන වරණය වන්නේ,

1. සොළස - සොරස  2. ඡනවුති - ඡන්නවුති
3. ද්වෙවීසති - බාවීසති  4. සතසහස්සං - දසකොටි

**15.** දුතියා විභක්තිය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1. කර්මය යෙදෙන්නේ දුතියා විභක්තියෙනි.
2. ක්‍රියා විශේෂණය දුතියා විභක්තියෙන් තැබිය හැකිය.
3. අං යො යනු දුතියා විභක්ති ප්‍රත්‍යය යි.
4. කරණාර්ථය තැබෙනුයේ ද දුතියා විභක්තියෙනි.

**16.** කරොති ................. නිප්ඵාදෙතීති .................. හිස්තැන සඳහා අවශ්‍ය පද නිවැරදිව ඇතුළත් වරණය වන්නේ,

1. කිරියං, කාරකං 2. කම්මං, කරණං
3. අපදානං, සම්පදානං 4. කිරියං, කම්මං

**17.** තතියා විභත්තියෙහි ඇති අර්ථ අතරට අයත් නොවන්නේ,

1. අච්චන්ත සංයෝගය 2. හේත්වර්ථය
3. සහාදි යෝගය 4. අංගවිකාර අවයවාර්ථය

**18.** කාරක අන්තර්ගත නොවන විභක්තිය වන්නේ,

1. පඨමා විභක්තිය 2. දුතියා විභක්තිය 3. තතියා විභක්තිය 4. සත්තමී විභක්තිය

**19.** නිර්ධාරණාර්ථය යනු,

1. කාලවාචී අර්ථය ගෙනදෙන විභක්ති ප්‍රයෝගයකි.
2. ගොඩකින් යමක් වෙන්කර දැක්වෙන අර්ථය ගෙනදෙන විභක්ති ප්‍රයෝගයකි.
3. ක්‍රියා විශේෂණ අර්ථය ගෙනදෙන විභක්ති ප්‍රයෝගයකි.
4. සම්ප්‍රදානාර්ථය ගෙනදෙන විභක්ති ප්‍රයෝගයකි.

**20.** භුවාදි, රුධාදි, දිවාදි, ස්වාදි ධාතු ගණ විකරණ ප්‍රත්‍යය දැක්වෙන නිවැරදි පිළිවෙළ සහිත වරණය වන්නේ,

1. අං, ය, ණා, අ 2. ණා, අ, අං, ය
3. අ, අං, ය, ණා 4. අ, අං, ණා, ය

**21.** ආඛ්‍යාත සම්බන්ධයෙන් සාවද්‍ය වරණය වන්නේ,

1. කාලත්‍රයකි 2. පුරුෂත්‍රයකි
3. කාරකත්‍රයකි 4. වචනත්‍රයකි

**22.** අණකිරීම හා ආශිර්වාදය අර්ථය ඇති ආඛ්‍යාත විභක්තිය වන්නේ,

1. සත්තමී විභක්තිය යි. 2. භවිස්සන්ති විභක්තිය යි.
3. අජ්ජතනී විභක්තිය යි. 4. පඤ්චමී විභක්තිය යි.

**23.** ආ, ඌ, ඕ, ත්ථ, අ, ම්හා, ත්ථ, ත්ථුං, සෙ, ව්හං, ඉං යන ආඛ්‍යාත ප්‍රත්‍ය අයත් විභක්තිය වන්නේ,

1. හීයත්තනී විභක්තිය
2. කාලාතිපත්ති විභක්තිය
3. පරොක්ඛා විභක්තිය
4. අජ්ජතනී විභක්තිය

**24.** පූර්ව ක්‍රියා ප්‍රත්‍යය ගණනින්,

1. 2 කි. 2. 5 කි. 3. 3 කි. 4. 5 කි.

**25.** පඤ්චමී විභක්ති අර්ථය ඇතුළත් නිපාත පද අන්තර්ගත වරණය වන්නේ,

1. සමන්තා, පරිතො, එකමන්තං, සම්මුඛා
2. සුවෙ, අභික්ඛණං, භූතපුබ්බං, පාතො
3. රාජතො, පාදතො, සීසතො, චොරතො
4. කාතවෙ, දාතවෙ, සොතවෙ, කාතුං

**26.** '**ඒකාන්තයෙන්**' යන අදහස දෙන නිපාත පමණක් අන්තර්ගත වරණය වන්නේ,

1. හඤ්ද, නූන, හි, හවෙ 2. නූන, වත, එත්තාවතා
3. ඉංඝ, තාවතා, නූන, චෙ 4. වත, පුථු, රිතෙ, හඤ්ද

27. උපසර්ග පදයක් නොමැති වරණය වන්නේ,

1. පරා, සං, අව, පති
2. අති, අපි, අප, උප
3. නි, නී, උ, දු
4. අධි, අභි, අ, වි

28. නිග්ගහීත සන්ධිය සකස් වීම කෙරෙහි බලපාන ප්‍රධාන කරුණ වන්නේ,

1. මුල්පදයේ අග අකුර ස්වරයක් වීම හා පසුපදයේ මුල් අකුර නිග්ගහීතයක් වීම ය.
2. මුල්පදයේ අග අකුර ව්‍යඤ්ජනයක් වී පසුපදයේ මුල් අකුර නිග්ගහීතයක් වීම ය.
3. මුල්පදයේ අග අකුර නිග්ගහීතයක් වී පසුපදයේ මුල් අකුර නිග්ගහීතයක් වීම ය.
4. මුල්පදයේ අග අකුර නිග්ගහීතයක් වී පසු පදයේ මුල් අකුර ව්‍යඤ්ජනයක් වීම ය.

29. ස්වර සන්ධියට අයත් නොවන සන්ධියක් සහිත වරණය වන්නේ,

1. කිංසුධ, නොපෙති, යානීධ, ඉදාහං
2. ඡායාව, යථරිව, ස්වස්ස, අනෙචති
3. වුත්ත්‍යස්ස, ත්‍යජ්ජ, ගංගොදය, බන්‍ධුස්සෙව
4. පගෙව, පත්‍යන්තං, සභික්ඛු, අක්ඛාතං

30. නිග්ගහීත සන්ධියට අයත් සන්ධි පදයක් අඩංගු නොවන වරණය වන්නේ,

1. පුල්ලිංග, එතදවොච, තම්මිත්තං
2. තඤ්ඤෙව, අවංසිරො, එවංස
3. තන්‍ධනං, සණ්ඨිතො, ඔනද්ධා
4. විදූනගගං, යඤ්හි, තඤ්ච

31. සමාස කිරීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ,

1. භාෂා අලංකාරය ඇතිවීම
2. ශ්‍රැතිරම්‍යතාව ඇතිවීම
3. ඕජෝගුණය ඇතිවීම
4. අනුප්‍රාස රසය රහිත වීමයි

32. කම්මධාරය සමාසයට අයත් නොවන සමාසයක් ඇතුළත් වරණය වන්නේ,

1. මහාවීරො, මහාබලං, මුනිසීහො, බුද්ධනාගො
2. ධම්මසඤ්ඤා, ගුණධනං, අනිච්චසඤ්ඤා, අසුරො
3. කුපුරිසො, පාවචනං, සුගන්ධො, සාරිපුත්තත්ථෙරො
4. පඤ්ඤාරතනං, තිලොකං, චතුද්දිසං, ඡින්නභින්නං

33. කම්මධාරය සමාසයේ ප්‍රභේද ගණන වන්නේ,

1. 08 කි.
2. 09 කි.
3. 10 කි.
4. 07 කි.

34. තද්ධිත පද සකස් කරගන්නේ,

1. ධාතුවකට තද්ධිත ප්‍රත්‍යයක් එක් කර ගැනීමෙනි.
2. නාම පද දෙකක් එක් වීමෙනි.
3. නාමයකට උපසර්ගයක් එක් වීමෙනි
4. නාමයකට තද්ධිත ප්‍රත්‍යයක් එක් කර ගැනීමෙනි.

35. අර්ථ අනුව තද්ධිත ගණනින්,

1. 05 කි.
2. 6 කි.
3. 04 කි.
4. 07 කි.

36. අනේකාර්ථ තද්ධිත පද පමණක් අන්තර්ගත වරණය වන්නේ,

1. සීසික, සාතික, හත්ථික, ආභිධම්මික
2. පාපතර, දණ්ඩී, ගුණවන්තු, සතිමන්තු
3. දුතිය, තතිය, ඡට්ඨ, චතුත්ථ
4. මුදුතා, ආරොගය, සාමඤ්ඤ, කොසල්ල

**37.** කිතක පදයක් සකස් කරගන්නේ,

1. නාමයකට ප්‍රත්‍යයක් එක් කරගැනීමෙනි.
2. ධාතුවකට ප්‍රත්‍යයක් එක් කරගැනීමෙනි.
3. නාමයකට නිපාතයක් එක් කරගැනීමෙනි.
4. උපසර්ග පදයකට ධාතුවක් එක් කරගැනීමෙනි.

**38.** අතීතකාල කිතක ප්‍රත්‍යය නිවැරදිව අන්තර්ගත වරණය වන්නේ,

1. ත, තාවි, තවන්තු
2. ණ, අන, තු
3. තබ්බ, අනීය, රිච්ච
4. තුන, ත්වාන, ත්වා

**39.** අව්‍ය තද්ධිත ප්‍රත්‍යය අඩංගු වරණය වන්නේ,

1. ණ, ණායන, ණාන, ණෙය්‍ය
2. ණික, ණ, ඉම, ඉය
3. තර, තම, ඉස්සික, ඉය
4. ක්ඛත්තුං, ධා, ථා, ත්ත

**40.** තද්ධිත පදයක් නිර්මාණය කිරීමේ දී පද සාධනයට අයත් නොවන කාර්යයක් අඩංගු වරණය වන්නේ,

1. නාම පදයට පසුව තද්ධිත ප්‍රත්‍යය යෙදීම
2. නාම පදයේ විභක්ති ප්‍රත්‍යය ලොප් කිරීම
3. සංයුක්ත වූ පදයන්හි ආදි ස්වරය වෘද්ධි කිරීම
4. සුදුසු පරිදි සන්ධි කාර්යය සිදු කිරීම

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

### පාලි භාෂාව 2

### ආදර්ශ ප්‍රශ්න පත්‍ර - 03

කාලය පැය තුනයි.

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.

**1 කොටසටත් 11 කොටසින් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**

## 1 කොටස

**1. (අ)** පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

අථ ඛො ආයස්මා නන්දො තස්සා රත්තියා අච්චයෙන යෙන භගවා තෙනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා නන්දො භගවන්තං එතදවොචඃ "යං මෙ භන්තෙ භගවා පාටිභොගො; පඤ්චන්නං අච්ඡරාසතානං පටිලාභාය කකුටපාදානං. මුඤ්චාමහං භන්තෙ භගවන්තං එතස්මා පටිස්සවා"ති. මයාපි ඛො තෙ නන්ද චෙතසා චෙතො පරිච්ච විදිතොඃ "නන්දො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී"ති. දෙවතාපි මෙ එතමත්ථං ආරොචෙසිඃ 'ආයස්මා භන්තෙ නන්දො භගවතො භාතා මාතුච්ඡාපුත්තො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තං පඤ්ඤාවිමුත්තං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී"ති. යදෙව ඛො තෙ නන්ද අනුපාදාය ආසවෙහි චිත්තං විමුත්තං. අථා'හං මුත්තො එතස්මා පටිස්සවා'ති. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසිඃ

**(ආ)** පහත සඳහන් පද්‍ය සිංහලට නගන්න.

තඤ්ච ලද්ධං මයා වීර පණිධානං මමං තයා,
අණුකං වා මහන්තං වා තං සබ්බං පූරිතං මයා.

පරිනිබ්බාතුමිච්ඡාමි විහායෙමං කලෙබරං,
අනුජානාහි මෙ වීර දුක්ඛන්තකර නායක.

චක්කංකුසධජාකිණ්ණෙ පාදෙ කමලකොමලෙ,
පසාරෙහි පණාමං තෙ කරිස්සං පුත්තපෙමසා (ලකුණු 6+6 = 12 යි)

**2. (අ)** පාලියට නගන්න.

i. දක්ෂ ගුරුවරයා සිසුන් මැනවින් හික්මවයි.
ii. උපාසිකාවෝ මල් කඩා විහාරයට ගොස් බුදුන් පුදා ආපසු එති.
iii. මීයෝ පූසාගෙන් බිය වී බිලයට දිව්වෝය. (ලකුණු 2x3 = 6යි)

**(ආ)** ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.

සෙතව්‍යවාසිනො හි චූලකාලො මජ්ඣිමකාලො මහාකාලොති තයො භාතරො කුටුම්බිකා. තෙසු ජෙට්ඨනිට්ඨා දිසාසු විචරිත්වා සකටෙහි භණ්ඩං ආහරන්ති. මජ්ඣිමකාලො ආහතං වික්කිණාති. අථෙකස්මිං සමයෙ තෙ උභොපි භාතරො පඤ්චහි සකටසතෙහි නානා භණ්ඩං ගහෙත්වා සාවත්ථිං ගන්ත්වා සාවත්ථියා ච ජෙතවනස්ස ච අන්තරෙ සකටානි මොචයිංසු. තෙසු මහාකාලො සායණ්හසමයං මාලාගන්ධාදිහත්ථෙ සාවත්ථිවාසිනො අරියසාවකෙ ධම්මසවණත්ථාය ගච්ඡන්තෙ දිස්වා "කුහිං ඉමෙ ගච්ඡන්තී"ති පුච්ඡිත්වා තමත්ථං සුත්වා 'අහම්පි ගමිස්සාමී'ති චින්තෙත්වා කනිට්ඨං ආමන්තෙත්වා, "තාත සකටෙසු අප්පමත්තො හොහි. අහං ධම්මං සොතුං ගච්ඡාමී"ති වත්වා තථාගතං වන්දිත්වා පරිසපරියන්තෙ නිසීදි. සත්ථා තං දිස්වා අජ්ඣාසයවසෙන ආනුපුබ්බීකථං කථෙන්තො දුක්ඛක්ඛන්ධසුත්තාදිවසෙන

අනෙකපරියායෙන කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං ච කථෙසි. තං සුත්වා මහාකාලො සබ්බං කිර පහාය ගන්තබ්බං, පරලොකං පච්ඡන්තං නෙව භොගා න ඤාතයො අනුගච්ඡන්ති. කිම්මෙ සරාවාසෙන, පබ්බජිස්සාමීති චින්තෙසි.

i. සහෝදරයන් තිදෙනා වාසය කළේ කොහිද?
ii. මහාකාල දුටුවේ කවුරුන්ද? ඉන්පසු ඔහු කුමක් කළේද?
iii. බුදුරජාණන් වහන්සේ දේශනාවේ අන්තර්ගත වූයේ මොනවාද?
iv. මාලාගන්ධාදිහත්ථෙ, අජ්ඣාසයවසෙන, සංකිලෙසං යන පදවලට සිංහල අර්ථ දෙන්න.

(ලකුණු 1+1+1+3 = 6යි)

## 11 කොටස

**3. (අ)** පාලි අක්ෂරමාලාවේ අඝෝෂාක්ෂර දැක්වෙන බාලාවතාර පාඨය ලියන්න.

**(ආ)** ස්වර සන්ධියේ අසවර්ණාදේශය(*ක්වචාසවණ්ණං ලුත්තෙ*) නිදසුන් 3ක් ද නිග්ගහීත සන්ධියේ වර්ගාන්තාදේශයට (*වග්ගන්තං වා වග්ගෙ*) නිදසුන් 5ක් ද දෙන්න.

**(ඉ)** පහත සඳහන් විසන්ධි පද සන්ධි කර සූත්‍රය ලියා දක්වන්න.

i. ගංගා+උදකං ii. දෙව+ඉති iii. ඡ+අභිඤ්ඤා iv. ලොකස්ස+ඉති v. සං+ඨිතො vi. තං+එව

(ලකුණු 2+4+6= 12යි)

**4. (අ)** උපසර්ගයන්ගේ ක්‍රියාකාරිත්වය පෙන්වා දෙන ගාථාව ලියන්න.
**(ආ)** පූර්ව ක්‍රියා ප්‍රත්‍යය හා තුමන්ත ක්‍රියා ප්‍රත්‍යය වෙන වෙනම ලියා දක්වන්න.
**(ඉ)** හිස් තැන් පුරවන්න.

| ශබ්දය | චතුත්ථී විභත්ති | | පඤ්චමී විභත්ති | | සත්තමී විභත්ති | |
|---|---|---|---|---|---|---|
| දෙව | | දෙවානං | | | දෙවෙ | |
| භික්ඛු | භික්ඛාය | | භික්ඛුම්හා | | | භික්ඛූසු |
| ත | තස්ස | | | | | |

(ලකුණු 2+4+6= 12යි)

**5. (අ)** පහත දැක්වෙන වචන පාලියෙන් ලියන්න.
i. දැන් ii. පෙර වූවක්

**(ආ)** පහත දැක්වෙන වාක්‍ය අන්තර්ගත සියල්ල බහුවචනයෙන් ලියා දක්වන්න.
(සෑම පදයක්ම බහුවචන විය යුතුය)

i. පිතා නගරං ගන්ත්වා භණ්ඩං කිණාති.
ii. ආචරියො පරිවෙණං ආගන්ත්වා සිස්සං විනෙති.
iii. කම්මකාරො ඵරසුනා ගහෙත්වා රුක්ඛං ඡින්දි.
iv. අහං පොත්ථකං ගහෙත්වා පාඨං ලිඛාමි.

**(ඉ)** පහත සඳහන් මාතෘකාවකට අනුව වාක්‍ය හයක් ලියන්න.

i. සම්බුද්ධ පරිනිබ්බානං ii. දානානිසංසං iii. ජෙට්ඨ මාසො

(ලකුණු 2+4+6= 12යි)

**6. (අ)** අකර්මක ධාතු 2ක් හා සකර්මක ධාතු 2ක් නම් කරන්න.

**(ආ)** උපසර්ග පද 12ක් ලියන්න.

**(ඉ)** නිපාත පද යොදා නිවැරදි අර්ථය සහිත වාක්‍ය 06ක් ලියා අදහස ද ලියන්න.

(ලකුණු 2+4+6= 12යි)

**7. (අ)** විනය පිටකයේ කෘති ලියා දක්වන්න.

**(ආ)** සූත්‍ර, විනය, අභිධර්ම පිටක හඳුන්වන වෙනත් නාම පිළිවෙළින් දක්වන්න."

**(ඉ)** උදාන පාලියෙහි එන නන්ද සූත්‍රය කෙටියෙන් ලියා දක්වන්න.

(ලකුණු 2+4+6= 12යි)

**8. (අ)** සූත්‍ර පිටකයට අයත් නිකාය කෘති දක්වා ඊට රචනා කළ අට්ඨකථා පිළිවෙළින් ලියන්න.

**(ආ)** උදාන පාලි යනු මොනවාදැයි නිදසුන් දක්වමින් කෙටියෙන් දක්වන්න.

**(ඉ)** දිඹුලාගල කාශ්‍යප හිමියන් පාලි සාහිත්‍ය සංවර්ධනය පිණිස දැක්වූ දායකත්වය නිදසුන් කිහිපයක් මගින් පෙන්වා දෙන්න.

(ලකුණු 2+4+6= 12යි)

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

## පාලි භාෂාව 1

## ආදර්ශ ප්‍රශ්න පත්‍ර 04

කාලය පැයයි.

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.**

- ❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 1 බැගින් 40කි.**
- ❖ **අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.**
- ❖ **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) යොදන්න.**

**1.** පාලි හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂර ගණන,

1. 35කි. 2. 31කි. 3. 33කි. 4. 32කි.

**2.** අන්තස්ථාක්ෂර ඇතුළත් වරණය වන්නේ,

1. ය, ර, ළ, ව 2. ය, ර, ල, ව 3. ස, හ, ළ, අං 4. ය, ස, ල, ව

**3.** ඔ කණ්ඨොට්ඨජො යන්නෙහි අදහස වන්නේ,

1. ඔ තල්ලෙන් සහ උගුරෙන් උපදී. 2. ඔ උගුරෙන් සහ තොල්වලින් උපදී.
3. ඔ තල්ලෙන් සහ දත්වලින් උපදී. 4. ඔ දත්වලින් සහ උගුරෙන් උපදී.

**4.** භික්ඛුසු යනු,

1. සත්තමී විභක්ති ඒකවචන පදය යි. 2. පඤ්චමී විභක්ති බහුවචන පදය යි.
3. සත්තමී විභක්ති බහුවචන පදය යි. 4. ඡට්ඨී විභක්ති බහුවචන පදය යි.

**5.** ස යන්න විභක්ති ප්‍රත්‍යයක් වශයෙන් යෙදෙන විභක්ති දෙක වන්නේ,

1. පඨමා හා ආලපන ය. 2. දුතියා හා චතුත්ථී ය.
3. ඡට්ඨී හා පඤ්චමී ය. 4. චතුත්ථී හා ඡට්ඨී ය.

**6.** තනාදි ගණයට අයත් විකරණ ප්‍රත්‍යය වන්නේ,

1. ප්ප, ණ්හ 2. ආ, ය 3. ඔ, යිර 4. අ, අං

**7. ඡබ්බීසති** යන්නෙහි අර්ථය දක්වෙන වරණය වන්නේ,

1. 66යි. 2. 60යි. 3. 106යි. 4. 26යි.

**8.** ප්‍රතිශේධාර්ථය දක්වෙන නිපාතය වන්නේ,

1. ත 2. ති 3. මා 4.ණ්‍යා

**9. මා කිඤ්චි පාපමාගමා** යන්නෙහි අර්ථය වන්නේ,

1. මට කිසිම වරදක් නැත 2. මට කිසිම පවක් නැත
3. මට කිසිම පාප මිත්‍රයෙක් නොම වේවා 4. කිසි වරදක් නොම වේවා

**10. සම්පදානෙ චතුත්ථී** සඳහා නිදසුනක් වන්නේ,

1. භූපාලො පීඨෙ නිසීදති 2. රුක්ඛම්හා ඵලං පතති
3. කඤ්ඤා යාචකස්ස භත්තං දෙති 4. බුද්ධෙන ධම්මො දෙසිතො

11. කියාදි ගණයේ විකරණ ප්‍රත්‍යය වන්නේ,

1. ණා 2. ණෙ 3. ණය 4. නා

12. හීයොප්පභුති, පච්චක්ඛ, හීයත්තනී පාඨයෙහි නිවැරදි අර්ථය වන්නේ,

1. අතීතයේ පටන් ප්‍රත්‍යක්ෂ හීයත්තනිය යි.
2. ඊටේ පටන් ප්‍රත්‍යක්ෂ අතීතය හීයත්තනිය යි.
3. ඊයේ පටන් අප්‍රත්‍යක්ෂ අතීතය හීයත්තනිය යි.
4. අතීතයේ පටන් අප්‍රත්‍යක්ෂය හීයත්තනිය යි.

13. පරොක්ඛා ආඛ්‍යාතය මජ්ඣිම පුරිස ඒකවචනයෙහි වරනැගෙනුයේ,

1. අපචො, අපචත්ථ යනුවෙනි. 2. පචෙය්‍යාසි, පචෙය්‍යාථ යනුවෙනි.
3. ආගමො අගමිත්ත යනුවෙනි. 4. පපචෙ, පපචිත්ථ යනුවෙනි.

14. කර්තෘකාරක වාක්‍යයක් කර්මකාරකයට හැරවීමේ දී අනුගමනය කළ යුතු කරුණු කිහිපයක් පෙළගස්වා තිබෙන අයුරු පහත දක්වේ. එහි **අදාළ නොවන** වරණය වන්නේ,

1. කර්තෘ අනුක්ත කොට තතියා විභක්තියෙන් තැබිය යුතු ය.
2. ආඛ්‍යාත පදය අනුක්ත කර්තෘට අනුව තැබිය යුතු ය.
3. කර්ම පදය අනුක්ත කොට ප්‍රථමා විභක්තියෙන් ලිවිය යුතු ය.
4. උක්ත කර්මයට අනුව ආඛ්‍යාතය හෝ කිතක පදය යෙදිය යුතු ය.

15. කිතක පදයක් සාදා ගනු ලබන්නේ,

1. නාම පදයකට ප්‍රත්‍යයක් එක් කිරීමෙනි. 2. ධාතුවකට ප්‍රත්‍යයක් එක් කිරීමෙනි.
3. ආඛ්‍යාත පදයකට ප්‍රත්‍යයක් එක් කිරීමෙනි. 4. නාමයකට ප්‍රත්‍යයක් එක් කිරීමෙනි.

16. තුමන්ත ක්‍රියා නිර්මාණය කර ගැනීමේ දී භාවිත කරන ප්‍රත්‍යය වන්නේ,

1. ත්වා, තවෙ, තුං 2. මි, ම, ත්වා 3. තුං, ත්වාන, තායෙ 4. තුං තවෙ, තායෙ

17. අසබ්බධාතුක ආඛ්‍යාත පද මොනවාද?

1. වත්තමාන, භවිස්සති, කාලාතිපත්ති, සත්තමී
2. කාලාතිපත්ති, පරොක්ඛා, සත්තමි, හීයත්තනී
3. පරොක්ඛා, අජ්ජතනී, භවිස්සති, කාලාතිපත්ති
4. වත්තමාන, පඤ්චමී, කාලාතිපත්ති, භවිස්සන්ති

18. පූර්ව ක්‍රියා නොවන පදයක් සහිත වරණය වන්නේ,

1. ආරුය්හ, කත්වා, වසිත්වාන, දිස්වා 2. පබුජ්ඣිධිත්වා, පචිත්වාන, විභජ්ජ
3. ධොවිත්වාන, කාතුන, විවිච්ච, අභිභුය 4. ඨත්වාන, නිවත්ත, දිස්වා, පග්ගය්හ

19. **පරිළාහො** යන්නෙහි නිවැරදි විසන්ධිය වන්නේ

1. පරි+දාහො 2. පරිළි+ආහො 3. පර්+ඉළාහො පර්දි+ආහො

20. **මදාසරෙ** යන සූත්‍රය මගින් සිදුවන කාර්යය වන්නේ,

1. ස්වරයකට පසුව සිටි බින්දුවට ම කාරය හෝ දකාරය ආදේශ වේ.
2. ස්වරයකට පූර්වයෙන් සිටි බින්දුවට මකාරය හෝ සකාරය ආදේශ වේ.
3. ස්වරයකට පූර්වයෙන් සිටි බින්දුවට ම කාරය හෝ දකාරය ආදේශ වේ.
4. ව්‍යඤ්ජනයකට පූර්වයෙන් සිටි බින්දුවට මකාරය හෝ දකාරය ආදේශ වේ.

21. කම්මධාරය සමාසයට පමණක් අයත් වන පද ඇතුළත් වරණය වන්නේ,

1. ගුණදනං, අසුරො, මුඛනාසික, යථාබලං
2. පුරෙභත්තං, ඵාලපාචනං, ජිනවචනං, තිභවා
3. මහාපුරිසො, මහාවීරො, මහාබලං, මුනිසීහො
4. මහාපුරිසො, මහාසද්ධා, රාජභයං, මනවාසො

**22. ජිතින්ද්‍රියො** යන සමාස පදයෙහි නිවැරදි විග්‍රහ වාක්‍ය වන්නේ,

1. ජිතානි ඉන්ද්‍රියානි යස්මා සො  2. ජිතානි ඉන්ද්‍රියානි යෙන සො
3. ජිතා ච ඉන්ද්‍රියානි යං සො  4. ජිතො ඉන්ද්‍රියො සො

**23.** ඛීණාසවො, යුගනංගලං යන පද දෙක අයත් වන්නේ,

1. බහුබ්බීහි හා ද්වන්ද සමාසයට ය.  2. කම්මධාරය හා තප්පුරිස සමාසයට ය.
3. ද්වන්ද හා දිගු සමාසයට ය.  4. බහුබ්බීහි හා දිගු සමාසයට ය.

**24.** තස්මා ඉහ යන පද දෙක සන්ධි වන්නේ,

1. දොධස්ස ච සූත්‍රයෙනි  2. ඉවණ්ණොයන්නවා සූත්‍රයෙනි
3. ක්වචාසවණ්ණං ලුත්තෙ සූත්‍රයෙනි  4. යවමදනතරලාචාගමා සූත්‍රයෙනි

**25.** තද්ධිත පදයක් සාදා ගත හැකි වන්නේ,

1. ධාතුවකට ප්‍රත්‍යයක් එක් කිරීමෙනි.  2. නිපාතයකට ප්‍රත්‍යයක් එක් කිරීමෙනි.
3. නාමයකට ප්‍රත්‍යයක් එක් කිරීමෙනි.  4. උපසර්ගයකට ප්‍රත්‍යයක් එක් කිරීමෙනි.

**26.** තද්ධිත ප්‍රධාන කොටස් කීයකට බෙදේ ද?

1. 3කට  2. 4කට  3. 6කට  4. 2කට

**27.** අනේකාර්ථ තද්ධිතයට අයත් වන ප්‍රත්‍යයන් වන්නේ,

1. ණික, ණ, ඉම, ඉය  2. ණ, ණායන, ණාන, ණෙය්‍ය
3. ක්ඛත්තුං, ධා, ථා, ත්ත  4. තිය, ථ, ය, ම

**28.** අව්‍ය කිතක පද යනු,

1. වරනැගෙන කෘදන්ත පද යි.  2. වර නොනැගෙන කෘදන්ත පද යි.
3. උපසර්ගයක් එකතු වී සෑදෙන පද යි.  4. ධාතුවකට ප්‍රත්‍යයක් එකතු වීමෙන් සෑදෙන පද යි.

**29.** අතීත කෘදන්ත ප්‍රත්‍යය ඇතුළත් වරණය වන්නේ,

1. අක, අන, තු  2. ණ, තු, තාවි  3. ත, තාවි, තවන්තු  4. ත, තාවි, ආවි

**30.** බුද්ධඝෝෂ හිමියන් විසින් මජ්ඣිම නිකාය සඳහා සම්පාදනය කළ අටුවාව වන්නේ,

1. සුමංගල විලාසිනි  2. මනොරථපූරනී  3. සාරත්ථප්පකාසිනී  4. පපඤ්චසූදනී

**31.** බුද්ධඝෝෂ හිමියන් දඹදිව දී ලියන ලද **ප්‍රකරණ ග්‍රන්ථය** කුමක් ද?

1. සම්මෝහ විනෝදනී  2. අත්ථසාලිනී
3. ඤාණෝදය  4. පරමත්ථජෝතිකා

**32.** අපදාන පාලියට අටුවා ග්‍රන්ථයක් රචනා කරන ලද්දේ,

1. උපසේන හිමියන් ය.  2. මහානාම හිමියන් ය.
3. බුද්ධදත්ත හිමියන් ය.  4. ධම්මපාල හිමියන් ය.

**33.** දිඹුලාගල කාශ්‍යප හිමියන් වැඩ සිටි යුගය වන්නේ,

1. අනුරාධපුර යුගය  2. පොළොන්නරු යුගය
3. දඹදෙණි යුගය  4 කුරුණෑගල යුගය

**34.** පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් **දෘෂ්ටවිභග** නම් පොතට විරුද්ධව ලියූ කෘතියේ නාමය වන්නේ,

1. ගාරවාරවනිච්ඡය නම් කෘතියයි.  2. සත්‍යදර්ශනය නම් කෘතිය යි.
3. දසසංඥාවිභාගය නම් කෘතිය යි.  4. විශුද්ධිදීපනී නම් කෘතිය යි.

**35. අභිධම්මත්ථපුරාණ ටීකාව** රචනා කළ කර්තෘවරයා වන්නේ,

1. පොල්වත්තේ බුද්ධදත්ත හිමි  2. දිඹුලාගල කාශ්‍යප හිමි
3. බුද්ධඝෝෂ හිමි  4. බුද්ධදත්ත හිමි

**36. මහාවංසයේ ප්‍රථම භාගයේ කර්තෘවරයා** වන්නේ,

1. දික්සඳ සෙනෙවියා පිරිවෙන්වැසි මහානාම හිමි ය.
2. ථූපාරාම විහාරවාසී මොග්ගල්ලාන හිමි ය.
3. මිනින්දසේන පිරිවෙන් වැසි වාචිස්සර හිමි ය.
4. උත්තර විහාරවාසී උපතිස්ස තෙරුන් ය.

**37.** උදාන පාළියෙහි වර්ග හා සූත්‍ර ගණන නිවැරදිව දැක්වෙන වරණය වන්නේ,

1. වර්ග 9කි සූත්‍ර 80 කි
2. වර්ග 85කි සූත්‍ර 72 කි
3. වර්ග 10කි සූත්‍ර 81 කි
4. වර්ග 8කි සූත්‍ර 82 කි

**38. පුරාණදූතියිකා** යනුවෙන් හඳුන්වන්නේ,

1. පැරණි රජදේවිය යි.
2. පැරණි දූතිය යි.
3. පෙර බිරිඳ යි.
4. පෙර දේවියෙකි යි.

**39.** මහා ප්‍රජාපති ගෝතමී අපදානය ඇතුළත් වන්නේ,

1. සුමේධා වර්ගයට ය.
2. ඒකපොසථික වර්ගයට ය.
3. කුණ්ඩලකේසි වර්ගයට ය.
4. ඛත්තියා වර්ගයට ය.

**40. රහොගතාය** යන්නෙහි අර්ථය වන්නේ,

1. රාත්‍රිය ඉක්ම ගියේය යන්න යි.
2. රහසේම ගියේය යන්න යි.
3. විවේකීව වසන යන්න යි.
4. වයසින් වැඩි යන්න යි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

## පාලි භාෂාව 2

## ආදර්ශ ප්‍රශ්න පත්‍ර - 04

කාලය පැය තුනයි.

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.**

**1 කොටසටත් 11 කොටසින් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**

## 1 කොටස

**1. (අ)** පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

තෙන ච සමයෙන අඤ්ඤතරො තාපසො ගොපාලකුලං නිස්සාය ගංගාතීරෙ විහරති. සො පාතොව ගංගං ඔතරන්තො භාජනං ආගච්චන්තං දිස්වා පංසුකූලසඤ්ඤාය අග්ගහෙසි. තතො තත්ථ තං අක්ඛරපට්ටකං රාජමුද්දිකාලඤ්ජනඤ්ච දිස්වා මුඤ්චිත්වා තං මංසපෙසිං අද්දස. දිස්වානස්ස එතදහොසි. ‘සියා ගබ්භො. තථා හිස්ස දුග්ගන්ධපූතිභාවො නත්ථී’ති. තං අස්සමං නෙත්වා සුද්ධෙ ඔකාසෙ ඨපෙසි. අථ අඩ්ඪමාසච්චයෙන ද්වෙ මංසපෙසියො අහෙසුං. තාපසො දිස්වා සාධුතරං ඨපෙසි. තතො පුන අඩ්ඪමාසච්චයෙන එකමෙකිස්සා පෙසියා හත්ථපාදසීසානමත්ථාය පඤ්ච පඤ්ච පීළකා උට්ඨහිංසු. තාපසො දිස්වා පුන සාධුතරං ඨපෙසි. අථ අඩ්ඪමාසච්චයෙන එකා මංසපෙසි සුවණ්ණබිම්බසදිසො දාරකො. එකා දාරිකො අහොසි. තෙසු තාපසස්ස පුත්තසිනෙහො උපපජ්ජි.

**(ආ)** පහත සඳහන් පද්‍ය සිංහලට නගන්න.

සුද්ධෙ අනූනෙ මම භික්ඛුසංඝෙ - ලොකා ඉතො නිස්සරිතුං කමන්තෙ,  
පභාතකාලෙ ව්‍යසනං ගභානං - දිස්වාන නියාති ච චන්දලෙඛා

තදෙතරා භික්ඛුනියො ජිනග්ගං - තාරාව චන්දානුගතා සුමෙරුං  
පදක්ඛිණං කත්ව නිපච්ච පාදෙ - ඨිතා මුඛන්තං සමුදික්ඛමානා

න තිත්තපුබ්බං තව දස්සනෙන - චක්ඛුං න සොතං තව භාසිතෙන,  
චිත්තං මමං කෙවලමෙකමෙව - පප්පුය්‍ය තං ධම්මරසෙන තිත්තිං

(ලකුණු 6+6 = 12 යි)

**2. (අ)** පාලියට නගන්න.

i. මහරජතුමා භික්ෂූන් වහන්සේලාට විහාරයක් පූජා කළේය.  
ii. වනිතාවෝ නදියට ගොස් ස්නානය කොට මල් නෙළාගෙන ආපසු පැමිණෙති.  
iii. නිදි වරන්නාට රාත්‍රිය දිග ය. (ලකුණු 2x3 = 6යි)

**(ආ)** ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.

එකං සමයං භගවා මල්ලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසංඝෙන සද්ධිං යෙන ථූනං නාම මල්ලානං බ්‍රාහ්මණගාමො තදවසරි. අස්සොසුං ඛො, ථූනෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා ‘සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො මල්ලෙසු චරිකං චරමානො මහතා භික්ඛුසංඝෙන සද්ධිං ථූනං අනුප්පත්තො’ති. උදපානං තිණස්ස ච භුසස්ස ච යාව මුඛතො පූරෙසුං ‘මා තෙ මුණ්ඩකා සමණකා පානීයං අපංසූ’ති. අථ ඛො භගවා මග්ගා ඔක්කම්ම යෙන රුක්ඛමූලං තෙනුපසංකමි. උපසංකමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ‘ඉංඝ මෙ ත්වං ආනන්ද එතම්හා උදපානා පානීයං ආහරා’ති. ඒවං වුත්තෙ, ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච.

ඉදානි සො, භන්තෙ, උදපානා ථූනෙය්‍යකෙහි බ්‍රාහ්මණගහපතිකෙහි තිණස්ස ච භුසස්ස ච යාව මුඛතො පූරිතො මා තෙ මුණ්ඩකා සමණකා පානීයං අපංසූති.

i. භාග්‍යවතුන් වහන්සේ චාරිකාවේ යෙදුණේ කොහි ද?

ii. උන්වහන්සේ ආනන්ද හිමියන් අමතා පැවසූයේ කුමක්ද?

iii. ආනන්ද හිමියන් පැවසූ දේ සිංහලෙන් ලියන්න.

iv. ථූනං, ඔක්කම්ම, උදපානා යන පදවලට සිංහල අර්ථ දෙන්න. (ලකුණු 1+1+1+3 = 6යි)

## 11 කොටස

**3. (අ)** නිග්ගහීතය හඳුන්වන බාලාවතාර ගාථාව ලියන්න.

**(ආ)** **වො දන්තොට්ඨජො** යන පාඨයෙහි සිංහල අර්ථය ලියන්න.

**(ඉ)** පහත සඳහන් පද විසන්ධි කර සන්ධි වර්ගය ලියන්න.

i. එතදවොච ii. පුනරෙව iii. ඡායාව iv. පරියෙසනා v. සභික්ඛු vi. එසධම්මො

(ලකුණු 2+4+6= 12යි)

**4. (අ)** **පෙච්ච අත්ථං සංජානතීති උපසග්ගා** යන්නෙහි අර්ථය ලියා නිදසුනක් දෙන්න.

**(ආ)** සබ්බධාතුක ආඛ්‍යාත හා අසබ්බධාතුක ආඛ්‍යාත විභක්ති වෙන වෙනම නම් කරන්න.

**(ඉ)** පහත දැක්වෙන පදයන්හි සමාසය නම් කරන්න.

i. සාරිපුත්තත්ථෙරො ii. තිලොකං iii. විජිතමාරො

iv. මාතාපිතරො v. දිට්ඨධම්මො vi. චතුසච්චං

(ලකුණු 2+4+6= 12යි)

**5. (අ)** **සත්ථු** හා **කඤ්ඤා** යන ශබ්දවල පඤ්චමී හා සත්තමී විභක්ති ඒකවචන බහුවචන පද ලියන්න.

**(ආ)** තුමන්ත ක්‍රියා භාවිත කොට වාක්‍ය 4ක් හා පූර්ව ක්‍රියා භාවිත කොට වාක්‍ය 4ක් ලියන්න.

**(ඉ)** පහත සඳහන් මාතෘකාවකට අනුව වාක්‍ය හයක් ලියන්න.

i. සම්බුද්ධසාවකො ii. උපාසකො iii. මම මාතා

(ලකුණු 2+4+6= 12යි)

**6. (අ)** සංඛ්‍යා තද්ධිතයේ ප්‍රත්‍යය ලියා දක්වන්න.

**(ආ)** අව්‍ය තද්ධිතයට නිදසුන් 8ක් දෙන්න.

**(ඉ)** පහත තද්ධිත පදවල ප්‍රත්‍යය වෙන් කර ලියා දක්වන්න.

i. පඤ්චම ii. එකක්ඛත්තුං iii. වෙනතෙය්‍ය

iv. දොවාරික v. ආරොග්‍ය vi. කොසල්ල

(ලකුණු 2+4+6= 12යි)

**7. (අ)** බුද්ධඝෝෂ හිමියන් විසුද්ධි මාර්ගය ලිවීම සඳහා උපයෝගි කරගත් සංයුක්ත නිකායේ දේවතා සංයුක්තයේ ඇති ගාථා පාඨ දෙක ලියන්න.

**(ආ)** අභිධර්ම පිටකයට කළ අටුවා කෘති 3 නම් කරන්න.

**(ඉ)** රීස් ඩේවිඩ්ස් වියතාණන් ගැන කෙටි සටහනක් ලියන්න.

(ලකුණු 2+4+6= 12යි)

**8. (අ)** නවාංගසත්ථුසාසනය පිළිවෙළින් නම් කරන්න.

**(ආ)** උදාන පාලියෙහි වර්ග 8 නම් කරන්න.

**(ඉ)** අපදාන පාලිය පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු 2+4+6= 12යි)

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

## පාලි භාෂාව 1
## ආදර්ශ ප්‍රශ්න පත්‍ර 05

කාලය පැයයි.

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.

- ❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 1 බැගින් 40කි.
- ❖ අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
- ❖ ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) යොදන්න.

**01.** 'අ ආදයො තිතාළිසවණ්ණා' යනු අක්ෂර,

1. 41ක් 2. 43ක් 3. 40ක් 4. 43ක් ඇති බවයි.

**02.** 'ද්විජාක්ෂරයක්' නොවන්නේ,

1. ඔ 2. ව 3. ය 4. එ

**03.** 'සත්ථා' යන්නෙහි නිවැරදි අර්ථය වන්නේ,

1. සතුරා ය. 2. ශාස්තෘ ය. 3. සත්ත්වයා ය. 4. ආයුධය යි.

**04.** 'නීචං' යන පදයට නොගැළපෙන අර්ථ සහිත වචනය වන්නේ,

1. මිටි 2. පහත් 3. උසින් අඩු 4. කුලය

**05.** 'රාජා <u>ආසනෙ</u> නිසීදති' ඉරි ඇඳි පදයේ විභක්තිය වන්නේ,

1. පඤ්චමී 2. චතුත්ථී 3. සත්තමී 4. දුතියා

**06.** 'එකූනාසීති' යනු

1. 79 2. 99 3. 69 4. 80

**07.** පඤ්චමී විභක්තියට අයත් අර්ථයක් වන්නේ,

1. ආධාරාර්ථය 2. කර්තෘ අර්ථය 3. සම්ප්‍රදානාර්ථය 1. අපාදානාර්ථය

**08.** 'වන්දාහි' යන්නෙහි බහුවචන රූපය වන්නේ,

1. වන්දන්ති 2. වන්දථ 3. වන්දාම 4. වන්දාමි

**09.** 'සෙය්‍යථාපි' යනු

1. තද්ධිත පදයකි. 2. නිපාත පදයකි. 3. කිතක පදයකි. 4. උපසර්ග පදයකි.

**10.** 'අක්ඛරපට්ටකං' යනු,

1. අකුරු ලියූ රෙද්ද 2. අක්ෂර ඵලකය 3. අකුරු 08කි 4. අක්ෂර ආරම්භය

**11.** 'මහාවිහාරො' යන පදය අයත් සමාසය වන්නේ,

1. තප්පුරිස සමාසය 2. අව්‍යයීභාව සමාසය 3. කම්මධාරය සමාසය 4. දිගු සමාසය

12. 'තිවංගිකං' යන පදය සන්ධි වී ඇත්තේ,

1.වාපරො අසරූපා 2. යමෙදන්තස්සාදෙසො

3. යවමදනතරළාචාගමා 4. නිග්ගහීතඤ්ච සූත්‍රයෙනි.

13. 'යජ්ජෙවං' යන පදය නිවැරදිව විසන්ධි කර ඇති වර්ණය වන්නේ,

1. යදි + එවං 2. ය + දිඑවං 3. යජ් + එවං 4. යජ්ජ + එවං

14. සාමඤ්ඤ තද්ධිතයේ ප්‍රභේද ගණන වන්නේ,

1. 03කි. 2. 04කි. 3. 05කි. 4. 06කි.

15. ක්‍රියා නිෂ්පත්තියට නිමිති වීමෙන් ක්‍රියාව නිපද වනුයේ,

1. ආඛ්‍යාතයි. 2. ධාතුයි. 3. කාරකයි. 4. විකරණයි.

16. බුද්ධඝෝෂ ආචාර්යයන් වහන්සේ මෙරටට වැඩි කාලය වනුයේ ක්‍රිස්තු වර්ෂ

1. 420-460 2. 400-440 3. 412-434 4. 415-436 කාලයේ දී ය.

17. බුදුගොස් හිමියන් විසින් සංයුක්ත නිකායට කළ අටුවාව වන්නේ,

1. සාරත්තප්පකාසිනිය 2. මනොරථපූරණිය

3. සමන්තපාසාදිකාව 4. සුමංගල විලාසිනිය

18. අපදාන පාලිය වර්ග ගණනින් නිවැරදි වර්ණය වන්නේ

1. 60කි. 2. 63කි. 3. 64කි. 4. 65කි.

19. මහා ප්‍රජාපතී ගෝතමී අපදානය අයත් වන්නේ ථේරි අපදානයේ,

1. සුමේධ වර්ගයට ය. 2. කුණ්ඩලකේසී වර්ගයට ය.

3. ඛත්තියා වර්ගයට ය. 4. එකුපොසථික වර්ගයට ය.

20. 'කංඛාවිතරණිය' රචනා කරන ලද්දේ,

1. සෝණ තෙරුන් 2. බුද්ධමිත්ත තෙරුන්

3. බුද්ධදේව තෙරුන් 4. ජෝතිපාල තෙරුන් විසිනි.

21. මහාචාර්ය තෝමස් විලියම්ස් රීස් ඩේවිඩ්ස් මැතිතුමා මෙරට සිවිල් සේවකයෙකු ලෙසින් බැඳුණේ,

1. 1864 දීය. 2. 1865 දීය. 3. 1899 දීය. 4. 1869දී ය.

22. 'කාරිය' යන කිතක පදයේ ප්‍රත්‍යය වන්නේ,

1. ණ්‍ය 2. ඉය 3. ආය 4. ණිය

23. 'කකුටපදානි' යනු

1. රිදී පැහැ පා ඇති 2. පරවි පා බඳු

3. සියුමැලි පා ඇති 4. හංසයෙකුගේ වැනි පා ඇති

24. 'තිලොකං' යන සමාස පදය අයත් වන්නේ,

1. කම්මධාරය සමාසය 2. දිගු සමාසය

3. තප්පුරිස සමාසය 4. ද්වන්ද සමාසය

**25.** නිපාත පදයක් නොවන්නේ,

1. පරි 2. පරිතො 3. උපරි 4. සුවෙ

**26.** 'උජ්ඣාපෙති' යන පදයට නොගැළපෙන අර්ථ සහිත වචනය වන්නේ,

1. කෑ ගැසීම 2. බැණ වැදුණේය. 3. නැගී සිටියේ ය. 4. දොස් නැගීය.

**27.** 'ඉත්‍යෙවං' (ඉච්චෙවං) යන පදය සන්ධි වී ඇත්තේ,

1. නයෙ පරං යුත්තේ 2. වා පරො අසරූපා

3. අනුපදිට්ඨානං වුත්තයෝගතො 4. සරා සරෙ ලොපං

**28.** ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරනු ලැබූයේ බුද්ධ පරිනිර්වාණයෙන් වසර,

1. 440 2. 443 3. 236 4. 100 කට පසු ව ය.

**29.** සීහළට්ඨ කථාවක් නොවන්නේ,

1. පච්චරිය අට්ඨකතාව 2. අන්ධට්ඨකථාව

3. කුරුන්දි අට්ඨකථාව 4. මහා අට්ඨකථාව

**30.** 'වාසුදෙව' යන පදයෙහි ඇති තද්ධිත ප්‍රත්‍යය වන්නේ,

1. ණ 2. ආණ 3. ණෙය්‍ය 4. ව

**31.** බෝධිරාජ කුමාර සූත්‍රය ඇතුළත් වන්නේ,

1. මජ්ඣිම නිකායට ය. 2. අංගුත්තර නිකායට ය.

3. ඛුද්දක නිකායට ය. 4. දීඝ නිකායට ය.

**32.** මහාචාර්ය තෝමස් විලියම් රීස් ඩේවිඩ්ස් මැතිතුමා උපත ලැබූ වර්ෂය වන්නේ,

1. 1943දීය 2. 1843දීය 3. 1936දීය 4. 1946දීය

**33.** අභිධර්ම පිටකය හඳුන්වන විශේෂ නාමයක් වන්නේ,

1. ආණා දේශනා 2. වෝහාර දේශනා

3. පරමත්ථ දේශනා 4. ප්‍රාතිමෝක්ෂ දේශනා යනු යි.

**34.** 'සුඛිනො වත යෙ අකිඤ්චනා' යන උදානය අයත් සූත්‍රය වන්නේ,

1. ගබ්භිනී සූත්‍රය 2. නන්ද සූත්‍රය 3. ජුණ්හ සූත්‍රය 4. සංගාමජී සූත්‍රය

**35.** වර්තමාන කිතක ප්‍රත්‍යයක් වන්නේ,

1. තාවි 2. ත 3. තවන්තු 4. මාන

**36.** පූර්ව ක්‍රියා පදයක් නොවන්නේ,

1. ධාවිත්වාන 2. කත්වා 3. දිස්වා 4. ගන්තුං

**37.** අපදාන පාළියෙහි අපදාන යන්නෙහි අර්ථය වන්නේ,

1. ඉවත්වීමයි. 2. උතුම් ක්‍රියාවයි. 3. ජීවන දෘෂ්ටියයි. 4. උපකාරයයි.

**38.** තුමන්ත ක්‍රියාවක් වන්නේ,

1. වන්දිතුං 2. ගන්ත්වා 3. යොජෙත්වා 4. නිසීදති

**39.** 'ගච්ඡන්තො' යන පදය අයත් වන්නේ,

1. වර්තමාන කෘදන්ත
2. අතීත කාල කෘදන්ත
3. තද්ධිත
4. නිපාත පදවලට ය.

**40.** කාරක විභක්තියක් නොවන්නේ,

1. දුතියා විභක්තිය
2. ඡට්ඨී විභක්තිය
3. චතුත්ථී විභක්තිය
4. කරණ විභක්තිය යි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

## පාලි භාෂාව 2

## ආදර්ශ ප්‍රශ්න පත්‍ර - 05

කාලය පැය තුනයි.

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.

**1 කොටසටත් 11 කොටසින් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**

## 1 කොටස

**1. (අ)** පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

එවමාවුසොති සො ආයස්මා නන්දො තස්ස භික්ඛුනො පටිසුත්වා යෙන භගවා තෙනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො සො ආයස්මන්තං නන්දං භගවා එතදවොච. සච්චං කිර තවං නන්ද සම්බහුලානං භික්ඛූනං එවමාරොචෙසි. අනභිරතො අහං ආවුසො බ්‍රහ්මචරියං චරාමි න සක්කොමි බ්‍රහ්මචරියං සන්ධාරෙතුං සික්ඛං පච්චක්ඛාය හීනයාවත්තිස්සාමීති එවං භන්තෙති 'කිස්සපන ත්වං නන්ද අනභිරතො බ්‍රහ්මචරියං චරසි? න සක්කොසි බ්‍රහ්මචරියං සන්ධාරෙතුං. සික්ඛං පච්චක්ඛාය හීනයාවත්තිස්සන්තීති.

**(ආ)** පහත සඳහන් පද්‍ය සිංහලට නගන්න.

අහං සුගත මාතා තෙත්වංච වීර පිතා මම
සද්ධම්ම සුඛෙදො නාථ තයා ජාතම්හි ගොතම

සංවඩ්ඪතොයං සුගත රූපකායයෝ මයා තව
අනින්දියො ධම්මකායො මම සංවඩ්ඪතො තයා

මුහුත්ත තණ්හා සමනං ඛිරංත්වං පායිතොමයා
තයාහං සන්තමච්චන්තං ධම්ම කිරම්බි සායිතා (ලකුණු 6+6 = 12 යි)

**2. (අ)** පාලියට නගන්න. (ලකුණු 2x3 = 6යි)

i. පින් කරන පුද්ගලයා නිතර නිතර පින් කරයි.

ii. මාලාකාරයා මල් රැස්කර මල්දම් ගොතා විකුණා ජීවත්වෙයි.

iii. මගේ මව උදෙන්ම දානය පිළියෙළ කොට විහාරයට ගොස් භික්ෂු සංඝයාට පූජා කළාය.

**(ආ)** ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.

සබ්‍රහ්මකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සබුබ්බදෙවතානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සපුබ්බාචරියකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සාහුණෙය්‍යකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. බ්‍රහ්මාති භික්ඛවෙ මාතාපුතුනං එතං අධිවචනං. පුබ්බදෙවතාති භික්ඛවෙ මාතාපිතුනං එතං අධිවචනං. පුබ්බාචරියාති භික්ඛවෙ මාතාපිතුනං එතං අධිවචනං. ආහුණෙය්‍යාති භික්ඛවෙ මාතාපිතුනං එතං අධිවචනං. තං කිස්ස හෙතු? බහූපකාරා භික්ඛවෙ මාතාපිතරො පුත්තානං. ආපාදකා පොසකා ඉමස්ස ලොකස්ස දස්සෙතාරොති. එතමත්ථං භගවා අවෝච. තත්ථෙතං ඉති වුච්චති.

i. දෙමාපියෝ හැඳින්වීමට යොදා ඇති පර්යාය පද තුනක් ලියන්න.

ii. ආහුණෙය්‍ය ගුණය පහදන්න.

iii. දෙමාපියෝ දරුවන්ට දක්වන උපකාර මොනවාද?

iv. මාපිය දූදරු සම්බන්ධයේ වටිනාකම ඡේදය ඇසුරින් පහදන්න. (ලකුණු 1+1+1+3 = 6යි)

## 11 කොටස

**3. (අ)** පාලි භාෂාවේ වර්ගාක්ෂර හඳුන්වන බාලාවතාර සූත්‍ර පාඨය ලියන්න.

**(ආ)** පාලි භාෂාවේ සන්ධි නම් කර ස්වර සන්ධියේ ලෝපය උදාහරණ මගින් පැහැදිලි කරන්න.

**(ඉ)** සමාස යනු කුමක්දැයි හඳුන්වා දිගු සමාසය උදාහරණ මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 2+4+6= 12යි)

**4. (අ)** තද්ධිත ප්‍රධාන ප්‍රභේද නම් කරන්න.

**(ආ)** අනෙකත්ථ තද්ධිතයේ ප්‍රත්‍ය 05ක් ලියන්න.

**(ඉ)** පහත වගුව සම්පූර්ණ කරන්න. (ලකුණු 2+4+6= 12යි)

| ශබ්දය | දුතියා විභක්තිය | | තතියා විභක්තිය | | සත්තමී විභක්තිය | |
|---|---|---|---|---|---|---|
| | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන |
| දේව | ..................: | දෙවෙ | දෙවෙන | ..................: | දෙවම්හි | ..................: |
| ඉම | ..................: | ඉමෙ | ..................: | එහි, ඉමෙහි | ඉමම්හි | ..................: |
| තුම්හ | තං | ..................: | ..................: | තුම්හෙහි | ත්වයි | ..................: |

**5. (අ)** 'ද්විපදෙ තුල්‍යාධිකරණෙ කම්මධාරයො' යන සූත්‍රයෙන් කියැවෙන අදහස කුමක්ද?

**(ආ)** පහත සඳහන් විග්‍රහවාචී පද සමාස කර දක්වන්න.

1. සාරිපුත්තො සො ථෙරො
2. ඡින්නං තං භින්නං
3. සීහො විය මුනි
4. පඤ්ඤා එව ධනං
5. න සූරො

**(ඉ)** පහත සඳහන් පද කවර තද්ධිතයකට අයත් දැයි නම් කරන්න.

1. වාසිට්ඨ
2. සාතික
3. සාකටික
4. පාපතර
5. නාවික (ලකුණු 2+4+6= 12යි)

**6. (අ)** පහත දැක්වෙන පද පාලියෙන් ලියන්න.

1. සවස 2. උදේ

**(ආ)** පහත දැක්වෙන වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.

1. සීහො මිගෙ මාරෙති

2. අහං ඔදනං පචාමි

**(ඉ)** පහත දැක්වෙන මාතෘකාවකට අනුව වාක්‍ය 06කට නොඅඩු රචනාවක් ලියන්න.

1. මම ආචරියො
2. ආනන්දත්ථෙරො
3. මහාචෙතිං (ලකුණු 2+4+6= 12යි)

**7. (අ)** වර්තමාන කෘදන්ත ප්‍රත්‍ය දක්වා උදාහරණ දෙකක් දෙන්න.

**(ආ)** පහත දැක්වෙන පදයන්හි උපසර්ග පද වෙන්කර දක්වන්න.

1. අතික්කමති 2. පටික්කමති 3. නික්ඛමති 4. අවනද්ධා

**(ඉ)** පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට සුදුසු ක්‍රියා පද වරහනෙන් තෝරා යොදා නැවත ලියන්න.

(ආගඤ්ඡුං/ පරියාපුණාථ/ උපට්ඨහස්සු/ නික්කුජ්ජෙය්‍යුං/ යන්තු/ කරොහි/ සම්මොදිංසු/ භාවෙය්‍ය)

1. අසෙසා විලයං ........................... අනන්ත ගුණ තෙජසා
2. .................. භික්ඛවෙ ආටානාටියං රක්ඛං
3. ඉති ඉමා චතුරාරක්ඛා භික්ඛු ................ සීලවා
4. අප්පෙකච්චෙ භගවතා සද්ධිං ..........................
5. ...................... තස්ස උපට්ඨානං ඛත්තියා බ්‍රාහ්මණා බහු
6. ඛීණාසවා අන්නෙන පානේන ..............
7. යං තෙ කරණීයං තං ......................... (ලකුණු 2+4+6= 12යි)

**8. (අ)** නවාංග සත්ථු සාසනය නම් කරන්න.

**(ආ)** අපාදාන ප්‍රභේද නම් කර දක්වන්න.

**(ඉ)** උදාන පාලියේ වර්ග 08 නම් කරන්න. (ලකුණු 2+4+6= 12යි)

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

## පාලි භාෂාව 1
## ආදර්ශ ප්‍රශ්න පත්‍ර 06

කාලය පැයයි.

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 1 බැගින් 40කි.**
- **අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.**
- **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) යොදන්න.**

**01.** අක්ෂර යන පදයට සමාන නොවන පදයක් ඇති වර්ණය වන්නේ,

1. වණ්ණ 2. අක්ඛර 3. අකුරු 4. වචන

**02.** 'අක්ෂර 43ක් ඇති පාලි ව්‍යාකරණ සම්ප්‍රදාය' වන්නේ,

1. කච්චායන සම්ප්‍රදාය 2. සද්දනීති සම්ප්‍රදාය
3. මොග්ගල්ලායන සම්ප්‍රදාය 4. ඉහත එකක්වත් නොවේ

**03.** මොග්ගල්ලායන ව්‍යාකරණ සම්ප්‍රදායයේ 'එ, ඔ' පිළිබඳ නිවැරදි පිළිතුර ඇති වරණය වන්නේ,

1. එ, ඔ අක්ෂර දෙක හල් අකුරු යෙදීමෙන් දීර්ඝ වේ.
2. ඒ, ඕ අක්ෂර දෙකක් විද්‍යමාන නොවේ.
3. එ, ඒ අක්ෂර දෙක උච්චාරණය කරන්නේ එකම අයුරිනි.
4. එ, ඔ යනුවෙන් අක්ෂර දෙකක් එකී සම්ප්‍රදායයේ නැත.

**04.** පහත සඳහන් පාඨ අතුරින් 'වැරදි' අදහසක් ඇති වරණය වන්නේ,

1. අක්ෂර නිසි ලෙස නොලියූ විට වැරදි අර්ථයක් ගෙන දෙයි.
2. නිසි අරුත්ට අනුකූල වදන නොලී විට අදහසට හානි සිදු නොවේ.
3. අක්ෂර නිවැරදිව ලීමට භාෂාව පිළිබඳ දැනුම තිබිය යුතුය.
4. නිසි ලෙස උච්චාරණය නොකිරීමෙන් අදහසට හානි සිදු වේ.

**05.** සා, ක, ජෙ යන පදවල 'නිවැරදි' අදහස පිළිවෙළින් ඇති වර්ණය වන්නේ,

1. ඇය, බොල, ජලය 2. බොල, ඇය, ජලය
3. ඇය, ජලය, බොල 4. බොල, ජලය, ඇය

**06.** පාලි අක්ෂර මාලාව සම්බන්ධයෙන් 'වැරදි' අදහසක් දෙන වර්ණය වන්නේ,

1. පාලි භාෂාවේ ස්වර 08ක් ඇත.
2. පාලි භාෂාවේ ව්‍යඤ්ජන 38ක් ඇත.
3. පාලි භාෂාවේ ඝෝෂාක්ෂර 21කි.
4. පාලි භාෂාවේ අඝෝෂාක්ෂර 11කි.

07. හ්‍රස්ව අක්ෂර 'නිවැරදිව' දැක්වෙන වර්ණය වන්නේ,

1. අ, ඉ, උ 2. අ, එ, ඔ 3. අ, ඉ, එ 4. අ, උ, එ

08. පාලි භාෂාවේ අසවර්ණ ස්වර ලෙසින් දැක්වෙන අකුරු දෙක වන්නේ,

1. අ, ආ 2. ඉ, ඊ 3. උ, ඌ 4. එ, ඔ

09. වර්ගාක්ෂර සඳහා පර්යාය (සමාන) පදයක් වන්නේ,

1. වර්ගාන්තාක්ෂර 2. ස්පර්ශාක්ෂර 3. අවර්ගාක්ෂර 4. අන්තස්ථාක්ෂර

10. අඝෝෂාක්ෂර හඳුන්වා දෙන බාලාවතාර පාඨය වන්නේ,

1. අක්ඛරාපාදයො එකචත්තාළීසං 2. තත්‍ථොදන්තා සරා අට්ඨ

3. ලහුමත්තා තයො රස්සා 4. වග්ගානං පඨමදුතියා සො චාඝොසා

11. ඝෝෂාක්ෂරයක් නොවන පිළිතුර සහිත වර්ණය වන්නේ,

1. ග, ක, ජ, ඩ 2. ග, ස, ඞ, ජ 3. ඞ, ඩ, න, ධ 4. හ, බ, ම, ස

12. පාලි භාෂාවේ කණ්ඨජාක්ෂර ගණන නිවැරදිව දැක්වෙන වර්ණය වන්නේ (ස්වර ද ඇතුළුව)

1. 6කි 2. 7කි 3. 8කි 4. 9කි

13. 'ඔට්ඨජ' යනුවෙන් දැක්වෙන්නේ පදයේ සිංහල අදහස වන්නේ,

1. දිව 2. දත 3. උගුර 4. තොල

14. 'ඌෂ්මාක්ෂර' නිවැරදිව දැක්වෙන වරණය වන්නේ,

1. ස, ළ 2. ස, හ 3. හ, ළ 4. ල, ස

15. අල්පප්‍රාණ හා මහාප්‍රාණ සම්බන්ධ නිවැරදි අදහස ඇති වර්ණය වන්නේ,

1. අල්පප්‍රාණ හා මහාප්‍රාණ අක්ෂර 10 බැගින් ඇත.

2. අල්පප්‍රාණ අක්ෂර 09කි.

3. මහාප්‍රාණ උච්චාරණය කිරීම සඳහා වැඩි ශක්තියක් වුවමනා නොවෙයි.

4. බ, ස, ඡ, ඣ යනු අල්පප්‍රාණ අක්ෂර කිහිපයකි.

16. අවර්ගාක්ෂර සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර වන්නේ,

1. වර්ගාක්ෂරවලට අයත් නොවන සියලු ව්‍යඤ්ජනාක්ෂරයි.

2. අන්තස්ථාක්ෂර පමණක් අවර්ගාක්ෂර වේ.

3. වර්ගාන්තාක්ෂර යනු අවර්ගාක්ෂරවලට සමාන පදයකි.

4. අවර්ගාක්ෂර ගණනින් 6කි.

17. 'ළ' සම්බන්ධයෙන් නිවැරදි අදහසක් වන්නේ,

1. ළ යනු මුද්ධජ අක්ෂරයකි. 2. ළ යනු වර්ගාක්ෂරයකි.

3. ළ යනුවෙන් අක්ෂරයක් හෝඩියේ නැත. 4. ළ යනු අඝෝෂාක්ෂරයකි.

18. පූර්වක්‍රියා, තුමන්ත ක්‍රියා, නිපාත, උපසර්ග ව්‍යාකරණ වර්ගය නිවැරදිව දැක්වෙන වර්ණය වන්නේ,

1. ගන්තුං, ආදාය, සුවෙ, අව 2. ආදාය, ගන්තුං, සුවෙ, අව

3. අව, සුවෙ, ආදාය, ගන්තුං 4. ආදාය, ගන්තුං, අව, සුවෙ

**19.** 'ස්‍යාද්‍යන්ත' පද යනුවෙන් හඳුන්වන්නේ,

1. කෘදන්ත පදයි 2. ආඛ්‍යාත පදයි 3. නාම පදයි 4. නිපාත පදයි

**20.** 'ත්‍යාද්‍යන්ත' පද යනුවෙන් හඳුන්වන්නේ,

1. කෘදන්ත පදයි 2. ආඛ්‍යාත පදයි 3. නාම පදයි 4. නිපාත පදයි.

**21.** නාම විභක්ති පඨමා ප්‍රත්‍ය මාලාව වන්නේ,

1. සි යො 2. අං යො 3. නා හි 4. ස නං

**22.** පාලි භාෂාවේ නාම විභක්ති ගණන නිවැරදිව දැක්වෙන වර්ණය වන්නේ,

1. 8කි 2. 9කි 3. 10 කි 4. 11 කි

**23.** නාම විභක්ති ප්‍රත්‍ය මාලාවේ දී තතියා හා කරණ විභක්ති සම්බන්ධයෙන් වැරදි අදහස ඇති වර්ණය වන්නේ,

1. තතියා හා කරණ විභක්ති දෙක සඳහා ඇත්තේ එකම ප්‍රත්‍ය මාලාවකි.
2. නා හි යනු තතියා හා කරණ විභක්ති ප්‍රත්‍ය මාලාවයි.
3. කරණ විභක්තියට පසු තතියා විභක්තිය වරනැගේ.
4. කරණ විභක්තියෙන් 'කරණකොටගෙන' යන අදහස ගෙන දෙයි.

**24.** නිසි පරිදි විභක්ති ප්‍රත්‍ය යොදා නැති පිළිතුර සහිත වර්ණය වන්නේ,

1. පඨමා- සි, යො 2. දුතියා- අං, යො 3. තතියා- නා, හි 4. චතුත්ථී- ස්මා, හි

**25.** '**කම්මත්ථෙ දුතියා**' සඳහා නිදසුනක් රහිත වර්ණය වන්නේ,

1. කුමාරො <u>භත්තං</u> භුඤ්ජති 2. රාජා <u>ආසනෙ</u> නිසීදි
3. සාමණෙරො <u>ලෙඛනං</u> ලිඛති 4. මාතා <u>පුප්ඵානි</u> ඔචිනාති

**26.** පාලි අර්ථයට සමාන නොවන අදහසක් දෙන වර්ණය වන්නේ,

1. රාජා- රජතුමා 2. චොරො- සොරා 3. සුනඛො- බල්ලා 4. පීඨං- ඇඳ

**27.** එක, ති, චතු සංඛ්‍යා ශබ්ද සම්බන්ධයෙන් වැරදි පිළිතුර වන්නේ,

1. සියල්ල පුල්ලිංග ශබ්ද පමණි.
2. එක ශබ්දය බහුවචනයේ වරනොනැගේ.
3. සියල්ල පුල්ලිංග, ඉත්ථිලිංග, නපුංසක ලිංගවල වරනැගේ.
4. චතු ශබ්දය ඒකවචනයේ වරනොනැගේ.

**28.** '29, 31, 40, 41' නිවැරදිව දැක්වෙන වර්ණය වන්නේ,

1. එකූනතිංසති, චත්තාළීසති, එකචත්තාළීසති, එකතිංසති
2. චත්තාළීසති, එකචත්තාළීසති, එකතිංසති, එකූනතිංසති
3. එකූනතිංසති, එකචත්තාළීසති, එකතිංසති, එකූනතිංසති
4. එකූනතිංසති, එකතිංසති, චත්තාළීසති, එකචත්තාළීසති

**29.** සමාන අර්ථ ඇති සංඛ්‍යාවාචී පද දෙකක් නොවන්නේ,

1. ද්වාදස, බාරස- 12 2. චුද්දස, චතුද්දස- 14
3. තෙවීසති, චතුවීසති- 23 4. බාවීසති, ද්වාවීසති- 22

30. '**චතුරාසීති**' යනු,

1. 44 2. 64 3. 94 4. 84 ය.

31. කාරක ගණයට අයත් නොවන විභක්තියක් වන්නේ,

1. පඨමා විභක්තිය 2. චතුත්ථී විභක්තිය

3. පඤ්චමී විභක්තිය 4. සත්තමී විභක්තිය

32. 'යාචකස්ස, පීඨෙ, සාකටෙන' යන කාරක පද යෙදෙන විභක්ති පිළිවෙළින් දැක්වෙන වර්ණය වන්නේ,

1. චතුත්ථී, කරණ, සත්තමී 2. චතුත්ථී, සත්තමී, කරණ

3. කරණ, චතුත්ථී, සත්තමී 4. සත්තමී, කරණ, චතුත්ථී

33. පාලි භාෂාවේ කාරක ගණන සංඛ්‍යාත්මකව ගත් කල්හි,

1. 5කි 2. 6කි 3. 7කි 4. 8කි

34. අපාදානාර්ථය යනු,

1. ස්වාමි අර්ථයයි. 2. වෙන්වීමේ අර්ථයයි 3. කරණාර්ථයයි 4. ආධාරාර්ථයයි.

35. ඉච්ඡිත කම්ම දුතියා විභක්තිය සඳහා නිදසුනක් නොවන්නේ,

1. කුමාරො බුද්ධං වන්දති 2. උපාසකො දානං දෙති

3. දහරො කණ්ඨකං මද්දති 4. භික්ඛු පොත්ථකං පඨති

36. ක්‍රියා විශේෂණය රහිත වාක්‍යයක් ඇති වර්ණය වන්නේ,

1. සුඛං සුපති සුඛං පටිබුජ්ඣති 2. අස්සො සීඝං ධාවති

3. දුක්ඛං සෙති පරාජිතො 4. උපමා මං පටිභාති

37. ක්‍රියා පවර්ගාර්ථයේ තතියා විභක්තියට නිදසුනක් නොමැති වර්ණය වන්නේ,

1. කාලෙන ධම්මසවණං එතං මංගලමුත්තමං.

2. ථෙරා නවහි මාසෙහි සංගීතිං අකංසු.

3. නරිස්සරො තීහි වස්සෙහි විහාරං නිට්ඨාපෙසි

4. භික්ඛු ද්වීහි මාසෙහි පොත්ථකං ලිඛසි

38. සහාදි යෝගය නොදැක්වෙන වර්ණය වන්නේ,

1. සො උපාසකෙන සද්ධිං ගාමං ගච්ඡති

2. දහරො මාතුයා සහ විහාරං ගච්ඡති

3. භික්ඛු තෙන සමං මග්ගං පටිපජ්ජිංසු

4. ථෙරා පභාතෙ පිණ්ඩාය පාවිසි

39. සත්තමී විභක්තියට අයත් නොවන ආධාර ප්‍රභේදවලට අයත් නොවන වර්ණය වන්නේ,

1. ඖපසිලෙසික ආධාරය 2. විසය ආධාරය

3. අකථිත ආධාරය 4. ව්‍යාපික ආධාරය

40. සත්තමී විභක්ති පද රහිත වර්ණය වන්නේ,

1. ආකාසෙ, පබ්බතෙ, විහාරෙ, සයනෙ 2. පබ්බතම්හි, විහාරම්හි, ආකාසම්හා, සයනම්හි

3. බාහාසු, භික්ඛුසු, සංඝෙ, ගංගායං 4. සටෙසු, සලිලෙ, ආකාසෙ, පබ්බතෙසු

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

### පාලි භාෂාව 2

### ආදර්ශ ප්‍රශ්න පත්‍ර - 02

කාලය පැය තුනයි.

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.**

**1 කොටසටත් 11 කොටසින් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**

### 1 කොටස

**1. (අ)** පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

තතියසපි බො ආයස්මතො සංගාමජිස්ස පුරාණදුතියිකා ආයස්මන්තං සාංගාමජිං එතදවොචඃ බුද්දපුත්තා'ම්හි සමණඃ පොස ම'න්ති. තතියසපි බො ආයස්මා සංගාමජි තුණ්හී අහොසි. අථ බො ආයස්මතො සංගාමජිස්ස පුරාණදුතියිකා තං දාරකං ආයස්මතො සංගාමජිස්ස පුරතො නික්ඛිපිත්වා පක්කාමි 'එස තෙ සමණ, පුත්තො පොස න'න්ති. අථ බො ආයස්මතො සංගාමජි තං දාරකං නෙව ඔලොකෙසි, නපි ආලපි. අථ බො ආයස්මතො සංගාමජිස්ස පුරාණතුකියිකා අවිදූරං ගන්ත්වා අපලොකෙන්තී අද්දස ආයස්මන්තං සංගාමජිං තං දාරකං නෙව ඔලොකෙන්තං නපි ආලපන්තං. දිස්වාන'ස්සා එතදහොසිඃ 'න චායං සමණො පුත්තෙනපි අත්ථිකො'ති. තතො පටිපත්තිත්වා දාරකං ආදාය පක්කාමි. අද්දසා බො භගවා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන ආයස්මතො සංගාමජිස්ස පුරාණදුතියිකාය එවරූපං විප්පකාරං. අථ බො භගවා එතමත්ථං විදිත්වා තාලං වෙලායං ඉමං උදානං උදානෙසිඃ

**(ආ)** පහත සඳහන් පද්‍ය සිංහලට නගන්න.

නිබ්බානං ගොතමී යාති සතෙහි සම පඤ්චහි,  
නදීසතෙහිව සහ ගංගා පඤ්චහි සාගරං.

රථිකාය වජන්තිං තං දිස්වා සද්ධා උපාසිකා,  
සරා නික්ඛම්ම පාදෙසු නිපච්ච ඉදමබ්‍රවුං.

"පසීදස්සු මහාභොගෙ උනාථායො විහාය නො,  
තයා න යුත්තං නිබ්බාතුං" ඉච්චට්ටං විලපිංසු තා. (ලකුණු 6+6 = 12 යි)

**2. (අ)** පාලියට නගන්න.

i. බල්ලා තණකොළ ගොමුවෙහි නිදයි.  
ii. ඔහු උදෙන්ම නැගිට වෙළෙඳාම පිණිස නිවසින් පිටවෙයි.  
iii. මම හෙට ඉන්දියාවට ගොස් වස් වසන්නෙමි. (ලකුණු 2x3 = 6යි)

**(ආ)** ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.

සෙතව්‍යවාසිනො හි චූලකාලො මජ්ඣිමකාලො මහාකාලොති තයො භාතරො කුටුම්බිකා. තෙසු ජෙට්ඨකනිට්ඨා දිසාසු විචරිත්වා සකටෙහි භණ්ඩං ආහරන්ති. මජ්ඣිමකාලො ආභතං වික්කිණාති. අථෙකස්මිං සමයෙ තෙ උභොපි භාතරො පඤ්චහි සකටසතෙහි නානා භණ්ඩං ගහෙත්වා සාවත්ථියං ගන්ත්වා සාවත්ථියා ච ජෙතවනස්ස ච අන්තරෙ සකටානි මොචයිංසු. තෙසු මහාකාලො සායණ්හසමයං මාලාගන්ධාදිහත්ථෙ සාවත්ථිවාසිනො අරියසාවකෙ ධම්මසවණත්ථාය ගච්ඡන්තෙ දිස්වා "කුහිං ඉමෙ ගච්ඡන්තී"ති පුච්ඡිත්වා තමත්ථං සුත්වා 'අහම්පි ගමිස්සාමී'ති චින්තෙත්වා කනිට්ඨකං ආමන්තෙත්වා, "

තාත සකටෙසු අප්පමත්තො හොහි. අහං ධම්මං සොතුං ගච්ඡාමී'ති වත්වා තථාගතං වන්දිත්වා පරිසපරියන්තෙ නිසීදි.

i. සොහොයුරන් තිදෙනාගේ නම් ලියන්න.
ii. ඔවුන් වෙළඳාම සඳහා ගියේ කුමන ප්‍රදේශයට ද?
iii. මහාකාල දුටුවේ කුමන දසුනක් ද?
iv. විචරිත්වා, සොතුං, තමත්ථං යන පදවලට සිංහල අර්ථ දෙන්න. (ලකුණු 1+1+1+3 = 6යි)

## 11 කොටස

**3. (අ)** කාරක හඳුන්වන බාලාවතාර ගාථාව ලියන්න.

**(ආ)** ඝෝෂාක්ෂර හඳුන්වන බාලාවතාර පාඨය ලියන්න.

**(ඉ)** පහත සඳහන් පද විසන්ධි කර සන්ධි වර්ගය ලියන්න.

i. ඡායාව ii. තමත්ථං iii. සාධූති iv. අත්තදත්තං v. සඤ්ජාතො vi. මාතුපට්ඨානං

(ලකුණු 2+4+6= 12යි)

**4. (අ) ඔකාසෙ සත්තමී** යන සූත්‍රයේ අර්ථ ලියා නිදසුනක් සපයන්න.

**(ආ)** පඤ්චමී ආඛ්‍යාතය හඳුන්වන බාලාවතාර පාඨය හා එහි ප්‍රත්‍යය මාලාව ලියා දක්වන්න.

**(ඉ)** පහත දැක්වෙන ක්‍රියා පදයන්හි ආඛ්‍යාත විභක්තිය නම් කරන්න.

i. ධාව ii. රක්ඛෙය්‍යුං iii. පචො iv. අගච්ඡො v. වන්දති vi. මොචයිංසු

(ලකුණු 2+4+6= 12යි)

**5. (අ)** පහත දැක්වෙන වචන පාලියෙන් ලියන්න.

i. හාත්පස ii. යට

**(ආ)** පහත දැක්වෙන වාක්‍ය යුගල **තුමන්ත ක්‍රියා** හෝ **පූර්ව ක්‍රියා** යොදමින් සම්බන්ධ කර තනි වාක්‍ය සේ නැවත ලියන්න.

i. පිතා නගරං ගච්ඡති. සො භණ්ඩානි කිණාති.
ii. භික්ඛු පණ්ණරසියං උපොසථාගාරං ගච්ඡති. සො තත්ථ විනයං වාචෙති.
iii. කම්මකාරො කොලම්බනගරං ගච්ඡති. සො කම්මකාරදිවසං සමනුස්සරති.
iv. දාරිකා පුප්ඵානි ඔචිනාති. සා විහාරං ගච්ඡති.

**(ඉ)** පහත සඳහන් මාතෘකාවකට අනුව වාක්‍ය හයක් ලියන්න.

i. වස්සාන කාලං ii. ලංකාදීපං iii. මහින්දාගමනං

(ලකුණු 2+4+6= 12යි)

**6. (අ)** ආඛ්‍යාත විභක්ති ගණන කීයක්දැයි ලියා ඒවා නම් කරන්න.

**(ආ) මනුස්ස** හා **ඵල** ශබ්දවල **තතියා හා සත්තමී විභක්ති** ඒකවචන බහුවචන රූප ලියා දක්වන්න.

**(ඉ)** උපසර්ග පද 06ක් ලියා ඊට ගැළපෙන සේ වචන 06ක් ද ලියන්න.

(ලකුණු 2+4+6= 12යි)

**7. (අ)** බුද්ධඝෝෂ හිමියන් ලියූ අට්ඨකථා 04ක් නම් කරන්න.

**(ආ)** අට්ඨකථා ලියූ තෙරුන් වහන්සේලා 04ක් නම් කරන්න.

**(ඉ)** ඔබ කැමති උදාන පාලියේ නිර්දිෂ්ට කතාවක් කෙටියෙන් ලියා දක්වන්න.

(ලකුණු 2+4+6= 12යි)

8. **(අ)** සූත්‍ර, විනය, අභිධර්ම සඳහා යෙදෙන සමාන වචන පිළිවෙළින් ලියන්න.

**(ආ)** විනය පිටකයේ ග්‍රන්ථ සංඛ්‍යාව දක්වා ඒවා ලියන්න.

**(ඉ)** දිඹුලාගල කාශ්‍යප තෙරුන් පාලි භාෂා සාහිත්‍ය වෙනුවෙන් කළ සේවය අර්ථවත් වාක්‍ය 06කින් ලියන්න.

(ලකුණු 2+4+6= 12යි)

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

## පාලි භාෂාව 1

## ආදර්ශ ප්‍රශ්න පත්‍ර 01

කාලය පැයයි.

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 1 බැගින් 40කි.**
- **අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.**
- **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) යොදන්න.**

**01.** පාලි භාෂාවේ ධාතුගණ ගණන කීයද?

1. 5කි. 2. 6කි. 3. 7කි. 4. 8කි.

**02.** 'ගහාදි ගණයට' අයත් විකරණ ප්‍රත්‍යය වන්නේ,

1. ඕ, යිර 2. ණෙ, ණය 3. ණා, උණා 4. ප්ප, ණ්හ

**03.** ආඛ්‍යාත පද සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශයක් වන්නේ,

1. කාලත්‍රයකි 2. වචනත්‍රයකි 3. පුරුෂත්‍රයකි 4. කාරකත්‍රයකි

**04.** ආඛ්‍යාත පද විභක්ති ගණන සංඛ්‍යාත්මකව,

1. 07කි. 2. 8කි 3. 09කි 4 . 10කි

**05.** 'කාරක' අතරට නොගැනෙන වර්ණය වන්නේ,

1. අතීත කාරක 2. කර්තෘ කාරක 3. කර්ම කාරක 4. භාව කාරක

**06.** වත්තමාන ආඛ්‍යාත විභක්තියෙන් දෙන සරල අදහස වන්නේ,

1. අණ කිරීම හා ආශිර්වාද කිරීම
2. අප්‍රත්‍යක්ෂ වූ අතීතය
3. සිදු නොවූ අතීත සිද්ධි
4. පවත්නා කාලය

**07.** '**අනාගත කාලය**' හඟවන ආඛ්‍යාත විභක්තිය වන්නේ,

1. අජ්ජතනී 2. භවිස්සන්ති 3. කාලාතිපත්ති 4. පරොක්ඛා

**08.** අතීත කාලය හා සබැඳෙන ආඛ්‍යාත විභක්ති දෙකක් ඇතුළත් වර්ණය වන්නේ,

1. වත්තමාන, භවිස්සන්ති
2. කාලාතිපත්ති, පරොක්ඛා
3. අජ්ජතනී, පරොක්ඛා
4. කාලාතිපත්ති, වත්තමාන

**09.** වත්තමාන කාල විභක්තිය සඳහා පඨම පුරිස ප්‍රත්‍ය මාලාව නිවැරදිව දැක්වෙන වර්ණය වන්නේ,

1. ති, අන්ති 2. තු, අන්තු 3. එය්‍ය, එය්‍යුං 4. ආ, ඌ

**10.** "'<u>වන්දෙ</u>' තං බොධිපාදපං" මෙම වාක්‍යයේ ඉරි ඇඳි පදයේ ආඛ්‍යාත විභක්තිය වන්නේ,

1. වත්තමාන 2. සත්තමී 3. පරොක්ඛා 4. අජ්ජතනී

**11.** ක්‍රියාපද සාධනයේ දී ක්‍රියාපදයේ මුලට '**අ**'කාරයක් විකල්පයෙන් ආගම වන්නේ,

1. කාලාතිපත්ති, වත්තමාන, පරොක්ඛා 2. කාලාතිපත්ති, හවිස්සන්ති, අජ්ජතනී

3. පරොක්ඛා, පඤ්චමී, හවිස්සන්ති 4. අජ්ජතනී, හීයත්තනී, කාලාතිපත්ති විභක්තිවලට ය.

**12.** සිංහල වාක්‍ය ක්‍රමයේ සඳහන් ශ්‍රැති සූචනාර්ථය සහිත වාක්‍යයක් පාලියට නැගීමේ දී එහි ආඛ්‍යාතය තැබිය හැකි සුදුසුම ආඛ්‍යාතය වන්නේ,

1. අජ්ජතනී 2. කාලාතිපත්ති 3. පරොක්ඛා 4. හවිස්සන්ති

**13.** 'ස්සති, ස්සන්ති' ප්‍රත්‍ය සහිත ආඛ්‍යාත විභක්තිය වන්නේ,

1. වත්තමාන 2. අජ්ජතනී 3. හවිස්සන්ති 4. පඤ්චමී

**14.** ක්‍රියා විශේෂණයක් රහිත වර්ණය වන්නේ,

1. සක්කච්චං, සුඛෙන, සනිකං 2. සීඝෙන, සාධුකං, නිබන්ධං

3. සීඝෙන, සක්කච්චං, සුඛං 4. ධිතිමා, දක්ඛො, සනිකං

**15.** 'එක' ශබ්දය සම්බන්ධ වැරදි අදහසක් සහිත වර්ණය වන්නේ,

1. සංඛ්‍යාවාචී ශබ්දයකි 2. ඒකවචනයේ පමණක් වරනැගේ

3. ඉත්ථිලිංග ශබ්දයක් නැත 3. සර්වනාම පදයක් ලෙසින් ද යෙදිය හැකිය

**16.** අක්ෂර වින්‍යාසය සාවද්‍ය ලෙසින් යෙදී ඇති පද සහිත වර්ණය වන්නේ,

1. කිත්තිසද්දො, භූතපුබ්බං, සාවත්ථියං 2. දිවාතරං, උට්ඨාසි, උදාහු
3. කින්නු, නිවාඨා, දක්කා 4. අසන්තං, අනලසා, කල්‍යාණො

**17.** 'තුමන්ත ක්‍රියා' ඇතුළත් නොවන වර්ණය වන්නේ,

1. පචිතුං, ඛාදිතුං, ජෙතුං 2. වන්දිතුං, ගන්ත්වාන, ඨාතුං
3. රක්ඛිතුං, හසිතුං, හොතුං 4. කත්තුං, ඤාතුං, නෙතුං

**18.** තුමත්ත ක්‍රියා ප්‍රත්‍යය නිවැරදිව දැක්වෙන වර්ණය වන්නේ,

1. තුං, තවෙ 2. ත්වා, ත්වාන 3. තවෙ, ත්වාන 4. තුං, ය

**19.** පූර්ව ක්‍රියා ප්‍රත්‍යය පමණක් ඇතුළත් වර්ණය වන්නේ,

1. තුං, තවෙ, ත්වා, ය 2. ත්වා, තුවාන, තුන, ය

3. තවෙ, තුං, ය, ත්වා 4. ය, තුන, තුං, ත්වා

**20.** පූර්ව ක්‍රියාවක් නොමැති වාක්‍යයක් සහිත වර්ණය වන්නේ,

1. මාතා සනිකං භත්තං පචති 2. පිතා ඛෙත්තං ගන්ත්වා කම්මං කරොති

3. දාරකො පාඨං පඨිත්වා සයති 4. ආචරියො අක්ඛරානි උග්ගණ්හිත්වා පබොධෙති

**21.** පූර්ව ක්‍රියාවක් නොමැති පද ඇතුළත් වර්ණය වන්නේ,

1. ගන්ත්වා, රක්ඛිත්වා, ධාවිත්වා 2. යසිත්වා, නිසීදිත්වා, ඛාදිත්වා, ගන්ත්වාන

3. චින්තෙත්වා, ඤත්වා, ගහෙත්වා 4. උට්ඨාය, වන්දමාන, රක්ඛිතුං

**22.** 'ආමන්ත්‍රණවාචී' නිපාත රහිත වර්ණය වන්නේ,

1. ආවුසො, අම්භො, හරෙ 2. ජෙ, හම්භො, අරෙ

3. රෙ, වෙ, කිර 4. ජෙ, රෙ, හරෙ, අරෙ

23. 'ඒකාන්තයෙන්' යන අදහස නොදෙන පදය ඇතුළත් වර්ණය වන්නේ,

1. හන්ද 2. නූන 3. හවෙ 4. අචිරං

24. 'සමග' යන අදහස නොමැති වර්ණය වන්නේ,

1. සමං 2. සහ 3. විනා 4. සද්ධිං

25. උපසර්ග පදයක් රහිත වර්ණය වන්නේ,

1. ප, පරා, නි, නී 2. උ, දු, අව, අනු 3. පති, සු, ආ, අපි 4. න, නා, අප, උප

26. උපසර්ග පදයන්ගේ ක්‍රියාකාරීත්වය හා සම්බන්ධ වැරදි අදහසක් වන්නේ,

1. ධාතුවේ අර්ථයට බාධා කරයි 2. ධාතුවේ අර්ථයට අනුකූල වෙයි

3. ධාතුවේ අර්ථය විසිතුරු කරයි 4. ඉහත කිසිවක් සිදු නොවේ.

27. උපසර්ග රහිත පද ඇතුළත් වර්ණය වන්නේ,

1. පක්කමති, නික්ඛමති, පටික්කමති 2. ඔනද්ධා, ඔකාස, පච්චෙකං

3. පළිබොධො, පළිබුජ්ඣති, පිදහති, 4. පබුජ්ඣති, ධොවති, පටිලභති

28. පාලි සන්ධි ප්‍රභේද ගණන නිවැරදිව දැක්වෙන වර්ණය වන්නේ,

1. 2කි 2. 3කි 3. 4කි 4. 5කි

29. පෙර පදයේ අග හා පසු පදයේ මුල ස්වරයක් ඇත්නම් සිදුවන සන්ධිය වන්නේ,

1. ස්වර සන්ධිය 2. ව්‍යඤ්ජන සන්ධිය 3. නිග්ගහීත සන්ධිය 4. වොමිස්සක සන්ධිය

30. සන්ධි කිරීම සම්බන්ධයෙන් ලැබෙන ප්‍රතිඵල අතරට නොගැනෙනුයේ,

1. භාෂාවේ ව්‍යක්ත බව ඇතිවීම 2. සුඛෝච්චාරණය

3. පද කෙටි නොවී දීර්ඝ වීම 4. ඡන්දස් ශාස්ත්‍රයේ දී විරිත් ආරක්ෂා වීම

31. ස්වර සන්ධිය සම්බන්ධයෙන් ඇති බාලාවතාර සූත්‍රයක් නොවන වර්ණය වන්නේ,

1. දීඝං 2. වා පරො අසරූපා 3. පුබ්බො ච 4. වග්ගන්තං වා වග්ගෙ

32. 'අසවර්ණාදේශය' සම්බන්ධයෙන් වූ බාලාවතාර සූත්‍රය වන්නේ,

1. වා පරො අසරූපා 2. ක්වචාසවණ්ණං ලුත්තෙ

3. දොධස්ස ච 4. ඉවණ්ණො යං නවා

33. ස්වර සන්ධියේ ව්‍යඤ්ජනාගමයට ඇතුළත් නොවන අක්ෂරයක් ඇති වර්ණය වන්නේ,

1. ය 2. ව 3. ඩ 4. ද

34. ව්‍යඤ්ජන සන්ධියට ඇතුළත් බාලාවතාර සූත්‍රයක් නොවන වර්ණය වන්නේ,

1. ලොපං ච තත්‍රාකාරො 2. ඔ අවස්සෙ

3. රස්සං 4. වග්ගෙ ඝොසා'ඝොසානං තතියපඨමා

35. 'සයෙච, මදාසරෙ, එහෙඤ්ඤං' යන සූත්‍ර ඇතුළත් සන්ධිය වන්නේ,

1. ස්වර සන්ධිය 2. ව්‍යඤ්ජන සන්ධිය 3. නිග්ගහීත සන්ධිය 4. වොමිස්සක සන්ධිය

**36.** 'සල්ලෙබ' යන සන්ධි පදය විසන්ධි වන නිවැරදි ක්‍රමය වන්නේ,

1. සල්+ලෙබ　　2. සං+ලෙබ　　3. සංලෙ+බ　　4. ස+අල්ලෙබ

**37.** සමාස පද ප්‍රභේද ගණනින්,

1. 4කි　　2. 5කි　　3. 6කි　　4. 7කි

**38.** සමාස ප්‍රභේදයක් නොවන්නේ,

1. කම්මධාරය සමාසය　　2. වොමිස්සක සමාසය

3. දිගු සමාසය　　4. තප්පුරිස සමාසය

**39.** සමාස වීමේ දී පරපදයේ ලිංගය තබන සමාස ප්‍රභේද ඇතුළත් වර්ණය වන්නේ,

1. කම්මධාරය, තප්පුරිස, ද්වන්ද　　2. බහුබ්බීහි, කම්මධාරය, අව්‍යයීභාව

3. අව්‍යයීභාව, තප්පුරිස, දිගු　　4. බහුබ්බීහි, ද්වන්ධ, දිගු

**40.** කම්මධාරය සමාසයට ඇතුළත් ප්‍රභේද ගණන නිවැරදිව දැක්වෙන වර්ණය වන්නේ,

1. 7කි　　2. 8කි　　3. 9කි　　4. 10කි

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

## පාලි භාෂාව 2

## ආදර්ශ ප්‍රශ්න පත්‍ර - 07

කාලය පැය තුනයි.

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.

**1 කොටසටත් 11 කොටසින් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**

## 1 කොටස

**1. (අ)** පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

අථ ඛො භගවා ආයස්මන්තං නන්දං බාහාය ගහෙත්වා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව ජෙතවනෙ අන්තරහිතො දෙවෙසු තාවතිංසෙසු පාතුරහොසි. තෙන ඛො පන සමයෙන පඤ්චමත්තානි අච්ඡරාසතානි සක්කස්ස දෙවානමින්දස්ස උපට්ඨානං ආගතානි හොන්ති කකුටපාදානි. අථ ඛො භගවා ආයස්මන්තං නන්දං ආමන්තෙසිඃ 'පස්සසි නො ත්වං නන්ද; ඉමානි පඤ්ච අච්ඡරාසතානි කකුටපාදානී?ති. 'එවං භන්තෙ'ති. කිං මඤ්ඤසි නන්ද, කතමා නු ඛො අභිරූපතරා ච දස්සනීයතරා ච පාසාදිකතරා ච, සාකියානී වා ජනපදකල්‍යාණී, ඉමානි වා පඤ්ච අච්ඡරාසනාති කකුටපාදානී?ති.

**(ආ)** පහත සඳහන් පද්‍ය සිංහලට නගන්න.

සුවණ්ණරාසිසංකාසං සරීරං කුරු පාකටං,
කත්වා දෙහං සුදිට්ඨං තෙ සන්තිං ගච්ඡාමි නායක.

ද්වත්තිංසලක්ඛණූපෙතං සුප්පභාලංකතං තනුං
සඤ්ඣාඝනාව බාලක්කං මාතුච්ඡං දස්සයී ජිනො.

ඵුල්ලාරවින්දසංකාසෙ තරුණාදිච්චසප්පභෙ,
චක්කංකිතෙ පාදතලෙ තතො සා සිරසා පති. (ලකුණු 6+6 = 12 යි)

**2. (අ)** පාලියට නගන්න. (ලකුණු 2x3 = 6යි)

i. මම සැමදා සුවෙන් ජීවත් වෙමි.

ii. ආනන්ද තෙරුන් වහන්සේ සවස් යාමයේ බුදුන්ට උපකාර කරයි.

iii. රජවරු ඇමතිවරුන් කැටිව යුද්ධයට ගොස් ආපසු එති.

**(ආ)** ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.

අද්දසං ඛ්වාහං; රාජකුමාර, දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන පඤ්චවග්ගියෙ භික්ඛු බාරාණසියං විහරන්තෙ ඉසිපතනෙ මිගදායෙ. අථ ඛ්වාහං, රාජකුමාර, උරුවෙලායං යථාභිරන්තං විහරිත්වා යෙන බාරාණසී තෙන චාරිකං පක්කමිං. අද්දසා ඛො මං; රාජකුමාර, උපකො ආජීවකො අන්තරා ච ගයං අන්තරා ච බොධිං අද්ධානමග්ගපටිප්පන්නං. දිස්වාන මං එතදවොච. විප්පසන්නානි ඛො තෙ; ආවුසො. ඉන්ද්‍රියානි, පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො. කංසි ත්වං, ආවුසො, උද්දිස්ස පබ්බජිතො? කො වා තෙ සත්ථා? කස්ස වා ත්වං ධම්මං රොචෙසීති? එවං වුත්තෙ; අහං; රාජකුමාර, උපකං ආජීවකං ගාථාහි අජ්ඣභාසිං.

i. ඡේදයට අනුව සංවාදය ඇති වන්නේ කා සමග ද?

ii. බුදුරදුන්ට හමු වූ උපක ආජීවක බුදුරදුන් ගැන කියන්නේ කුමක්ද?

iii. පඤ්චවග්ගිය කුමාරවරුන් විසූයේ කොහිද?

iv. මෙහි ඇති නිපාත පද 03ක් සොයා ලියන්න. (ලකුණු 1+1+1+3 = 6යි)

## 11 කොටස

**3. (අ)** පාලි භාෂාවේ අඝෝෂාක්ෂර හඳුන්වන බාලාවතාර සූත්‍ර පාඨය ලියන්න.

**(ආ)** පාලි භාෂාවේ සන්ධි කාර්යය නම් කර ලෝපය, ආගමය නිදසුන් 2බැගින් දෙමින් පහදන්න.

**(ඉ)** සමාස කිරීමෙන් ලද හැකි ප්‍රයෝජන 4ක් නම් කොට ද්වන්ද සමාසය පැහැදිලි කරන්න.

(ලකුණු 2+4+6= 12යි)

**4. (අ)** නිපාත පද 10ත් ලියන්න.

**(ආ)** සංඛ්‍යා තද්ධිතයේ ප්‍රත්‍ය 04ක් දක්වා ඊට අනුරූප වන තද්ධිත පද 04ක් ද ලියන්න.

**(ඉ)** පහත වගුව සම්පූර්ණ කරන්න. (ලකුණු 2+4+6= 12යි)

| ශබ්දය | පඨමා විභක්තිය | | චතුත්ථි විභක්තිය | | පඤ්චමී විභක්තිය | |
|---|---|---|---|---|---|---|
| | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන |
| නර | ................. | නරා | නරස්ස | ................. | නරම්හා | ................. |
| ලතා | ලතා | ................. | ................. | ලතානං | ලතාය | ................. |
| භික්ඛු | භික්ඛු | ................. | ................. | භික්ඛූනං | ................. | භික්ඛූහි |

**5. (අ)** 'සංඛ්‍යා පුබ්බො දිගු' යන සූත්‍රයෙන් කියැවෙන අදහස කුමක්ද?

**(ආ)** පහත සඳහන් විග්‍රහවාචී පද සමාස කර දක්වන්න.

1. පධානං වචනං
2. කුච්ඡිතො දිට්ඨී
3. සරණං ගතො
4. කඨිනස්ස දුස්සං
5. ඩංසා ච මකසා ච

**(ඉ)** පහත සඳහන් පද කවර තද්ධිතයකට අයත් දැයි නම් කරන්න.

1. කච්චාන
2. ධම්මික
3. පාපිට්ඨ
4. ඡට්ඨ
5. ආරොග්‍ය (ලකුණු 2+4+6= 12යි)

**6. (අ)** පහත දැක්වෙන පද පාලියෙන් ලියන්න.

1. නිතර     2. දැන්

**(ආ)** පහත දැක්වෙන වාක්‍ය සඳහා ඔබ කැමති පූර්ව ක්‍රියා සම්බන්ධ කොට නැවත වාක්‍ය ලියන්න.

1. සීහො මිගෙ මාරෙති

2. අහං ඔදනං පචාමි

**(ඉ)** පහත දැක්වෙන මාතෘකාවකට අනුව වාක්‍ය 06කට නොඅඩු රචනාවක් ලියන්න.

1. කොලම්බ නගරං
2. මම මිත්තො
3. මහාවංසං (ලකුණු 2+4+6= 12යි)

**7. (අ)** කාරක ප්‍රභේද ලියා දක්වන්න.

**(ආ)** පහත දැක්වෙන පදයන්හි උපසර්ග පද වෙන්කර දක්වන්න.

1. උදක 2. පරාජිතො 3. සුගන්ධො 4. නිප්ඵලං

**(ඉ)** පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට සුදුසු ක්‍රියා පද වරහනෙන් තෝරා යොදා නැවත ලියන්න.

(ආදියන්ති/ වුච්චන්ති/ උපනිපජ්ජෙය්‍යං/ අධිවාසෙසි/ නිසීදිංසු/ විහරති/ වන්දථ/ වදෙමසෙ)

1. නිපන්නං වා ............................
2. ජිනං ................... ගොතමං
3. භගවන්තං අභිවාදෙත්වා එකමන්තං .........................
4. තෙ නෙව මහා රාජානං ...........................
5. ..................... භගවා තුණ්හීභාවෙන.
6. භගවා රාජගහෙ ............... ගිජ්ඣකූටෙ පබ්බතෙ.
7. අමනුස්සා මහාරාජානං අවරුද්ධා නාම ........................ (ලකුණු 2+4+6= 12යි)

**8. (අ)** ඛුද්දක නිකායට අයත් පොත් 4ක් නම් කරන්න.

**(ආ)** අභිධර්ම පිටකයේ පොත් 07 නම් කරන්න.

**(ඉ)** අපදාන කොටස් කීයකට බෙදේ ද? ඒවා නම්කරන්න. (ලකුණු 2+4+6= 12යි)

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

## පාලි භාෂාව 1
## ආදර්ශ ප්‍රශ්න පත්‍ර 08

කාලය පැයයි.

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.

- ❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 1 බැගින් 40කි.
- ❖ අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
- ❖ ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) යොදන්න.

**01.** කම්මධාරය සමාසය සඳහා පමණක් නිදසුන් ඇති වර්ණය වන්නේ,

1. මහාවීරො, ධම්මසඞ්ඛා, ගුණධනං, අසුරො
2. පාවචනං, සුගන්ධො, තිලොකං, චතුද්දිසං
3. අනිච්චසඤ්ඤා, කුදිට්ඨි, ජිනචරිතං, වනවාසො
4. සාරිපුත්තත්ථෙරො, විකාලභොජනං, සුගන්ධො, අසුරො

**02.** සිංහලයෙහි ඇති දකාරාර්ථ සමාසය පාලියෙන් දැක්වෙන්නේ,

1. කම්මධාරය සමාසය
2. අව්‍යයීභාව සමාසය
3. ද්වන්ද සමාසය
4. දිගු සමාසය

**03.** 'ධම්මදෙසනා' යන සමාස පදයෙහි නිවැරදි විග්‍රහ වාක්‍ය වන්නේ,

1. ධම්මං දේසනා
2. ධම්මස්ස දෙසනා
3. ධම්මං ච දෙසනං ච
4. ධම්ම දෙසනා යං සො

**04.** 'නිරයො' යනු,

1. කම්මධාරය සමාස පදයකි
2. බහුබ්බීහි සමාස පදයකි
3. අව්‍යයීභාව සමාස පදයකි
4. දිගු සමාස පදයකි

**05.** කම්මධාරය, දිගු, බහුබ්බීහි, ද්වන්ද සමාස පද පිළිවෙළින් යෙදී ඇති වර්ණය වන්නේ,

1. තිලොකං, මාතාපිතරො, මහාපුරිසො, පහූතජිව්හො
2. මාතාපිතරො, තිලොකං, මහාපුරිසො, පහූතජිව්හො
3. මහාපුරිසො, පහූතජිව්හො, මාතාපිතරො, තිලොකං
4. මහාපුරිසො, තිලොකං, පහූතජිව්හො, මාතාපිතරො

**06.** තද්ධිත පද නිර්මාණය වීමේ දී සිදු නොවන කරුණක් වන්නේ,

1. නාම පදයට පසුව තද්ධිත ප්‍රත්‍යය යෙදීම
2. නාම පදයේ විභක්ති ප්‍රත්‍යය ලොප් කිරීම
3. සංයුක්ත නොවූ පදයන්හි ආදි ස්වරය ලොප් කිරීම
4. කිසිම විටෙක සන්ධි කාර්යයක් සිදු නොවීම

**07.** සාමඤ්ඤ තද්ධිතයේ ප්‍රභේද ගණන වන්නේ,

1. 2 කි 2. 3කි 3. 4කි 4. 5කි

**08.** අර්ථ අනුව තද්ධිත ගණන නිවැරදිව දැක්වෙන වර්ණය වන්නේ,

1. 4කි 2. 5කි 3. 6කි 4. 7කි

**09.** 'පුත්‍රාර්ථය, ගෝත්‍රාර්ථය' දැක්වෙන තද්ධිත ප්‍රභේදය වන්නේ,

1. අපච්චත්ථ තද්ධිතය 2. අනෙකත්ථ තද්ධිතය
3. භාව තද්ධිතය 4. අව්‍යය තද්ධිතය

**10.** 'පාපතර, පාපිස්සික, පාපිට්ඨ, පාපතම' ආදි තද්ධිත පද ඇතුළත් වන්නේ,

1. අනෙකත්ථ තද්ධිතයට ය. 2. භාව තද්ධිතයට ය.
3. අත්ථ්‍යත්ථ තද්ධිතයට ය. 4. සංඛ්‍යා තද්ධිතයට ය.

**11.** සංඛ්‍යා තද්ධිතයට නිදසුන් රහිත වර්ණය වන්නේ,

1. දුතිය, තතිය, චතුත්ථ 2. පඤ්චම, දසම, අට්ඨම
3. ඡට්ඨ, සත්තම, නවම 4. මාහිස, වෙනයික, නවම, දසම

**12.** කිතක පද සකස් වන්නේ,

1. නාමයකට කිතක ප්‍රත්‍යය එක් කිරීමෙනි
2. ධාතුවකට කිතක ප්‍රත්‍යය එක් කිරීමෙනි
3. උපසර්ගයකට කිතක ප්‍රත්‍යය එක් කිරීමෙනි
4. නාම විශේෂණයකට කිතක ප්‍රත්‍යය එක් කිරීමෙනි

**13.** වර්තමාන කිතක ප්‍රත්‍යය සහිත වර්ණය වන්නේ,

1. මාන, අන්ත 2. තුන, ත්වාන 3. මිම, ය්හ 4. තබ්බ, අනීය

**14.** අතීත කෘදන්ත පමණක් ඇතුළත් වර්ණය වන්නේ,

1. දිනකර, ධම්මධර, නිසින්න 2. යාචන, දාන, පුණ්ණ
3. දාතු, පාලන, ආරද්ධ 4. භුත්ත, බද්ධ, පත්ත

**15.** පාලි අටුවා වැඩි ප්‍රමාණයක් රචනා කොට ඇති අට්ඨකථාචාර්යයන් වහන්සේ වන්නේ,

1. මහානාම තෙරුන් 2. ධම්මපාල තෙරුන්
3. බුද්ධඝෝෂ තෙරුන් 4. උපසේන තෙරුන්

**16.** බුද්ධඝෝෂ හිමියන්ගේ ජීවන තොරතුරු දැක්වෙන සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ,

1. මහාවංසය, බුද්ධඝෝසුප්පත්ති 2. ධම්මපදය, ජාතක පාලිය
3. ථූපවංසය, ජිනචරිතය 4. උදාන, අපදාන

**17.** බුද්ධඝෝෂ හිමියන්ගේ වංශය වශයෙන් පිළිගැනෙන්නේ,

1. ක්ෂත්‍රිය වංශය 2. බ්‍රාහ්මණ වංශය 3. වෛශ්‍ය වංශය 4. ක්ෂුද්‍ර වංශය

**18.** බුද්ධඝෝෂ එනමින් ප්‍රසිද්ධ වූයේ,

1. බුදුරදුන්ට සමාන රූප සම්පත්තියෙන් යුතු නිසා 2. බුදුන්ගේ වංශයේ වූ නිසා
3. බුදුන්ගේ කටහඬට සමාන කටහඬ ඇති නිසා 4. බුදුසසුනේ පැවිදි වූ නිසා

19. බුද්ධඝෝෂ හිමියන් දඹදිව විසූ කාලයේ ලියූ කෘතියක් වනුයේ

1. මහාවංසය 2. දීපවංසය 3. ජිනචරිතය 4. ඤාණොදය

20. බුද්ධඝෝෂ හිමියන්ගේ ගුරුවරයා වන්නේ,

1. බුද්ධදත්ත හිමියන් 2. රේවත හිමියන්
3. මහානාම හිමියන් 4. ධම්මපාල හිමියන්

21. බුද්ධඝෝෂ හිමියන් මෙහි වැඩම වීමෙන් පසු ලියූ පළමු කෘතිය වන්නේ,

1. විසුද්ධිමග්ගය 2. ධම්මපදට්ඨකථා 3. සමන්තපාසාදිකා 4. සුමංගලවිලාසිනී

22. බුද්ධඝෝෂ හිමියන් මෙහි වැඩම කළ සමයේ මෙහි සිටි රජතුමා වන්නේ,

1. ධාතුසේන රජු ය 2. මහානාම රජු ය 3. දුටුගැමුණු රජු ය 4. මහසෙන් රජු ය

23. විනය සඳහා බුද්ධඝෝෂ හිමියන් කළ අටුවාව වන්නේ,

1. සුමංගල විලාසිනී 2. විසුද්ධි මග්ගය 3. සමන්තපාසාදිකා 4. මනොරථපූරණී

24. ප්‍රාතිමෝක්ෂයේ අටුවාව වන්නේ,

1. සමන්තපාසාදිකා 2. කංඛාවිතරණී 3. පපඤ්චසූදනී 4. සුමංගලවිලාසිනී

25. 'සාරත්ථප්පකාසිනී' නම් වූ සංයුත්ත නිකායෙහි අටුවාව බණවර,

1. 78කින් 2. 82කින් 3. 85කින් 4. 72කින් සමන්විත ය.

26. 'සුමංගල විලාසිනී' දීඝනිකායට්ඨකථාව ලිවීම සඳහා ආරාධනා කළේ,

1. බුද්ධමිත්ත තෙරුන් ය 2. ජෝතිපාල තෙරුන් ය
3. සෝණ තෙරුන් ය 4. දාඨානාග තෙරුන් ය.

27. අභිධම්ම පිටකයට අයත් නොවන කෘතියක් ඇති වර්ණය වන්නේ,

1. ධාතුකථා 2. පුග්ගලපඤ්ඤත්ති 3. යමක 4. චරියාපිටක

28. මහා විහාරය සතුව තිබූ 'සීහළ අට්ඨකථා' පිළිබඳ වැරදි ලෙසින් දැක්වෙන වර්ණය වන්නේ,

1. මහාට්ඨකථා, මහාපච්චරියට්ඨකථා 2. කුරුන්දට්ඨකථා, ආගමට්ඨකථා
3. සුත්තන්තට්ඨකථා, පුබ්බට්ඨකථා 4. ජාතකට්ඨකථා, ධම්මපදට්ඨකථා

29. 'සංඝපරිනායක' ලෙසින් පොළොන්නරු යුගයේ දී ජනාදරයට පත් වූ තෙරුන් වහන්සේ වන්නේ,

1. බුද්ධඝෝෂ හිමියන් ය 2. මහානාම හිමියන් ය
3. කාශ්‍යප හිමියන් ය 4. බුද්ධදත්ත හිමියන් ය

30. 'බාලාවබෝධන' නම් කෘතියෙහි රචකයා වන්නේ,

1. බුද්ධදත්ත තෙරුන් 2. කාශ්‍යප තෙරුන්
3. මහානාම තෙරුන් 4. උපසේන තෙරුන්

31. පොල්වත්තේ බුද්ධදත්ත හිමියන්ගේ ජාත ග්‍රාමය පිහිටියේ,

1. නැගෙනහිර පළාතේ ය 2. ඌව පළාතේ ය
3. දකුණු පළාතේ ය 4. බස්නාහිර පළාතේ ය

32. පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් උපත ලැබූ වර්ෂය වන්නේ,

1. 1887 2. 1888 3. 1889 4. 1987

**33.** තෝමස් විලියම්ස් රීස් ඩේවිඩ්ස් මැතිතුමාගේ ජාත දේශය වන්නේ,

1. ඇමෙරිකාව ය 2. එංගලන්තය ය 3. ඕස්ට්‍රේලියාව ය 4. ඉතාලිය ය

**34.** ත්‍රිපිටකය නිවැරදිව දැක්වෙන වර්ණය වන්නේ,

1. බුද්ධ, ධම්ම, සංඝ 2. සූත්‍ර, විනය, අභිධම්ම
3. සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ 4. උදාන, ජාතක, නිද්දෙස

**35.** 'ආණා දේශනා'' යනුවෙන් හැඳින්වූයේ,

1. සූත්‍ර පිටකය යි 2. විනය පිටකය යි 3. අභිධර්ම පිටකයයි 4. ජාතක පාලිය යි

**36.** ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළේ බුද්ධ පරිනිර්වාණයෙන්,

1. වර්ෂ 440ක් ගිය තැනදීය. 2. වර්ෂ 450ක් ගිය තැනදීය.
3. වර්ෂ 400ක් ගිය තැනදීය. 4. වර්ෂ 300ක් ගිය තැනදීය.

**37.** ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළේ,

1. මහාවිහාරයේ දී ය 2. අලුවිහාරේ දී ය 3. දඹුළු විහාරයේ දී ය 4. අභයගිරියේ දී ය

**38.** ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථයක් නොවන්නේ,

1. ජාතක 2. බුද්ධවංස 3. සුත්තනිපාත 4. ධාතුකථා

**39.** උදාන පාළියේ වර්ග ගණන නිවැරදිව ඇති වර්ණය වන්නේ,

1. 6කි 2. 7කි 3. 8කි 4. 9කි

**40.** උදාන පාලියේ මුළු සූත්‍ර ගණන වන්නේ,

1. 81කි 2. 82 කි 3. 83කි 4. 84කි

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

## පාලි භාෂාව 2
## ආදර්ශ ප්‍රශ්න පත්‍ර - 08

කාලය පැය තුනයි.

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.

**1 කොටසටත් 11 කොටසින් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**

## 1 කොටස

**1. (අ)** පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

තෙන ඛො පන සමයෙන රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරෙ සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සප්පිස්ස වා තෙලස්ස වා යාවදත්තං පාතුං දියයති, නො නීහරිතුං. අථ ඛො තස්ස පරිබ්බාජකස්ස එතදහොසි. "රඤ්ඤො ඛො පන පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරෙ සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සප්පිස්ස වා තෙලස්ස වා යාවදත්ථං පාතුං දියයති. නො නීහරිතුං. යන්නූනා'හං රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරං ගන්ත්වා තෙලස්ස යාවදත්ථං පිවිත්වා ඝරං ආගන්ත්වා උග්ගිරිත්වාන දදෙය්‍යං යං ඉමිස්සා විජාතාය භවිස්සතී'ති.

**(ආ)** පහත සඳහන් පද්‍ය සිංහලට නගන්න.

මධුරානි පහට්ඨානි දොසග්ඝානි හිතානි ච,<br>
යෙ තෙ වාක්‍යානි සෙස්සන්ති තෙපි ධඤ්ඤා නරුත්තම.

ධඤ්ඤා'හං තෙ මහාවීර පාදපූජනතප්පරා,<br>
තිණ්ණසංසාරකන්තාරා සුවාක්‍යෙන සිරීමතො."

තතො සා අනුසාසෙත්වා භික්ඛුසංඝම්පි සුබ්බතා,<br>
ඝාහුලානන්දනද්දෙ ච වන්දිත්වා ඉදමබ්‍රවි. (ලකුණු 6+6 = 12 යි)

**2. (අ)** පාලියට නගන්න. (ලකුණු 2x3 = 6යි)

i. උදේම පිබිදෙන්න. බුදුන් පුදන්න.

ii. කුමාරයා කඩුව ගෙන රජතුමාට දුන්නේය.

iii. සිතූ දේ නොමවෙයි. නොසිතූ දෙයක් වෙයි.

**(ආ)** ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.

ඉංඝ මෙ ත්වං ආනන්ද, එතම්හා උදපානා පානීයං ආහරා'ති. එවං, භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා පත්තං ගහෙත්වා යෙන සො උදපානො තෙනුපසංකමි. අථ ඛො සො උදපානො ආයස්මන්තෙ ආනන්දෙ උපසංකමන්තෙ සබ්බං තං තිණඤ්ච භුසඤ්ච මුඛතො ඔවමිත්වා අච්ඡස්ස උදකස්ස අනාවිලස්ස විප්පසන්නස්ස යාව මුඛතො පූරිතො විස්සන්දෙන්තො මඤ්ඤෙ අට්ඨාසි. අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි. අච්ඡරියං වත භො, අබ්භුතං වත භො, තථාගතස්ස මහිද්ධිකා මහානුභාවතා. අයං හි සො උදපානො මයි උපසංකමන්තෙ සබ්බං තං තිණඤ්ච භුසඤ්ච මුඛතො ඔවමිත්වා අච්ඡස්ස උදකස්ස අනාවිලස්ස විප්පසන්නස්ස යාව මුඛතො පූරිතො විස්සන්දෙන්තො මඤ්ඤෙ අට්ඨාසීති. පත්තෙන පානීයං ආදාය යෙන භගවා තෙනුපසංකමි.

i. බුදුරදුන් ආනන්ද හිමියන්ගෙන් ඉල්ලා සිටියේ මොනවාද?

ii. බුදුන්ගේ ඉල්ලීම ඉටු කිරීම පිණිස ආනන්ද තෙරුන් සිදු කළේ කුමක්ද?

iii. බුදුරදුන් ගැන ආනන්ද හිමියන් සිතුයේ මොනවාද?

iv. ඡේදයෙන් පූර්ව ක්‍රියා පද 3ක් සොයා ලියන්න. (ලකුණු 1+1+1+3 = 6යි)

## 11 කොටස

**3. (අ)** කණ්ඨජාක්ෂර හඳුන්වන බාලාවතාර පාඨය ලියා අදාළ අක්ෂර ද ලියා දක්වන්න.

**(ආ)** පාලියේ ව්‍යඤ්ජන සන්ධිය සිදුවන ආකාරය හඳුන්වා නිදසුනක් දෙන්න.

**(ඉ)** සමාස ප්‍රභේද සියල්ල දක්වා ද්වන්ද සමාසය නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 2+4+6= 12යි)

**4. (අ)** තද්ධිත පදයක් සකසා ගන්නා ආකාරය ක්‍රමවත්ව ලියා දක්වන්න.

**(ආ)** භාව තද්ධිතය නිදසුන් 03ක් දෙමින් පහදන්න.

**(ඉ)** පහත වගුව සම්පූර්ණ කරන්න. (ලකුණු 2+4+6= 12යි)

| ශබ්දය | දුතියා විභක්තිය | | කරණ විභක්තිය | | චතුත්ථි විභක්තිය | |
|---|---|---|---|---|---|---|
| | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන |
| දණ්ඩි | ................: | දණ්ඩි | දණ්ඩිනා | ................: | දණ්ඩිනො | ................: |
| චිත්ත | ................: | චිත්තෙ | ................: | චිත්තෙහි | ................: | චිත්තානං |
| සබ්බ | සබ්බං | ................: | ................: | සබ්බෙහි | සබ්බස්ස | ................: |

**5. (අ)** 'නාමානං සමුච්චයො ද්වන්දො' යන සූත්‍රයෙන් කියැවෙන අදහස කුමක්ද?

**(ආ)** පහත සඳහන් විග්‍රහවාචී පද සමාස කර දක්වන්න.

1. ධංසා ච මකසා ච
2. ලම්බකණ්ණා යස්ස සො
3. දසබලානි යස්ස සො
4. මුනි එව ධනං
5. ජීවස්ස යාව

**(ඉ)** පහත සඳහන් පද කවර තද්ධිතයකට අයත් දැයි නම් කරන්න.

1. හත්ථික
2. මාගවික
3. දණ්ඩික
4. පඤ්චම
5. එකධා (ලකුණු 2+4+6= 12යි)

**6. (අ)** පහත දැක්වෙන පද පාලියෙන් ලියන්න.

1. එක්තරා 2. නිසා

**(ආ)** තුමන්ත ක්‍රියා පද යොදා අර්ථවත් වාක්‍ය 04ක් ලියන්න.

**(ඉ)** පහත දැක්වෙන මාතෘකාවකට අනුව වාක්‍ය 06කට නොඅඩු රචනාවක් ලියන්න.

1. පාලි භාසා
2. අයං වස්සාන කාලො
3. දුට්ඨගාමිණී රාජා (ලකුණු 2+4+6= 12යි)

**7. (අ)** අතීත කෘදන්ත ප්‍රත්‍ය දක්වා උදාහරණ දෙකක් දෙන්න.

**(ආ)** පහත දැක්වෙන පදයන්හි උපසර්ග පද වෙන්කර දක්වන්න.

1. අභික්කමති 2. සුගන්ධො 3. සප්පුරිසො 4. ඔතරති

**(ඉ)** පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට සුදුසු ක්‍රියා පද වරහනෙන් තෝරා යොදා නැවත ලියන්න.

(තෙනුපසංකමි / සන්ති / දෙසෙති/ උග්ගණ්හාතු/ අභාසි/ වන්දන්ති/ අභිවාදෙත්වා/ පණාමෙත්වා)

1. ඉමං ආටානාටියං රක්ඛං ..................
2. භගවන්තං ....................... පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු.
3. යෙන භගවා ..........................
4. අමනුස්සාපි තං ...................
5. ....................... හි භන්තෙ උළාරා යක්ඛා
6. ........................... භන්තෙ භගවා ආටානාටියං
7. පාණාතිපාතා වෙරමණියා ධම්මං ........................ (ලකුණු 2+4+6= 12යි)

**8. (අ)** සූත්‍ර පිටකයේ මුල් කෘති 4ට අදාළ අට්ඨකථා නම් කරන්න.

**(ආ)** අපදාන පාලියේ එකපොසථික වර්ගයේ අපදාන 10 නම් කරන්න.

**(ඉ)** නන්ද සූත්‍රය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2+4+6= 12යි)

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

### පාලි භාෂාව 1
### ආදර්ශ ප්‍රශ්න පත්‍ර 09

කාලය පැයයි.

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.**

- ❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 1 බැගින් 40කි.**
- ❖ **අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.**
- ❖ **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) යොදන්න.**

**01.** එ, ඔ හ්‍රස්ව ලෙසින් යෙදී ඇති වචන සහිත වර්ණය වන්නේ,

1. මොග්ගල්ලාන, එත්‍ථ, සොත්‍ථි 2. එවං, ඔදනං, එත්‍ථ
3. ඔරං, සෙය්‍යා, පොත්‍ථකං 4. ඔට්ඨො, කොධං, ඔක්කාක

**02.** ව්‍යඤ්ජනාක්ෂර සම්බන්ධයෙන් සාවද්‍ය අදහසක් ඇති වර්ණය වන්නේ,

1. කච්චායන, මොග්ගල්ලායන ව්‍යාකරණ සම්ප්‍රදායන්හි ව්‍යඤ්ජනාක්ෂර 33කි.
2. ව්‍යඤ්ජනාක්ෂරවල හ්‍රස්ව, දීර්ඝ භේදයක් ඇත.
3. ඝෝෂ, අඝෝෂ වශයෙන් ව්‍යඤ්ජනාක්ෂර වර්ග කෙරේ.
4. ව්‍යඤ්ජනාක්ෂරවල සකාර 3ක් නැත.

**03.** වර්ගාක්ෂරවලට ගැළපෙන පරිදි ඒ ඒ වර්ගයන්ට අයත් අක්ෂර සහිත වර්ණය වන්නේ,

1. ක, ඛ, ග, ච, ඤ 2. ච, ඡ, ජ, හ, ඤ 3. ට, ඨ, ඩ, ඪ, න 4. ප, ඵ, බ, භ, ම

**04.** මුලින් අඝෝෂාක්ෂරයක් රහිත පදයක් ඇතුළත් වර්ණය වන්නේ,

1. චන්‍දො, පත්තං, තක්කො 2. කම්මං, ඛත්තියා, පල්ලංකං
3. ඛදිරො, ජින්නො, පුප්ඵං 4. චාරිත්තං, ඨපනං, ථාම

**05.** වර්ගාක්ෂර සම්බන්ධයෙන් සාවද්‍ය අදහසකින් යුතු වර්ණය වන්නේ,

1. වර්ගයක් සඳහා අක්ෂර 05 බැගින් ඇත.
2. ස්පර්ශාක්ෂර යනු පර්යාය වදනකි.
3. වර්ගාක්ෂර අන්තයේ ඇති ඞ,ඤ,ණ,න,ම වර්ගාන්තාක්ෂර වශයෙන් හැඳින්වේ.
4. ද්වීයාක්ෂර යනු වර්ගාක්ෂර හඳුන්වන නාමයකි.

**06.** අන්තස්ථාක්ෂර නිවැරදිව දැක්වෙන වර්ණය වන්නේ,

1. ය, ර, ල, ව 2. ය, ර, ළ, ව 3. ය, ර, හ, ළ 4. ය, ළ, ව, හ

**07.** ළන්තාඤ්ඤෙ ඝොදා යන බාලාවතාර පාඨය මගින් කියැවෙනුයේ,

1. අඝෝෂාක්ෂර පිළිබඳයි 2. ඝෝෂාක්ෂර පිළිබඳයි
3. වර්ගාන්තාක්ෂර පිළිබඳයි 4. වර්ගාක්ෂර පිළිබඳයි

**08.** අක්ෂර උත්පත්ති ස්ථාන අනුව නිවැරදි අක්ෂර යෙදීම සහිත වර්ණය වන්නේ,

1. කණ්ඨජ - ක, ඛ, ග, ඝ, ඞ, ර, ළ   2. තාලුජ - ත, ථ, ද, ධ, න, ළ

3. ඔට්ඨජ - ච, ඡ, ජ, ඣ, ඤ   4. දන්තජ - ත, ථ, ද, ධ, න, ල

**09.** මහාප්‍රාණාක්ෂර ගණන නිවැරදිව දැක්වෙන වර්ණය වන්නේ,

1. 9කි   2. 10කි   3. 11කි   4. 21 කි

**10.** අක්ෂර වින්‍යාසය නිවැරදිව දැක්වෙන වර්ණය වන්නේ,

1. සාමනෙර, අක්ඛර, පිටක   2. ලේකන, ඉදානි, නිරුත්ති

3. චත්තාළීස, අත්ථ, භව   4. දුල්ලබ, ඉධානි, පොත්ථකං

**11.** නාම විභක්ති ගණන නිවැරදිව දැක්වෙන වර්ණය වන්නේ,

1. 8කි   2. 9කි   3. 10කි   4. 11කි

**12.** නාම විභක්ති ප්‍රත්‍යය ගණන නිවැරදිව දැක්වෙන වර්ණය වන්නේ,

1. 11කි   2. 12කි   3. 13කි   4. 14කි

**13.** කරණ විභක්තිය පිළිබඳ සාවද්‍ය අදහසක් වන්නේ,

1. තතියා විභක්තියේම කොටසක් ලෙසින් සැලකේ.
2. විභක්ති ප්‍රත්‍යය තතියා විභක්තියේම ඒවා වෙයි.
3. ආමන්ත්‍රණය සඳහා කරණ විභක්තියෙන් වාක්‍ය තැනේ.
4. නා, හි යනු ප්‍රත්‍ය මාලාවයි.

**14.** අං, යො යනු,

1. පඨමා විභක්ති   2. දුතියා විභක්ති

4. තතියා විභක්ති   4. චතුත්ථි විභක්ති ප්‍රත්‍ය මාලාවයි.

**15.** උක්තාර්ථයේ තැබෙනුයේ,

1. පඨමා විභක්තියෙනි   2. දුතියා විභක්තියෙනි

3. තතියා විභක්තියෙනි   4. චතුත්ථි විභක්තියෙනි

**16.** ඉදිරියේ සිටින කෙනෙකු ආමන්ත්‍රණය කිරීම සඳහා යොදා ගැනෙනුයේ,

1. පඨමා විභක්තිය යි.   2. ආලපන විභක්තිය යි.
3. තතියා විභක්තිය යි.   4. කරණ විභක්තිය යි.

**17.** විසින් යන නිපාත පදය යෙදෙනුයේ,

1. පඨමා විභක්තිය යි.   2. ආලපන විභක්තිය යි.

3. තතියා විභක්තිය යි.   4. කරණ විභක්තිය යි.

**18.** ට, හට, පිණිස, සඳහා යන අරුත් දීමට භාවිත කෙරෙන විභක්තිය වන්නේ,

1. පඨමා විභක්තිය යි.   2. ආලපන විභක්තිය යි.

3. තතියා විභක්තිය යි.   4.චතුත්ථි විභක්තිය යි.

**19.** ස්වාමි අර්ථය තැබෙනුයේ,

1. කරණ විභක්තියෙනි 2. චතුත්ථී විභක්තියෙනි
3. පඤ්චමී විභක්තියෙනි 4. ඡට්ඨී විභක්තියෙනි

**20.** 1, 10, 100, 1000 සඳහා යෙදෙන පාලි වචන නිසි පරිදි ගළපා ඇති වර්ණය වන්නේ,

1. එක, දස, සහස්සං, සතං 2. එක, දස, සතං, සහස්සං
3. සහස්සං, එක, දස, සතං 4. එක, සහස්සං, දස, සතං

**21.** කාරක ගණන නිවැරදිව දැක්වෙන වර්ණය වන්නේ,

1. 5කි. 2. 6කි. 3. 7කි. 4. 8කි.

**22.** ඉච්ඡිත කම්ම, අනිච්ඡිත කම්ම ආදිය යෙදෙනුයේ,

1. දුතියා විභක්තියෙනි. 2. තතියා විභක්තියෙනි.
3. චතුත්ථී විභක්තියෙනි. 4. පඤ්චමී විභක්තියෙනි.

**23.** කාරක අර්ථය සාවද්‍ය ලෙසින් යෙදී ඇති වර්ණය වන්නේ,

1. දුතියා- කර්මාර්ථය 2. තතියා- කර්තෘ අර්ථය
3. චතුත්ථී- සම්ප්‍රදානාර්ථය 4. පඤ්චමී- ආධාරාර්ථය

**24.** හේත්වත්ථය හෙවත් ප්‍රයෝජ්‍ය කර්තෘ පදය තැබෙනුයේ,

1. දුතියා විභක්තියෙනි. 2. තතියා විභක්තියෙනි.
3. චතුත්ථී විභක්තියෙනි. 4. පඤ්චමී විභක්තියෙනි.

**25.** නමො යෝගය තැබෙනුයේ,

1. දුතියා විභක්තියෙනි. 2. තතියා විභක්තියෙනි.
3. චතුත්ථී විභක්තියෙනි. 4. පඤ්චමී විභක්තියෙනි.

**26.** බිය වීම, නික්මයාම ආදි අදහස් දෙන පද තැබෙනුයේ,

1. චතුත්ථීයෙනි 2. පඤ්චමියෙනි 3. ඡට්ඨීයෙනි 4. සත්තමියෙනි

**27.** ධාතු ප්‍රධාන ප්‍රභේද

1. 2කින් 2. 3කින් 3. 4කින් 4. 5කින් යුක්ත වේ.

**28.** ආඛ්‍යාත පදයක් නිර්මාණය වීමේ දී විකරණ ප්‍රත්‍යය යෙදෙනුයේ,

1. ධාතුවට පූර්වයෙනි.
2. ධාතුවට පසු ආඛ්‍යාත ප්‍රත්‍යයට මුලිනි.
3. ආඛ්‍යාතයට පසුවය.
4. ඉහත පිළිතුරු එකක් හෝ නොවේ.

**29.** අතීතකාලය හැඟවෙන ක්‍රියා විභක්ති නිවැරදිව දැක්වෙන වර්ණය වන්නේ,

1. වත්තමාන, අජ්ජතනී, කාලාතිපත්ති, භවිස්සන්ති
2. අජ්ජතනී, කාලාතිපත්ති, පරෝක්ඛා, භවිස්සන්ති
3. කාලාතිපත්ති, අජ්ජතනී, පරෝක්ඛා, හීයත්තනී
4. පඤ්චමී, හීයත්තනී, කාලාතිපත්ති, වත්තමාන

**30.** දෙවො <u>වස්සතු</u> කාලෙන මෙහි ඉරි ඇඳි පදයේ ක්‍රියා විභක්තිය වන්නේ,

1. පඤ්චමී 2. සත්තමී 3. අජ්ජතනි 4. පරොක්ඛා විභක්තිය යි.

**31.** අනුමති අර්ථය තැබෙනුයේ,

1. පඤ්චමී විභක්තියෙනි 2. සත්තමී විභක්තියෙනි

3. වත්තමාන විභක්තියෙනි 4. භවිස්සන්ති විභක්තියෙනි

**32.** අකාරය විකල්පයෙන් යෙදෙනුයේ,

1. හීයත්තනී, කාලාතිපත්ති, අජ්ජතනි විභක්තිවලයි.
2. පරොක්ඛා, හීයත්තනී, සත්තමී විභක්තිවලයි.
3. වත්තමාන, අජ්ජතනී, කාලාතිපත්ති විභක්තිවලයි.
4. හීයත්තනී, අජ්ජතනී, පරොක්ඛා විභක්තිවලයි.

**33.** ක්‍රියා විශේෂණ යෙදීමේ දී ගැළපෙන අදහස නොදෙන වර්ණය වන්නේ,

1. සක්කච්චං- සකසා 2. සුඛං- සැපසේ

3. නිබද්ධං- නිරන්තරයෙන් 4. සාධුකං- සෙමින්

**34.** නිපාත පද සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශයක් වන්නේ,

1. දිගු වාක්‍ය නිර්මාණය කරගැනීම පිණිස යොදාගත හැකිය.
2. නිපාත පද වරනැගිය නොහැකිය.
3. නිපාත වාක්‍යයක ඕනෑම තැනක භාවිත කළ හැකිය.
4. නිපාත පද අව්‍ය ගණයට අයත් වේ.

**35.** තුං, තවෙ ආදි ප්‍රත්‍ය යොදා ගනිමින් නිර්මාණය කරගනු ලබන්නේ,

1. පූර්ව ක්‍රියා ය. 2. තුමන්ත ක්‍රියා ය 3. ප්‍රයෝජ්‍ය ක්‍රියා ය 4. ආශිර්වාද ක්‍රියා ය

**36.** පූර්ව ක්‍රියාවක් යනු,

1. අවසාන ක්‍රියාව සිදුකරන ගමන් සිදු කරන ක්‍රියා වේ.
2. අවසාන ක්‍රියාවෙන් පසු සිදු කිරීමට අපේක්ෂා කරන ක්‍රියා වේ.
3. අවසාන ක්‍රියාවට පෙර සිදුකොට අවසන් කළ ක්‍රියා වේ.
4. ඉහත සියලු ප්‍රකාශ සාවද්‍ය වේ.

**37.** කාලය හැඟවෙන නිපාත පමණක් යෙදී ඇති වර්ණය වන්නේ,

1. සුවෙ, පාතො, අභික්ඛණං, නිච්චං
2. සමන්තා, පරිතො, හෙට්ඨා, පෙච්ච
3. කච්චි, කථං, එවං, සාධු
4. රාජතො, චොරතො, සීසතො, පාදතො

**38.** නිපාත අර්ථ නිසි පරිදි නොයෙදී ඇති වර්ණය වන්නේ,

1. ච- ද 2. හවෙ- ඒකාන්තයෙන් 3. අථ- ඉක්බිති 4. ඛිප්පං- සෙමින්

**39.** ස්වර සන්ධිය සඳහා බාලාවතාරයේ යෙදෙන සූත්‍ර පමණක් ඇතුළත් වර්ණය වන්නේ,

1. සරා සරෙ ලොපං, වා පරො අසරූපා, ක්වචි ඔ බ්‍යඤ්ජනෙ
2. පුබ්බො ච, දීඝං, ලොපඤ්ච තත්‍රාකාරො
3. දොධස්ස ච, අබ්භො අභි, වමොදුදන්තානං

4.රස්සං, පරද්වෙහාවො ධානෙ, මදාසරෙ

**40.** යජ්ජෙවං යන පදය නිවැරදිව විසන්ධි වී ඇති වර්ණය වන්නේ,

1. යජ් + එවං 2. යද් + එවං 3. යදි + එවං 4 යජ්ජ + එවං

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

**මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020**

**පාලි භාෂාව 2**

**ආදර්ශ ප්‍රශ්න පත්‍ර - 09**

කාලය පැය තුනයි.

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.**

**1 කොටසටත් 11 කොටසින් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**

## 1 කොටස

**1. (අ)** පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං එතදවොච. "ආයස්මා භන්තෙ නන්දො භගවතො භාතා මාතුච්ඡපුත්තො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී'ති. භගවතො'පි ඛො ඤාණං උදපාදි. 'නන්දො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී'ති.

**(ආ)** පහත සඳහන් පද්‍ය සිංහලට නගන්න.

සුද්ධෙ අනූනෙ මම භික්ඛුසංඝෙ- ලොකා ඉතො නිස්සරිතුං කමන්තෙ,
පභාතකාලෙ ව්‍යසනං ගභානං- දිස්වාන නියාති ච චන්දලෙඛා.

තදෙතරා භික්ඛුනියො ජිනග්ගං- තාරාව චන්දානුගතා සුමෙරුං,
පදක්ඛිණං කත්ව නිපච්ච පාදෙ- ඨිතා මුඛන්තං සමුදික්ඛමානා.

"න තිත්තපුබ්බං තව දස්සනෙන- දක්ඛුං න සොතං තව භාසිතෙන
චිත්තං මමං කෙවලමෙකමෙව- පප්පුය්‍ය තං ධම්මරසෙන තිත්තිං (ලකුණු 6+6 = 12 යි)

**2. (අ)** පාලියට නගන්න. (ලකුණු 2x3 = 6යි)

i. යාචකයා ධනය ඉල්ලන්නේ සිටුවරයා යාචකයාට ධනය දෙයි.

ii. සිංහයා මුවා ලුහුබැඳ මරා කයි.

iii. අවෛරයෙන් වෛරය සන්සිඳෙයි.

**(ආ)** ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.

සබ්‍රහ්මකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සපුබ්බදෙවතානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සපුබ්බාචරියකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සාහුණෙය්‍යකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. බ්‍රහ්මාති භික්ඛවෙ මාතාපිතූනං එතං අධිවචනං. පුබ්බදෙවතාති භික්ඛවෙ මාතාපිතූනං එතං අධිවචනං. ආහුණෙය්‍යාති භික්ඛවෙ මාතාපිතූනං අධිවචනං. තං කිස්ස හෙතු? බහූපකාරා භික්ඛවෙ මාතාපිතරො පුත්තානං, ආපාදකා පොසකා ඉමස්ස ලොකස්ස දස්සෙතාරොති. එතමත්තං භගවා අවොච.

i. දෙමාපියන් හැඳින්වීම සඳහා භාවිත කොට ඇති පර්යාය පද 3ක් ලියන්න.

ii. 'පුබ්බචරිය' යනුවෙන් දෙමාපියන් හඳුන්වන්නේ ඇයි?

iii. දෙමාපියන් දරුවන්ට දක්වන උපකාර මොනවාද? ඡේදය ඇසුරින් ලියන්න.

iv. ඡේදයෙන් සන්ධි පද 3ක් සොයා විසන්ධි කොට සන්ධි ප්‍රභේදය නම් කරන්න.

(ලකුණු 1+1+1+3 = 6යි)

## 11 කොටස

**3. (අ)** මූර්ධජ අක්ෂර හඳුන්වන බාලාවතාර පාඨය ලියා අදාළ අක්ෂර ද ලියන්න.

**(ආ)** පාලියේ නිග්ගහීත සන්ධිය කෙටියෙන් හඳුන්වා නිදසුනක් දෙන්න.

**(ඉ)** සමාස පිළිබඳ ප්‍රාමාණික විවරණයක් බාලාවතාර සූත්‍ර ඇසුරු කොට දක්වා කම්මධාරය සමාසයේ පිළිබඳ නිදසුන් කිහිපයක් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 2+4+6= 12යි)

**4. (අ)** සමාස හා තද්ධිත අතර පවතින වෙනස්කම් කිහිපයක් ලියන්න.

**(ආ)** සංඛ්‍යා තද්ධිතය ප්‍රත්‍ය දක්වමින් පැහැදිලි කරන්න.

**(ඉ)** පහත වගුව සම්පූර්ණ කරන්න. (ලකුණු 2+4+6= 12යි)

| ශබ්දය | තතියා විභත්තිය | | චතුත්ථී විභත්තිය | | පඤ්චමී විභත්තිය | |
|---|---|---|---|---|---|---|
| | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන |
| අග්ගි | ................: | අග්ගීහි | අග්ගිනො | ................: | අග්ගිනා | ................: |
| ඉම | ................: | එහි, ඉමෙහි | ................: | එසානං, ඉමේසානං | ................: | එහි, ඉමෙහි |
| නදී | නදියා | ................: | ................: | නදීනං | නදියා | ................: |
| නර | නරෙන | ................: | | නරානං | නරම්හා | ................: |

**5. (අ)** 'අඤ්ඤපදත්ථෙසු බහුබ්බීහි' යන සූත්‍රයෙන් කියැවෙන අදහස කුමක්ද?

**(ආ)** පහත සඳහන් විග්‍රහවාචී පද සමාස කර දක්වන්න.

1. චත්තාරො පාදා යෙසං තෙ
2. විජිතා මාරා යෙන සො
3. ඉත්ථීසු අධිකිච්ච
4. අද්ධමාසං අනු
5. පඤ්ඤා එව රතනං

**(ඉ)** පහත සඳහන් පදවල තද්ධිත ප්‍රත්‍යය කුමක්දැයි නම් කරන්න.

1. හත්ථික
2. මාගවික
3. එකක්ඛත්තුං
4. පඤ්චම
5. එකධා

(ලකුණු 2+4+6= 12යි)

**6. (අ)** පහත දැක්වෙන පද පාලියෙන් ලියන්න.

1. අනිද්දා 2. නොවේ

**(ආ)** පූර්ව ක්‍රියා පද යොදා අර්ථවත් වාක්‍ය 04ක් ලියන්න.

**(ඉ)** පහත දැක්වෙන මාතෘකාවකට අනුව වාක්‍ය 06කට නොඅඩු රචනාවක් ලියන්න.

1. ජලං
2. මාතාපිතරො
3. කාකවණ්ණතිස්සරාජා (ලකුණු 2+4+6= 12යි)

**7. (අ)** තුමන්ත ක්‍රියා ප්‍රත්‍ය දක්වා ඒවාට අනුරූප නිදසුන් ද දෙන්න.

**(ආ)** පහත දැක්වෙන පදයන්හි කිතක ප්‍රත්‍යය වෙන්කර දක්වන්න.

1. කත්තබ්බ 2. මරණීය 3. දිනකර 4. කත්තු

**(ඉ)** පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට සුදුසු ක්‍රියා පද වරහනෙන් තෝරා යොදා නැවත ලියන්න.

(වීතිසාරෙත්වා / උග්ගණ්හාතු / රමති/ දිස්වාන/ චොග්ගච්ඡති/ පයිරුපාසන්ති/ අභිවාදෙත්වා/ පණාමෙත්වා)

1. ................ නච්චගීතෙහි ගන්ධබ්බෙහි පුරක්ඛතො.
2. යත්ථ යක්ඛා ..........................
3. තෙ චාපි බුද්ධං ....................... බුද්ධං ආදිච්චබන්ධුනං.
4. කථං සාරාණීයං ......................... එකමන්තං නිසීදිංසු.
5. යස්ස ................... සුරියො ආදිච්චො මණ්ඩලී මහා.
6. .......................... භන්තෙ භගවා ආටානාටියං රක්ඛං. (ලකුණු 2+4+6= 12යි)

**8. (අ)** අපදාන යන්නෙහි අර්ථය දක්වන්න.

**(ආ)** නවාංගසත්ථුසාසනය නම් කරන්න.

**(ඉ)** ගබ්භිනී සූත්‍රය සංක්ෂිප්තව දක්වන්න. (ලකුණු 2+4+6= 12යි)

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

## පාලි භාෂාව 1
## ආදර්ශ ප්‍රශ්න පත්‍ර - 10

කාලය පැයයි.

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 1 බැගින් 40කි.**
- **අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.**
- **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) යොදන්න.**

**01.** අකාරාදි පිළිවෙළ අනුව පද ගළපා ඇති වරණය තෝරන්න.
1. කප්පකොටි, කුසලත්ථිකානං, අප්පමෙය්‍යං, අතිදුක්කරානි
2. අතිදුක්කරානි, අප්පමෙය්‍යං, කප්පකොටි, කුසලත්ථිකානං
3. අතිදුක්කරානි, අප්පමෙය්‍යං, කුසලත්ථිකානං, කප්පකොටි
4. අප්පමෙය්‍යං, අතිදුක්කරානි, කප්පකොටි, කුසලත්ථිකානං

**02.** පාලි අක්ෂරමාලාවේ මහාප්‍රාණ අක්ෂර සංඛ්‍යාව වන්නේ,

1. 05කි  2. 08කි  3. 10කි  4. 11කි

**03.** එ, ඔ අක්ෂර හ්‍රස්ව ලෙසින් උච්චාරණය නොවන ඒවා දැක්වෙන වරණය වන්නේ,

1. එත්‍ථ, ඔක්කමති  2. සෙය්‍යථීදං, ඔට්ඨො
3. සෙට්ඨො, සොත්‍ථි  4. එවං, ඔතරති

**04.** අන්තස්ථාක්ෂර ලෙසින් හඳුන්වනු ලබන්නේ,

1. ය, ර, ල, ව යන අක්ෂරයි  2. ඞ, ඤ, ණ, න, ම යන අකුරුයි
3. ස, හ, ළ, අං යන අකුරුයි  4. ක, ච, ට, ත, ප යන අකුරුයි

**05.** 40, 84 යන සංඛ්‍යා නිවැරදිව පාලියෙන් ප්‍රකාශ කරන සංඛ්‍යා නාම ඇතුළත් වරණය වන්නේ,

1. චතුත්තිංසති, චතුසත්තති  2. චත්තාළීසති, චතුරාසීති
3. චතුසට්ඨි, චතුසත්තති  4. චතුවීසති, චතුරාසීති

**06.** 'සම්පදානෙ චතුත්ථී' යන බාලාවතාර සූත්‍රයට නිදසුන් කළ හැකි පාලි වැකිය තෝරන්න.

1. උපාසකො සංඝස්ස චීවරං දදාති  2. මනුස්සා චොරා භායන්ති
3. විහාරෙ භික්ඛුස්ස චීවරං භවති  4. කුමාරො පාදෙන කන්දුකං පහරති

**07.** සමානාර්ථ **නොවන** පද යුගලය ඇතුළත් වරණය තෝරන්න.

1. ද්වාදස- බාරස  2. තෙරස- තෙළස
3. අට්ඨාදස- අට්ඨාරස  4. ඡබ්බීසති- ඡත්තිංසතු

08. **'පිණ්ඩපාතයේ යාමට කල් වැඩි ය'** යන අදහස දෙන පාලි වාක්‍යය වන්නේ,

1. අතිවෙලං තාව පිණ්ඩාය චරිතුං 2. අතිකාලං තාව පිණ්ඩාය චරිතුං

3. පුබ්බණ්හසමයං තාව පිණ්ඩාය චරිතුං 4. අතිප්පගො බො තාව පිණ්ඩාය චරිතුං

09. **'ආභිදෝසිකං කුම්මාසං'** යන්නෙහි අර්ථය වන්නේ,

1. පිළුණු වූ පිට්ටු යන්නයි 2. කුණු වූ මස් යන්නයි

3. පිළුණු වූ කිරිබත් යන්නයි 4. කුණු වූ බිම්මල් යන්නයි

10. **'භගවතො ........ අනුබ්‍යඤ්ජනානි දිස්සන්ති'** යන වැකියෙහි හිස්තැනට වඩාත් උචිත පදය කුමක්ද?

1. ද්වත්තිංසති 2. අසීති 3. චතුරාසීති 4. චත්තාළීසති

11. **'සො අහම්පි ගමිස්සාමි නගරං මිථිලං පති'** යන වැකියෙහි නිවැරදි අර්ථය ඇති වාක්‍යය කුමක්ද?

1. ඒ මම ද මිථිලා නගරයෙන් යන්නෙමි
2. ඒ මම ද මිථිලා නගරයෙන් ආපසු එන්නෙමි
3. ඒ මම ද මිථිලා නගරයට යන්නෙමි
4. ඒ මම ද මිථිලා නගරයට නැවත යන්නෙමි

12. **"පඤ්චහි භික්ඛුසතෙහි සහ ගොතමී නිබ්බානං යාති"** යන වැකියෙහි විභක්ති ප්‍රයෝගය වන්නේ,

1. ක්‍රියා ප්‍රවර්ගාර්ථයෙහි තතියා විභක්තිය යි 2. සහාදියෝගයේ තතියා විභක්තිය යි

3. කරණාර්ථයේ තතියා විභක්තිය යි 4. ක්‍රියා විශේෂණාර්ථයේ තතියා විභක්තිය යි

13. සත්තමී ආඛ්‍යාත පදයක් නොයෙදුණු පාලි වාක්‍යය තෝරන්න.

1. න භජෙ පාපකෙ මිත්තෙ 2. භික්ඛු අභිනා දට්ඨො කාලං කරෙය්‍ය

3. අහං උපාලිං විනයං පුච්ඡෙය්‍යං 4. යං තෙ කරණීයං තං කරොහි

14. අතීත කාලයෙහි යෙදෙන ආඛ්‍යාත විභක්ති පමණක් ඇතුළත් වර්ණය වන්නේ,

1. අජ්ජතනී, හීයත්තනී, පරොක්ඛා, කාලාතිපත්ති
2. අජ්ජතනී, හීයත්තනී, පංචමී, සත්තමී
3. හීයත්තනී, පරොක්ඛා, සත්තමී, භවිස්සන්ති
4. හීයත්තනී, පංචමී, සත්තමී, කාලාතිපත්ති

15. බුද්ධඝෝෂ හිමියන් දීඝනිකායට හා ධර්මසංගණී ප්‍රකරණයට සම්පාදනය කළ අටුවා යුගලය වන්නේ,

1. සමන්තපාසාදිකා, සුමංගලවිලාසිනී 2. සුමංගලවිලාසිනී, මනොරථපූරණී

3. සුමංගලවිලාසිනී, අත්ථසාලිනී 4. මනොරථපූරණී, අත්ථසාලිනී

16. ථෙරි අපදානයට අයත් වර්ග හතර වන්නේ,

1. සුමේධ, ඛේමා, එකපොසථික, කුණ්ඩලකේසී වර්ග
2. සුමේධ, ඛේමා, කුණ්ඩලකේසී, ඛත්තියා වර්ග
3. සුමේධ, එකපොසථික, කුණ්ඩලකේසී, ඛත්තියා වර්ග
4. ඛේමා, එකපොසථික, කුණ්ඩලකේසී, ඛත්තියා වර්ග

**17.** පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ වන්නේ,

1. පාලි භාෂාවතරණය, පාලි සිංහල අකාරාදිය, ථෙරවාදී බෞද්ධාචාර්යයෝ, බෞද්ධ භාරතය
2. පාලි භාෂාවතරණය, පාලි සිංහල අකාරාදිය, ථෙරවාදී බෞද්ධාචාර්යයෝ, පාලි සාහිත්‍යය
3. පාලි භාෂාවතරණය, ථෙරවාදී බෞද්ධාචාර්යයෝ, බෞද්ධ භාරතය, පාලි සාහිත්‍යය
4. පාලි සිංහල අකාරාදිය, ථෙරවාදී බෞද්ධාචාර්යයෝ, බෞද්ධ භාරතය, පාලි සාහිත්‍යය

**18.** පොළොන්නරු යුගයේ **'සංඝපරිනායක'** යන නාමයෙන් හඳුන්වනු ලැබූ යතිවරයා වන්නේ,

1. ශාරිපුත්‍ර සංඝරාජයන් වහන්සේ ය     2. රාජගුරු ධර්මකීර්ති මාහිමියන් ය

3. සංඝරක්ඛිත මාහිමියන් ය     4. දිඹුලාගල කාශ්‍යප මාහිමියන් ය

**19.** උදාන පාලියේ වර්ග සංඛ්‍යාව වන්නේ,

1. 08කි     2. 09කි     3. 10කි     4. 12 කි

**20.** ශ්‍රී ලාංකේය ථෙරවාදී සම්ප්‍රදායයේ ඛුද්දක නිකායට අයත් නොවන ග්‍රන්ථ වන්නේ,

1. ථෙරගාථා, ථෙරීගාථා     2 නෙත්තිප්පකරණ, පෙටකොපදෙස

3. පටිසම්භිදාමග්ග, උදාන පාළි     4. චරියාපිටක, බුද්ධවංස

**21.** පාලි භාෂාවේ ඇති උපසර්ග පද සංඛ්‍යාව වන්නේ,

1. 10කි     2. 20කි     3. 30කි     4. 32කි

**22.** කාලාර්ථයක් ප්‍රකාශ නොකරන නිපාත පදය ඇතුළත් වරණය වන්නේ,

1. සුවෙ     2. හීයො     3, පාතො     4. ඉතො

**23.** ත්‍රිපිටකයේ සූත්‍රාරම්භයේ යෙදෙන 'එවං මෙ සුතං' යන ප්‍රකාශය කරන ලද්දේ,

1. බුදුරදුන් විසිනි     2. මහාකාශ්‍යප තෙරුන් විසිනි

3. ආනන්ද තෙරුන් විසිනි     4. සැරියුත් තෙරුන් විසිනි

**24. "අථ ඛො භගවා ......... විදිත්වා තායං ............. ඉමං උදානං උදානෙසි"** යන වැකියෙහි හිස්තැන්වලට අනුපිළිවෙළින් වඩාත් උචිත පද ඇතුළත් වරණය වන්නේ,

1. එතමත්ථං- වෙලායං     2. තං- වෙලායං

3. කාරණං- රත්තියං     4. ඨානං- රත්තියං

**25.** අර්ථයෙන් සමාන වන නිපාත පද යුගයල ඇතුළත් වරණය වන්නේ,

1. චිරං- අචිරං     2. උද්ධං-අධො     3. යථා- තථා     4. වත- නූන

**26.** **'එතදවොච'** යන්නෙහි නිවැරදි විසන්ධිය වන්නේ,

1. එතද අවොච     2. එතං අවොච     3. එතද් අවොච     4. එත දවොච ය

**27.** ආමන්ත්‍රණවාචී පද යෙදෙන විභක්තිය වන්නේ,

1. පඨමා විභක්තිය යි     2. තතියා විභක්තියයි

3. ආලපන විභක්තිය යි     4. පඤ්චමී විභක්තිය යි

**28.** පරස්වර ලොප් කරන බාලාවතාර සූත්‍රය වන්නේ,

1. සරා සරෙ ලොපං  2. වා පරො අසරූපා

3. පරො වා සරො  4. ක්වචි ලොපං

**29.** කම්මධාරය සමාසය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය කුමක්ද?

1. තුල්‍යාධිකරණ විශේෂණ විශේෂ්‍ය පද සමාස වේ
2. විශේෂණ පදය පර පදය ලෙසින් යෙදී සමාස වේ
3. උපමා වාචී පදප ර පදය ලෙසින් යෙදී සමාස වේ
4. නිපාත පද දෙකක් එකතු වී සමාස වේ

**30.** **'මාතා ච පිතා ච'** යන පද සමාස පසු  වූ යෙදෙන්නේ,

1. මාතාපිතරො යනුවෙනි  2. මාතාපිතා යනුවෙනි

3. මාතාපිතා ච යනුවෙනි  4. මාතාපිතො යනුවෙනි

**31.** තද්ධිත නාම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. ධාතුවකට ප්‍රත්‍යයක් එක් වී තද්ධිත පද සෑදේ
2. නාමයකට ප්‍රත්‍යයක් එක් වී තද්ධිත පද සෑදේ
3. අව්‍ය පදයකට ප්‍රත්‍යයක් එක් වී තද්ධිත පද සෑදේ
4. නාම පද දෙකක් එකතු වී තද්ධිත පද සෑදේ

**32.** **"ආයන්තිං නාභිනන්දති .................. න සොචති"** යන්නෙහි හිස්තැනට යෙදිය යුතු වචනය විය යුත්තේ,

1. නායන්තිං  2. නික්ඛමන්තිං  3. ගච්ඡන්තිං  4. පක්කමන්තිං

**33.** **'ඛීණාසවො'** යන සමාස පදයෙහි නිවැරදි විග්‍රහ වාක්‍යය වන්නේ,

1. ඛීණා ආසවා යස්ස සො  2. ඛීණා ආසවා යස්මිං සො

3. ඛීණා ආසවා යෙන සො  4. ඛීණා ආසවා යස්මා සො

**34.** අව්‍යයීභාව සමාස පද පමණක් ඇතුළත් වරණය වන්නේ,

1. අසුරො- අබ්‍රාහ්මණො  2. පටිවාතං-යථාබලං

3. කාපුරිසො- සප්පුරිසො  4. පාවචනං- ජිනචරිතං

**35.** **'නරසාරථී'** යනු,

1. තද්ධිත පදයකි  2. කිතක පදයකි  3. සමාස පදයකි  4. සන්ධි පදයකි

**36.** ක්‍රියා විශේෂණ සඳහා භාවිත කරන විභක්ති වන්නේ,

1. දුතියා හා පඤ්චමී විභක්ති ය  2. සත්තමී හා තතියා විභක්ති ය

3. දුතියා හා තතියා විභක්ති ය  4. තතියා හා චතුත්ථී විභක්ති ය

**37.** **'මාතුච්ඡා'** යන්නෙහි අර්ථය වන්නේ,

1. සුළු මව ය  2. නැන්දම්මා ය  3. මව ය  4. ලොකු අම්මා ය

**38.** පාලි භාෂාවේ තද්ධිත ප්‍රභේද ගණන වන්නේ,

1. 05කි  2. 06කි  3. 08කි  4. 10කි

**39. 'වීණා ශිල්පය දන්නා'** යන තේරුම ඇති තද්ධිත පදය වන්නේ,

1. වෙණික　　2. වෙනයික　　3. වෙනෙය්‍ය　　4. වෙනතෙය්‍ය

**40. 'එකහමාර'** යන තේරුම දෙන පාලි පදය වන්නේ,

1. දියඩ්ඪ　　2. තියඩ්ඪ　　3. අඩ්ඪෙක　　4. අඩ්ඪුඩ්ඪ

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

## පාලි භාෂාව 2
## ආදර්ශ ප්‍රශ්න පත්‍ර - 02

කාලය පැය තුනයි.

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.

**1 කොටසටත් 11 කොටසින් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**

## 1 කොටස

**1. (අ)** පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා නන්දො භගවතො භාතා මාතුච්ඡාපුත්තො සම්බහුලානං භික්ඛූනං එවමාරොචෙති. 'අනභිරතො අහං ආවුසො බ්‍රහ්මචරියං චරාමි. න සක්කොමි බ්‍රහ්මචරියං සන්ධාරෙතුං, සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සාමී'ති. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච. "ආයස්මා භන්තෙ නන්දො භගවතො භාතා මාතුච්ඡාපුත්තො සම්බහුනාලං භික්ඛූනං එවමාරොචෙති. 'අනභිරතො අහං ආවුසො බ්‍රහ්මචරියං චරාමි න සක්කොමි බ්‍රහ්මචරියං සන්ධාරෙතුං, සික්ඛං පච්චත්ථාය හීනායාවත්තිස්සාමී"ති.

**(ආ)** පහත සඳහන් පද්‍ය සිංහලට නගන්න.

අහං සුගත මාතා  තෙ ත්වං ච වීර පිතා මම,
සද්ධම්මසුඛදො නාථ තයා ජාතම්හි ගොතම.

සංවඩ්ඪතො'යං සුගත රූපකායෝ මයා තව,
අනින්දියො ධම්මකායො මම සංවඩ්ඪිතො තයා.

මුහුත්ත'තණ්හා සමනං ඛිරං ත්වං පායිතො මයා
තයා'හං සන්තමච්චන්තං ධම්මඛීරං හි පායිතා  (ලකුණු 6+6 = 12 යි)

**2. (අ)** පාලියට නගන්න.  (ලකුණු 2x3 = 6යි)

i. රජතුමා බුදුරජාණන් වහන්සේ දකියි.

ii. පව්ටු මිතුරන් ඇසුරු නොකරන්නේ නම් මැනවි.

iii. සත්පුරුෂයෝ නිතර විහාරයට යති.

**(ආ)** ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.

අථ ඛො ආයස්මා මහාකස්සපො යෙන කුසිනාරා මකුටබන්ධනං නාම මල්ලානං චෙතියං, යෙන භගවතො චිතකො තෙනුපසංකමි. උපසංකමිත්වා එකංසං චීවරං කත්වා අඤ්ජලිං පණාමෙත්වා තික්ඛත්තුං චිතකං පදක්ඛිණං කත්වා පාදතො විවරිත්වා භගවතො පාදෙ සිරසා වන්දි. තානිපි ඛො පඤ්චභික්ඛුසතානි එකංස චීවරං කත්වා අඤ්ජලිං පණාමෙත්වා තික්ඛත්තුං චිතකං පදක්ඛිණං කත්වා භගවතො පාදෙ සිරසා වන්දිංසු. වන්දිතෙසු ච පනායස්මතා මහාකස්සපෙන තෙහිපි පඤ්චහි භික්ඛුසතෙහි සයමෙව චිතකො පජ්ජලි. ඣායමානස්ස ඛො පන භගවතො සරීරස්ස, යං අහොසි ඡවීති වා චම්මන්ති වා මංසන්ති වා නහාරූති වා ලසිකාති වා තස්ස නෙව ඡාරිකා පඤ්ඤායිත්ථ, න මසි,

සරීරාවෙන අවස්සිංසු. සෙය්‍යථාපි නාම සප්පිස්ස වා තෙලස්ස වා ඣායමානස්ස න ඡාරිකා පඤ්ඤායිත්ථ, න මසි. සරීරානෙව අවස්සිංසු. තෙසඤ්ච පඤ්චන්නං දුස්සයුගසතානං ද්වෙ ච දුස්සානි න ඩයිහිංසු. යඤ්ච සබ්බබ්භන්තරිමං, යඤ්ච බාහිරං, දඩ්ඪෙ ච බො පන භගවතො සරීරෙ අන්තලික්ඛා උදකධාරා පාතුභවිත්වා භගවතො චිතකං නිබ්බාපෙසි. උදකං සාලතොපි අබ්භුන්නමිත්වා චිතකං නිබ්බාපෙසි. කොසිනාරකාපි මල්ලා සබ්බගන්ධොදකෙන භගවතො චිතකං නිබ්බාපෙසුං.

i. භාග්‍යවතුන් වහන්සේගේ චිතකය සකස් කර තිබුණේ කොහි ද?

ii. මහාකාශ්‍යප මහතෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ චිතකය කීවරක් ප්‍රදක්ෂිණා කළේ ද?

iii. ඡවි, චම්ම, ඡාරිකා, මසි යන පදවල අර්ථ ලියන්න.

iv. තථාගත දේහය ආදාහනයේ දී අළු නොවී ඉතිරි වුණු වස්ත්‍ර දෙක මොනවාද?

(ලකුණු 1+1+2+2 = 6යි)

## 11 කොටස

**3. (අ)** අඝෝෂාක්ෂර හඳුන්වන බාලාවතාර සූත්‍ර පාඨය ලියන්න.

**(ආ)** අක්ෂර උත්පත්ති ස්ථාන කියැවෙන බාලාවතාර පාඨ ලියන්න.

**(ඉ)** පහත සඳහන් සන්ධි පද විසන්ධි කරන්න.

| | | | |
|---|---|---|---|
| i. යානීධ | ii. ඡායාව | iii. ඡළභිඤ්ඤා | iv. එසධම්මො |
| v. සෙතච්ඡත්තං | vi. සඤ්ජාතො | vii. ඉදමවොච | viii. බීජංව |
| ix. සබ්බෙව | x. පුනරෙව | xi. චන්දොදය | xii. මාතුපට්ඨානං |

(ලකුණු 2+4+6= 12යි)

**4. (අ)** ‘අපාදානෙ පඤ්චමී’ යන සූත්‍රයේ අර්ථය ලියා උදාහරණ සපයන්න.

**(ආ)** වානර, අග්ගි, භික්ඛු, වනිතා යන ශබ්දවල චතුර්ථී විභක්ති ඒකවචන හා බහුවචන රූප ලියන්න.

**(ඉ)** පහත සඳහන් ක්‍රියා පදවල ආඛ්‍යාත විභක්තිය නම් කරන්න. (ලකුණු 2+4+6= 12යි)

| | | | |
|---|---|---|---|
| i. වස්සතු | ii. කරොහි | iii. අගච්ඡි | iv. වන්දෙය්‍ය |
| v. අභිරමිස්සති | vi. රක්ඛන්තු | vii. නමාමි | viii. පරිදෙවිංසු |
| ix. පටිවසති | x. ජීවති | xi. ලභෙය්‍යාම | xii. වන්දිස්සාමි |

**5. (අ)** සමාසවලින් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

**(ආ)** පහත සඳහන් සමාස පද නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| i. මහාපුරිසො | ii. චතුමාසං | iii. රාජපුත්තො | iv. අරුළ්හවාණිජා |
| v. යාවජීවං | vi. ඩංසමකසං | vii. සාරිපුත්තත්ථෙරො | viii. ජිතින්ද්‍රියො |

**(ඉ)** පහත සඳහන් තද්ධිත පදවල අර්ථ ලියන්න.

| | | |
|---|---|---|
| i. කච්චානො | ii. සාකටිකො | iii. දොවාරිකො |
| iv. ආරොග්‍යං | v. සූකරිකො | vi. සතිමන්තො |

(ලකුණු 2+4+6= 12යි)

**6. (අ)** පහත දැක්වෙන පද පාලියෙන් ලියන්න.

1. හෙට　　2. සවස

**(ආ)** පහත වාක්‍ය යුගල පූර්ව ක්‍රියා යොදා තනි වාක්‍ය ලෙසින් ලියන්න.

1. සාමණෙරො පුප්ඵං ඔචිනාති. සො බුද්ධං වන්දති

2. කුමාරො ධම්මං සුණාති. සො පබ්බජ්ජති

3. මයං පරිවෙණං ගච්ඡාම. මයං තත්ථ පාලිභාසං උග්ගණ්හාම

4. ථෙරො පාතොව උට්ඨහති. සො මුඛං ධොවති

**(ඉ)** පහත දැක්වෙන මාතෘකාවකට අනුව වාක්‍ය 06කට නොඅඩු රචනාවක් ලියන්න.

1. පාලි භාසා
2. මම පණ්ණසාලා
3. සම්මාසම්බුද්ධො (ලකුණු 2+4+6= 12යි)

**7. (අ)** සර්ව නාම ශබ්ද 04ක් දක්වන්න.

**(ආ)** පහත දැක්වෙන පදයන්හි උපසර්ග පද වෙන්කර දක්වන්න.

1. අභිවන්දති 2. ආහරති 3. නිවාරෙති 4. අතිරොචති

**(ඉ)** පහත දැක්වෙන නිපාත පද යොදා සුදුසු ලෙසින් වාක්‍ය නැවත ලියන්න.

(අභිණ්හං/ ඛිප්පං/ පුනප්පුනං/ කච්චි/ දිවා/ තදා)

1. ආදිච්චො ............ තපති.

2. කස්සකා ............... බීජානි වපන්ති.

3. ...................... තෙ කස්සප ඛමනීයං.

4. පණ්ඩිතො ............ ධම්මං විජානාති.

5. පබ්බජිතෙන .................. පච්චවෙක්ඛිතබ්බං.

6. භූමිචාලො ................... ආසි. (ලකුණු 2+4+6= 12යි)

**8. (අ)** අපදානට්ඨකථාවේ නම හා කතුවරයා නම් කරන්න.

**(ආ)** එකපොසථික වර්ගයට අයත් අපදාන හතරක් නම් කරන්න.

**(ඉ)** ගබ්භිනී සූත්‍රයේ සාරාංශය ලියන්න. (ලකුණු 2+4+6= 12යි)

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

### පාලි භාෂාව 1
### ආදර්ශ ප්‍රශ්න පත්‍ර - 11

කාලය පැයයි.

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.**

- ❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 1 බැගින් 40කි.**
- ❖ **අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.**
- ❖ **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) යොදන්න.**

**01.** අකාරාදි පිළිවෙළට ගළපා ඇති වර්ණය වන්නේ,

1. කප්පකොටි, කාලං, කරොනෙතා, කාරුණිකස්ස
2. අප්පමෙය්‍යං, අසම්බුද්ධං, අවිජ්ජා, අතිදුක්කරානි
3. නමාමි, නමො, නාථො, නිසෙවිතං
4. සංසං, සිරසා, සිවං, සමාධි

**02.** අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදුණු වදන් සහිත වර්ණය වන්නේ,

1. බුද්ද, නාථො, අතිදුක්ඛරානි, අප්පමෙය්‍යං
2. අවිජ්ඣා, කිළෙසජාල, විද්ධංසිනො, අසම්බුද්ධං
3. අරියසංගං, ඛෙත්තං, යුතෙතා, ගුනෙහි
4. කුසලත්‍තීකානං, ධම්මවරස්ස, විද්ධංසිනො, කිලෙසජාල

**03.** ඝෝෂාක්ෂර පමණක් යෙදී ඇති වර්ණය වන්නේ,

1. ග, ජ, ඩ, ම, ඣ
2. ක, ච, න, ධ, හ
3. ච, ප, බ, ම, ණ
4. ත, ඡ, ඞ, බ, ස

**04.** මොග්ගල්ලායන ව්‍යාකරණ සම්ප්‍රදායට අනුව පාලි අක්ෂර මාලාව ගණිනින්,

1. 41කි.
2. 42කි.
3. 43කි.
4. 44කි.

**05.** එ, ඔ අක්ෂර හ්‍රස්ව ලෙස උච්චාරණය වන අවස්ථා සහිත පද ඇතුළත් වර්ණය වන්නේ,

1. මොගගලලායන, මොක්ඛං, මොදමානා, මොනෙය්‍ය
2. එත්ථ, පෙය්‍ය, සෙය්‍යො, දෙය්‍ය
3. මෙධංකරො, මෙත්ත, මෙධිනී, මෙසො
4. කොණ්ඩඤ්ඤ, කොවිදො, කොච්ඡකාර, කොට්ඨාගාර

**06.** පාලි අක්ෂරමාලාවේ අඝෝෂාක්ෂර ගණන නිවැරදිව දැක්වෙන වර්ණය වන්නේ,

1. 11කි.
2. 21කි.
3. 12කි.
4. 22කි.

**07.** වර්ගාන්තාක්ෂර යනුවෙන් හඳුන්වන අක්ෂර ඇතුළත් වර්ණය වන්නේ,

1. ය, ර, ල, ව　　2. ඞ, ඤ, ණ, න, ම
3. ක, ච, ට, ත, ප　　4. ස, හ, ළ, අං

**08.** ඔට්ඨජ අක්ෂර පමණක් ඇතුළත් වර්ණය වන්නේ,

1. ප, ඵ, බ, භ, ම　　2. ත, ථ, ද, ධ, න
3. ච, ඡ, ජ, ඣ, ඤ　　4. ක, ඛ. ග, ඝ. ඞ

**09.** නාම විභක්ති ප්‍රත්‍යය අතර **ස, නං** ප්‍රත්‍ය දෙක යෙදෙන විභක්ති වන්නේ,

1. තතියා විභක්තිය සහ චතුත්ථී විභක්තිය
2. දුතියා විභක්තිය සහ ඡට්ඨී විභක්තිය
3. චතුත්ථී විභක්තිය සහ ඡට්ඨී විභක්තිය
4. පඤ්චමී විභක්තිය සහ සත්තමී විභක්තිය

**10.** දුතියා විභක්තිය යෙදුණු පද පමණක් ඇතුළත් වර්ණය වන්නේ,

1. බුද්ධං, ධම්මං, සංඝං, ලෙඩිනං
2. පුත්තො, වස්සං, හත්තං, ගාමං
3. කුමාරං, සාමණෙරං, ඔදනො, පුත්තං
4. රඤ්ඤො, මාතා, පිතරං, කස්සකං

**11.** '**ඔකාසෙ සත්තමී**' විභක්තිය සඳහා දිය හැකි නිදසුන් වැකියක් වන්නේ,

1. පුත්තො හත්තං භුඤ්ජති.　　2. උපාසකො සංඝස්ස චීවරං දදාති.
3. මනුස්සා ගාමා අපෙනති.　　4. සකුණො ආකාසෙ උඩෙඩති.

**12.** '**එක**' ශබ්දය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1. එක ශබ්දය පුල්ලිංගයේ වරනැගේ.
2. එක ශබ්දය ඉත්ථිලිංගයේ වරනැගේ.
3. එක ශබ්දය නපුංසක ලිංගයේ වරනැගේ.
4. ඒක ශබ්දය ඒකවචන බහුවචන දෙකෙහිම වරනැගේ.

**13.** '**29, 44**' සංඛ්‍යා සඳහා නිවැරදි පාලි ශබ්දය දක්වා ඇති වර්ණය වන්නේ,

1. එකූනවීසති, චත්තාළීසති　　2. ඒකූනතිංසති, ඡචත්තාළීසති
3. ඒකූනතිංසති, චතුචත්තාළීසති　　4. එකතිංසති, සත්තචත්තාළීසති

**14.** සමාන අදහසක් නොදෙන සංඛ්‍යා යුගලය සහිත වර්ණය වන්නේ,

1. බාරස - ද්වාදස　　2. චතුද්දස - චොද්දස
3. සොළස - සත්තරස　　4. තෙවීසති - තෙවීස

**15.** ක්‍රියාපවර්ගාර්ථය සඳහා දක්වා ඇති නිදසුනක් වන්නේ,

1. කාලෙන ධම්මසවණං එතං මංගලමුත්තමං
2. ථෙරා නවහි මාසෙහි සංගීතිං අකංසු
3. පඤ්චසතා භික්ඛු තෙන සද්ධිං මග්ගං පටිපජ්ජිංසු
4. අහං සීතස්ස පටිඝාතාය චීවරං පටිසෙවාමි

**16.** '**මාතුජා**' යනු,

1. මවයි.
2. නැගෙණියයි.
3. සහෝදරයයි.
4. සහෝදරියයි.

**17.** '**සෙනාපති යොධෙහි සද්ධිං ............ නික්ඛමති**' ඉහත හිස් තැන සඳහා ලබාදිය හැකි පිළිතුර ඇතුළත් වර්ණය වන්නේ,

1. නගරං
2. නගරම්හි
3. නගරෙ
4. නගරම්හා

**18.** අකර්මක ධාතු ඇතුළත් වර්ණය වන්නේ,

1. හස, කන්‍ද, ජර, රුජ
2. ලිඛ, පඨ, ඡින්‍ද, පූජ
3. හස, ලිඛ, ගමු, වන්‍ද
4. ඡින්‍ද, රුජ, මුච, පච

**19.** '**උපසන්තො සුඛං සෙති**' යන විභක්ත්‍යාර්ථ යෙදුම අයත් වන්නේ කුමන විභක්ති ප්‍රයෝගයට ද?

1. නමො යොගයෙහි චතුත්ථී
2. ක්‍රියා විශේෂණාර්ථයේ දුතියා
3. ඉත්ථම්භූතාර්ථයේ තතියා
4. නිර්ධාරණාර්ථයේ සත්තමී

**20.** පඤ්චමී ආඛ්‍යාත පදයක් යෙදුණු වාක්‍ය ඇතුළත් වර්ණය වන්නේ,

1. න **භජෙ** පාපකෙ මිත්තෙ
2. සබ්බාරි විජයං **අකා**
3. දෙවො **වස්සතු** කාලෙන
4. කිං **කරිස්සාමි** අරඤ්ඤවාසෙන

**21.** වර්තමාන, අතීත, අනාගත කාල නියෝජනය කරන ආඛ්‍යාත පිළිවෙළින් දක්වා ඇති වර්ණය වන්නේ,

1. වත්තමාන, අජ්ජතනී. භවිස්සන්ති
2. අජ්ජතනී, භවිස්සන්ති, වත්තමාන
3. වත්තමාන, භවිස්සන්ති, අජ්ජතනී
4. භවිස්සන්ති, වත්තමාන, අජ්ජතනී

**22.** '**තුමන්ත ක්‍රියා**' පමණක් අඩංගු වර්ණය වන්නේ,

1. ගන්තුං, කත්තුං, පාතුං, දාතවෙ
2. පචිතුං, ආදාය, හොතුං, ජෙතු
3. කත්තුන, උග්ගණ්හිතුං, රක්ඛිතුං, ජෙතුං
4. හසිතුං, සොතුං, සුණිතුං, පචතු

**23.** උපසර්ග පද පමණක් ඇතුළත් වර්ණය වන්නේ,

1. අනු, අභි, අධි, අ, පටි
2. ප, පරා, නි, සු, අව
3. සං, වී, අව, අප, උප
4. ආ, වි, නි, නී, දු

**24.** '**පූර්ව ස්වර ලෝපය**' සඳහා යෙදෙන බාලාවතාර සූත්‍රය වන්නේ,

1. වා පරො අසරූපා
2. වමොදුදන්තානං
3. සරා සරෙ ලොපං
4. ක්වචාසවණ්ණං ලොපො

**25.** '**පාතොව**' පදයට නිවැරදිව විසන්ධිය දක්වා ඇති වර්ණය වන්නේ,

1. පාතො+ව
2. පාතො+එව
3. පා+ තොව
4. ප+ තොව

**26.** කම්මධාරය සමාසය සඳහා පමණක් ලබා දී ඇති නිදසුන් ඇතුළත් වර්ණය වන්නේ,

1. පත්තචීවරානි, මාතාපිතරො, ඩංසමකසං, යුගනංගලං
2. ජිනචරිතං, සීලසම්පන්නො, සරණගතො, වනවාසො
3. මහාපුරිසො, මහප්ඵලං, ගුණධනං, අසුරො
4. තිභවා, චතුසච්චං, තිලොකං, එකපුග්ගලො

**27.** තද්ධිත ප්‍රභේද සංඛ්‍යාව නිවැරදිව දක්වා ඇති වර්ණය වන්නේ,

1. 4කි. 2. 5කි. 3. 6කි. 4. 7කි.

**28.** දීඝ, මජ්ඣිම, සංයුත්ත, අංගුත්තර නිකායයන් සඳහා කළ අටුවා පිළිවෙළින් දැක්වෙන වර්ණය වන්නේ,

1. සුමංගවිලාසිනී, පපඤ්චසූදනී, මනෝරථපූරණී, සාරත්ථප්පකාසිනී
2. සුමංගලවිලාසිනී, සාරත්ථප්පකාසිනී, පපඤ්චසූදනී, මනෝරථපූරණී
3. පපඤ්චසූදනී, සුමංගලවිලාසිනී, මනෝරථපූරණී, සාරත්ථප්පකාසිනී
4. සුමංගලවිලාසිනී, පපඤ්චසූදනී, සාරත්ථප්පකාසිනි, මනෝරථපූරණී

**29.** දීඝනිකායට කළ අටුවාව සඳහා බුද්ධඝෝෂ හිමියන්ට ආරාධනා කරනු ලැබූයේ,

1. ජෝතිපාල හිමියන් විසිනි. 2. ජීවක උපාසක තැන විසිනි.
3. දාඨානාග හිමියන් විසිනි. 4. සොණ හිමියන් විසිනි.

**30.** '**පාතිමොක්ඛ**' සඳහා ලියූ අටුවා කෘතිය වන්නේ,

1. සමන්තපාසාදිකා 2. කංඛාවිතරණී
3. අත්ථසාලිනී 4. සම්මොහවිනොදනී

**31.** අභිධර්මයේ නිධාන කථාව ඇතුළත් අභිධර්ම පිටකයට අයත් වන අටුවා කෘතිය වන්නේ,

1. අත්ථසාලිනී 2. සම්මොහවිනොදනී
3. පරමත්ථජෝතිකා 4. පරමත්ථදීපනී

**32.** '**බුද්ධවංසපාළිය**' සඳහා '**මධුරත්තපප්පකාසිනී**' නම් අටුවාව කළ අටුවාචාරීන් වහන්සේගේ නම වන්නේ,

1. උපසේන හිමි 2. මහානාම හිමි
3. ධම්මපාල හිමි 4. බුද්ධදත්ත හිමි

**33.** බුද්ධඝෝෂ හිමියන් රචනා කළ කෘති අතර අවසානයට රචනා කළ අටුවා කෘතිය වන්නේ,

1. ජාතකට්ඨකථා 2. මනෝරථපූරණී
3. අත්ථසාලිනී 4. ධම්මපදට්ඨකථා

**34.** '**සංඝපරිනායක**' ධුරයෙන් පිදුම් ලැබූ පොළොන්නරු යුගයේ වැඩ සිටි මහතෙරුන්ගේ නම වන්නේ,

1. ශාරිපුත්‍ර හිමිපාණන් වහන්සේ 2. කාශ්‍යප හිමිපාණන් වහන්සේ
3. මොග්ගල්ලාන හිමිපාණන් වහන්සේ 4. ධර්මකීර්ති හිමිපාණන් වහන්සේ

**35.** රීස් ඩේවිඩ්ස් රචනා කළ මුල්ම කෘතියේ නම වන්නේ,

1. ලංකාවේ පැරණි කාසි හා මැනීම් ක්‍රම 2. බුද්ධධර්ම සංග්‍රහය
3. බෞද්ධ ජාතක කථා 4. ජාතක කථා

**36.** බුද්ධවචනය මුල් වරට ග්‍රන්ථාරූඪ කළේ බුද්ධ පරිනිර්වාණයෙන් වර්ෂ ..... ඉක්ම ගිය තැන දී ය.

1. 440ක් 2. 445ක් 3. 450ක් 4. 455ක්

**37.** උදාන පාළියේ අන්තර්ගත වර්ග සංඛ්‍යාව වන්නේ,

1. 6කි. 2. 7කි. 3. 8කි. 4. 9කි.

**38.** සංගාමජි සූත්‍රය ඇතුළත් වන්නේ උදාන පාළියේ,

1. පාටලීගාමිය වර්ගයට ය.
2. බොධිවර්ගයට ය.
3. ජච්චන්ධ වර්ගයට ය.
4. චූල වර්ගයට ය.

**39.** '**යස්ස නිත්තිණ්ණො පංකො ච මද්දිතො කාමකණ්ටකො**' යන උදාන ගාථාව ඇතුළත් සූත්‍රය වන්නේ,

1. නන්ද සූත්‍රය
2. ගබ්භිනී සූත්‍රය
3. සංගාමජි සූත්‍රය
4. ජුණ්හ සූත්‍රය

**40.** මහා ප්‍රජාපතී අපදානයට ඇතුළත් ගාථා සංඛ්‍යාව වන්නේ,

1. 170කි.
2. 180කි.
3. 190කි.
4. 195කි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

## පාලි භාෂාව 2

## ආදර්ශ ප්‍රශ්න පත්‍ර - 11

කාලය පැය තුනයි.

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.

**1 කොටසටත් 11 කොටසින් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**

## 1 කොටස

**1.** (i) සිංහලට නගන්න.

අථ ඛො ආයසමා සඞ්ගාමජී තං දාරකං නෙව ඔලොකෙසි, නපි ආලපි. අථ ඛො ආයසමතො සඞ්ගාමජිස්ස පුරාණදුතියිකා අවිදූරං ගන්ත්වා අපලොකෙන්තී අද්දස ආයස්මන්තං තං දාරකං නෙව ඔලොකෙන්තං නපි ආලපන්තං. දිස්වාන'ස්සා එතදහොසි. 'න චායං සමණො පුත්තෙනපි අත්ථිකො'ති. තතො පටිනිවත්තිත්වා දාරකං ආදාය පක්කාමි. අද්දසා ඛො භගවා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන ආයසමතො සඞ්ගාමජිස්ස පුරාණදුතියිකාය එවරූපං විප්පකාරං. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසිඃ (ලකුණු 06 යි)

(ii) **සිංහලට නගන්න.**

බුද්ධසාසනපාලෙතා පච්ඡිමං දස්සනං තව,
තත්ථ ගච්ඡාමහං පුත්ත ගතො යත්ථ න දිස්සතෙ''.

කදාචි ධම්මං දෙසෙන්තො බිපි ලොකගනායකො,
තදාහං ආසිංසච්චං අවොචං අනුකම්පකා.

''චිරං ජීව මහාවීර කප්පං තිට්ඨ මහාමුනෙ,
සබ්බලොකස්ස අත්ථාය භවස්සු අජරාමරො.'' (ලකුණු 2X3 = 06යි)

**2.** (i). පාලියට නගන්න.

(අ) එක් දිනක් රජතුමා විහාරයට ගොස් බුදුරදුන්ට වැඳ එකත්පසෙක සිටියේය.

(ආ) නොනිදන්නාට රාත්‍රිය දීර්ඝ ය.

(ඉ) ඇමතිවරු යුද්ධයට සේනාව සංවිධානය කළහ. (ලකුණු 2X3 = 06යි)

(ii) පහත දැක්වෙන ඡේදය කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තෙන ච සමයෙන අඤ්ඤතරො තාපසො ගොපාලකුලං නිස්සාය ගඞ්ගාතීරෙ විහරති. සො පාතොව ගඞ්ගං ඔතරන්තො භාජනං ආගච්ඡන්තං දිස්වා පංසුකූලසඤ්ඤාය අග්ගහෙසි. තතො තත්ථ අක්ඛරපට්ටකං රාජමුද්දිකාලඤ්ඡනඤ්ච දිස්වා මුඤ්චිත්වා තං මංසපෙසිං අද්දස. දිස්වානස්ස එතදහොසි. 'සියා ගබ්භො. තථා හිස්ස දුග්ගන්ධපූතිභාවො නත්ථී'ති. තං අස්සමං නෙත්වා සුද්ධෙ ඔකාසෙ ඨපෙසි. අථ අඩ්ඪමාසච්චයෙන ද්වෙ මංසපෙසියො අහෙසුං. තාපසො දිස්වා සාධුතරං ඨපෙසි. තතො පුන අඩ්ඪමාසච්චයෙන එකමෙකිස්සා පෙසියා හත්ථපාදසීසානමත්ථාය පඤ්ච පඤ්ච පීළකා උට්ඨහංසු. තාපසො දිස්වා පුන සාධුතරං ඨපෙසි. අථ අඩ්ඪමාසච්චයෙන එකා මංසපෙසි සුවණ්ණබිම්බසදිසො දාරකො. එකා දාරිකා අහොසි. තෙසු තාපසස්ස පුත්තසිනෙහො උප්පජ්ජි. අඞ්ගුට්ඨකතො චස්ස ඛීරං නිබ්බත්ති. තතොප්පභුති ච ඛීරභත්තං ලභති. සො භත්තං භුඤ්ජිත්වා ඛීරං දාරකානං මුඛෙ ආසිඤ්චති. තෙසං යං යං උදරං පවිට්ඨං, තං සබ්බං මණිභාජනගතං විය දිස්සති. එවං ලිච්ඡවී අහෙසුං. එවං තෙ නිච්ඡවිතාය ලිච්ඡවීති පඤ්ඤායිංසු.

(අ) තාපසයා වාසය කළේ කොහි ද?

(ආ) තාපසයා දැක්කේ කුමක් ද?, පසුව කුමක් කළේ ද?

(ඉ) අක්ඛරපට්ටකං, පංසුකූලසඞ්ඝාය, ඛීරභත්තං, සාධුතරං යන පදවලට සිංහල අදහස දෙන්න.

(ඊ) පාඨයෙන් නිපාත පද දෙකක් සහ පූර්ව ක්‍රියා පද දෙකක් උපුටා දක්වන්න. (ලකුණු 1+1+2+2 =12යි)

## II කොටස

**3.** (i) වකාරය උත්පත්තිය දැක්වෙන බාලාවතාර පාඨය නම් කරන්න. (ලකුණු 2+4+6= 12යි)

(ii) පහත සඳහන් පද විසන්ධි කරන්න.

(i) පාතොව (ii) මාසවචයෙන

(iii) තතොප්පභුති (iv) ඉදාහං

(v) යථරිව (vi) අක්ඛාතං

(vii) සප්පුරිසො (viii) බුද්ධංව

(iii) පහත සඳහන් බාලාවතාර සූත්‍රයන්හි සන්ධි කාර්යය පැහැදිලි කොට නිදසුන් දෙක බැගින් දෙන්න.

(i) වා පරො අසරූපා (ii) වමොදුදන්තානං

(iii) එඔහෙඤ්ඤං (iv) වග්ගන්තං වා වග්ගෙ

**4.** (i) 'කරණෙ තතියා' යන සූත්‍රය පැහැදිලි කොට උදාහරණ වාක්‍යයක් ලියන්න. (ලකුණු 2+4+6= 12යි)

(ii) පහත වාක්‍යවල කළු අකුරින් ඇති පදවල නාම විභක්තිය හා වචනය නම් කරන්න.

(i) සාමණෙරො **ලෙඛනං** ලිඛති. (ii) අනුජානාමි **භික්ඛවෙ** වස්සං උපගන්තුං.

(iii) මනුස්සා **චොරා** භායන්ති. (iv) දාරකො **මඤ්චෙ** සයති.

(iii) තද කළු අකුරින් දක්වා ඇති පදවල ආඛ්‍යාත විභක්තිය නම් කරන්න.

(i) තෙ සුඛිතා **භවන්තු** (ii) අහං සුඛී **භවෙ**

(iii) අහං ආනන්දං විනයං **පුච්ඡෙය්‍යං** (iv) **භජෙථ** මිත්තෙ කල්‍යාණෙ

(v) **අගා** ජෙතවනං ජිනො (vi) කුමාරො හීයො ගාමං **ජගාම**

(vii) ආවුසො මා **සොචිත්ථ** (viii) සුපටිච්ඡන්නෙනා අන්තරඝරෙ **නිසීදිස්සාමි**

**5.** (i) '**අයුවණ්ණානං චායො වුද්ධි**' යන පාඨයෙහි අර්ථය ලියන්න.

(ii) පහත සඳහන් තද්ධිත පදවල අර්ථය ලියන්න.

(i) කච්චාන (ii) සාතික

(iii) ධම්මික (iv) තණ්ඩුලික

(iii) පහත පදවල සමාස නම් කරන්න.

(i) උපනගරං (ii) උපහටබලි

(iii) ඨංසමකසං (iv) ආගතසමණො

(v) එකපුග්ගලො (vi) කුදිට්ඨි

(vii) මහාබලං (viii) ජිනචරිතං (ලකුණු 2+4+6= 12යි)

**6.** (i) පහත දැක්වෙන සංඛ්‍යා පාලියෙන් ලියන්න.

(i) 88 (ii) 99

(ii) පහත වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.

(i) මනුස්සා මිගං මාරෙති. (ii) භික්ඛු උපාසකං ධම්මං දෙසෙති.

(iii) මාතා පුත්තං ලාලයති. (iv) රාජා අමච්චං දිස්සති.

(iii) පහත දැක්වෙන මාතෘකා අතුරින් එකක් තෝරාගෙන වාක්‍ය හයකට නො අඩු රචනාවක් ලියන්න.

(i) මම මාතා (ii) දානානිසංසං

(iii) දුට්ඨගාමිණී රාජා (ලකුණු 2+4+6= 12යි)

**7.** (i) පහත දැක්වෙන නිපාත පදවල අර්ථය ලියන්න.

(i) කිත්තාවතා (ii) සචෙ

(iii) සතතං (iv) සම්මුඛා

(ii) පහත සඳහන් වාක්‍ය යුගල පූර්ව ක්‍රියා පද යොදා තනි වාක්‍යයක් ලෙස ලියන්න.

(i) උපාසකො පුප්ඵානි ඔචිනාති - සො බුද්ධං වන්දති.

(ii) කුමාරො පාතොව පබුජ්ඣති - සො පාඨාලයං ගච්ඡති.

(iii) වනිතා අග්ගිසාලං ගච්ඡති - සා භත්තං පචති.

(iv) භික්ඛු විහාරං ගච්ඡති - සො බුද්ධං පස්සති.

(iii) පහත සඳහන් බාලාවතාර සූත්‍රවලට අයත් පද යොදා හිස්තැන් පුරවන්න.

(i) ද්විපදෙ තුල්‍යාධිකරණෙ .........................

(ii) .............. සමුච්චයො ද්වන්දො

(iii) වග්ගෙ .................................... තතිය පඨමා

(iv) උපෙච්ච අත්ථං .................... උපසග්ගා

(v) ................... සමානකත්තුකෙසු තවෙ තුං වා

(vi) පුබ්බමධොඨිතමස්සරං ...................................... (ලකුණු 2+4+6= 12යි)

**8.** (i) නන්ද සූත්‍රය කෙටියෙන් ලියා දක්වන්න.

(ii) රීස් ඩේවිඩ්ස් මහතාගෙන් පාලි සාහිත්‍යයට සිදු වූ සේවාව ලියන්න.

(iii) මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ පරිනිර්වාණය ඇසීමත් සමග පරිසරයේ ඇති වූ වෙනස්කම් මොනවාද? (ලකුණු 4 x 3 = 12යි)

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

## පාලි භාෂාව 1

## ආදර්ශ ප්‍රශ්න පත්‍ර - 12

කාලය පැයයි.

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 1 බැගින් 40කි.
- අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) යොදන්න.

**1.** පාලි අක්ෂර මාලාවේ අන්තර්ගත නොවන අක්ෂරයක් ඇතුළත් වරණය තෝරන්න.

1. අ, ක, ච, ජ, බ  2. ආ, ඛ, න, ඨ, ද  3. ඉ, ඪ, ඵ, ශ, ය  4. ම, ය, ඨ, හ, ල

**2.** '**තයෝදනතා සරා අට්ඨ**' බාලාවතාර පාඨයට ඇතුළත් කළ නොහැකි වරණය ඇති පිළිතුර කුමක්ද?

1. අ, ඉ, උ  2. ආ, ඊ, ඌ  3. ඉ, එ, ඔ  4. ඇ, ඉ, උ

**3.** මහාප්‍රාණාක්ෂරයක් ඇතුළත් වදන සහිත වර්ණය කුමක්ද?

1. අප්පමෙය්‍යං  2. ජීවලොකො  3. කුසලත්‍ථිකානං  4. විමුත්තිඤාණ

**4.** මුලින් යෙදී ඇති වදන හ්‍රස්ව ලෙස උච්චාරණය නොවන වර්ණය තෝරන්න.

1. මොග්ගල්ලාන  2. දෙවලොකං  3. ඛෙත්තං  4. සොත්‍ථි

**5.** වර්ගාන්තාක්ෂරය යෙදී ඇති වචනය සහිත වර්ණය වන්නේ,

1. තමම්ත්තං  2. සෙය්‍යථීදං  3. කප්පකොටි  4. කිලෙසජාල

**6.** කච්චායන හෝ මොග්ගල්ලායන ව්‍යාකරණ සම්ප්‍රදායයන්වල නොමැති අක්ෂරයක් වන්නේ කුමක්ද?

1. ඒ, ඕ, ඉ  2. ආ, ඊ, ඕ  3. ඍ, ඊ, එ  4. ආ, ඊ, ඌ

**7.** '**බ්‍යඤ්ජනානං කාදයො මකාරන්තා පඤ්ච පඤ්චසො අක්ඛරවන්තො වග්ගා**' යන පාඨයට අනුකූල නොවන වර්ණය ඇතුළත් පිළිතුර වන්නේ,

1. ය, ර, ල, ව, ස  2. ක, ඛ, ග, ඝ, ඞ  3. ත, ථ, ද, ධ, න  4. ප, ඵ, බ, භ, ම

**8.** පාලි අක්ෂර මාලාව තුළ ඇති අඝෝෂාක්ෂර නිවැරදිව දැක්වෙන වර්ණය වන්නේ,

1. 8කි.  2. 11කි  3. 21කි  4. 33කි.

**9.** '**බින්දු චූළාමණාකාරො**' ගාථාව යෙදී ඇත්තේ කුමන අක්ෂර වර්ගයක් හඳුන්වා දීම පිණිස ද?

1. ස්වර  2. නිග්ගහීතය  3. ධනිත  4. මහාප්‍රාණ

**10.** අන්තස්ථාක්ෂර හැඳින්වීමට භාවිත නොකරන පර්යාය වදනක් නොවන්නේ,

1. ස්පර්ශ 2. ද්වියාක්ෂර 3. ඊසම්පුට්ඨ 4. අවර්ග

**11.** '**ඔ**'කාරයේ උත්පත්ති ස්ථානය නිවැරදිව දැක්වෙන වර්ණය වන්නේ කුමක්ද?

1. කණ්ඨතාලුජ 2. දන්තොට්ඨජ 3. කණ්ඨතාලුජ 4. ඔට්ඨජ

**12.** සාවද්‍ය අක්ෂර වින්‍යාසයක් සහිත වදන වන්නේ මින් කුමක්ද?

1. සුලභතාය 2. දුලලභා 3. මුද්දිතපොත්‍තකං 4. පිටකත්‍තයං

**13.** '**ති, අන්ති**' ආදි ප්‍රත්‍ය ගැළපීමෙන් පද සාධනය වන්නේ,

1. ආඛ්‍යාත පදයි. 2. නාම පදයි 3. තද්ධිත පදයි 4. සමාස පදයි

**14.** නාම විභක්ති සංඛ්‍යාව නිවැරදි ලෙස දැක්වෙන වර්ණය කුමක්ද?

1. 7කි. 2. 8කි. 3. 9කි 4. 10කි.

**15.** '**සමිං, සු**' නාම විභක්ති ප්‍රත්‍ය මාලාව අන්තර්ගත වන්නේ කුමන නාම විභක්තියට ද?

1. පඤ්චමී විභක්ති 2. ඡට්ඨී විභක්ති 3. සත්තමී විභක්ති 4. දුතියා විභක්ති

**16.** '**සමපදානෙ චතුත්ථී**' විභක්තිය සඳහා යොදාගත හැකි නිදර්ශනයක් සහිත වර්ණය වන්නේ,

1. සො පාදෙන කන්‍දුකං පහරති. 2. සුනඛා ගාමා අපෙනති.

3. සමණසස චීවරං රොචතෙ . 4. රාජා පාසාදෙ වසති.

**17.** සාවද්‍ය පිළිතුරක් සහිත වර්ණය වන්නේ මින් කුමක්ද?

1. සොළස - සොරස 2. ද්වාවීසති- බාවීසති

3. සත්තදස - සත්තරස 4. චතුවීසති - චත්තාළීසති

**18.** '**............. ගාවං න විජානාති. ................. ගොගණං න රකඛති**' හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුර සහිත වර්ණය වන්නේ,

1. සො, යො 2. යො, අහං 3. තෙ, යං 4. යො, සො

**19.** කාරකයක් නොයෙදෙන නාම විභක්තියක් වන්නේ මින් කුමක්ද?

1. දුතියා විභක්ති 2. තතියා විභක්ති 3. චතුත්ථි විභක්ති 4. ඡට්ඨී විභක්ති

**20.** ඉච්ඡිත කම්ම යෙදෙන්නේ කුමන විභක්තියෙන් ද?

1. පඨමා විභක්තියෙනි. 2. ආලපන විභක්තියෙනි

3. දුතියා විභක්තියෙනි 4. තතියා විභක්තියෙනි

**21.** '**<u>බාහාසු</u> ගහෙත්‍වා**' මෙහි අංකිත පදයේ නාම විභක්තිය වන්නේ කුමක්ද?

1. චතුත්ථි විභක්තිය 2. පඤ්චමී විභක්තිය

3. ඡට්ඨී විභක්තිය 4 සත්තමී විභක්තිය

22. '**නමො යොගය**' යෙදෙන්නේ,

1. දුතියා විභක්තියෙනි. 2. කරණ විභක්තියෙනි.
3. චතුත්‍ථී විභක්තියෙනි. 4. පඤ්චමී විභක්තියෙනි.

23. නිර්ධාරණාර්ථයේ යෙදෙන්නේ පහතින් දැක්වෙන කුමන නාම විභක්ති ද්විත්වය ද?

1. දුතියා සහ තතියා විභක්ති 2. තතියා සහ පඤ්චමී විභක්ති
3. පඤ්චමී සහ ඡට්ඨී විභක්ති 4. ඡට්ඨී හා සත්තමී විභක්ති

24. ආඛ්‍යාත සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය සහිත වරණය තෝරන්න.

1. ආඛ්‍යාතවල ලිංග භේදයක් පවතී. 2. කාල වශයෙන් තුනකි.
3. කාරක වශයෙන් තුනකි. 4. වචන වශයෙන් දෙකකි.

25. '**ණ්හ, ප්ප**' විකරණ ප්‍රත්‍යය අයත් වන ධාතු ගණය වන්නේ කුමක්ද?

1. කියාදි ගණය 2. තනාදි ගණය
3. චුරාදි ගණය 4. ගහාදි ගණය

26. 'චිරං <u>රක්ඛන්තු</u> ලොකසාසනං' මෙහි ඉරි ඇඳි ආඛ්‍යාතය අයත් වන්නේ,

1. පඤ්චමී ආඛ්‍යාතයට ය. 2. සත්තමී ආඛ්‍යාතයට ය.
3. අජ්ජතනී ආඛ්‍යාතයට ය. 4. භවිස්සන්ති ආඛ්‍යාතයට ය.

27. සත්තමී ආඛ්‍යාත විභක්තියට පමණක් අයත් ආඛ්‍යාත ඇතුළත් වර්ණය වන්නේ කුමක්ද?

1. ධාවති, පචෙය්‍ය, වන්දතු 2. රක්ඛෙය්‍ය, ඛාදෙය්‍යුං, වන්දෙ
3. පපච, ධාවතු, හරෙය්‍ය 4. විවරෙය්‍ය, ගවේෂෙය්‍යුං, වන්දිස්සාමි

28. අතීත කාලයට පමණක් අයත් වන ආඛ්‍යාත විභක්ති ඇතුළත් වර්ණය තෝරන්න.

1. භවිස්සන්ති, අජ්ජතනී, පරොක්ඛා 2. වත්තමාන, අජ්ජතනී, පරොක්ඛා
3. කාලාතිපත්ති, අජ්ජතනී, හීයත්තනී 4. භවිස්සන්ති, කාලාතිපත්ති, හීයත්තනී

29. ක්‍රියා විශේෂණයක් නොවන පදයක් ඇතුළත් වරණය වන්නේ,

1. සීඝෙන, සනිකං, සුඛං 2. නිබද්ධං, සක්කච්චං, සාධුකං
3. දුක්ඛෙන, සුඛෙන, මුහුත්තං 4. මධුර, සහසා, සමං

30. '**ඉච්ඡත්‍ථෙසු සමානකත්තුකෙසු තවෙ තුං වා**' යනුවෙන් විග්‍රහ වන්නේ,

1. පූර්ව ක්‍රියා ය. 2. තුමන්ත ක්‍රියා ය.
3. ප්‍රයෝජ්‍ය ක්‍රියා ය 4. මිශ්‍ර ක්‍රියා ය.

31. ස්වර සන්ධිය පමණක් දැක්වෙන නිදර්ශන සහිත වර්ණය තෝරන්න.

1. කිංසූධ, ත්‍යජ්ජ, ස්වස්ස, අත්ථදත්තං 2. අප්පමාදො, තම්මිත්තං, ලොකග්ගෝ, ඉදාහං
3. අනෙවති, අවංසිරො, යානීධ, ගංගෝදය 4. බහුදෙව, යථරිව, ඔනද්ධා, පරොසහස්සං

32. '**මුනිසීහො**' සමාස පදය අයත් වන්නේ කම්මධාරය සමාසයේ කුමන ප්‍රභේදයට ද?
   1. විශේෂණ පූර්ව පද
   2. විශේෂණ උත්තර පද
   3. උපමා උත්තර පද
   4. අවධාරණ පූර්ව පද

33. පාලි භාෂාවේ සමාස ගණනින්,
   1. 5කි.
   2. 6කි.
   3. 7කි.
   4. 8කි.

34. '**ආලු, තර, තම, ඉස්සික...**' යනාදි වූ තද්ධිත ප්‍රත්‍යය අයත් වන්නේ,
   1. අපච්චත්ථ තද්ධිතයට ය.
   2. අනෙකත්ථ තද්ධිතයට ය
   3. භාව තද්ධිතයට ය.
   4. අත්ථ්‍යත්ථ තද්ධිතයට ය.

35. පූර්ව ක්‍රියාවක් යෙදුණු වාක්‍යයක් නොවන්නේ මෙයින් කුමක්ද?
   1. මනුස්සො ගාමං ගන්ත්වා භණ්ඩානි කිණාති.
   2. මාතා භත්තං පචිතුං ගෙහං පවිසති.
   3. ධනපාලො යාචකානං ධනං දත්වා සුඛං පත්තේති.
   4. භික්ඛු පිණ්ඩාය චරිත්‍වා අස්සමං පවිසති.

36. බුද්ධඝෝෂ හිමියන්ගේ පැවිදි ගුරුවරයා වූයේ කවුද?
   1. බුද්ධදත්ත හිමි ය.
   2. මහාදේව හිමි ය.
   3. රේවත හිමි ය.
   4. ධම්මපාල හිමි ය.

37. බුද්ධඝෝෂ හිමියන් මෙරටට වැඩම කළැයි සැලකෙන්නේ කිනම් රජුගේ කාලයේ දී ද?
   1. දේවානම්පියතිස්ස රජු දවස ය.
   2. මහසෙන් රජු දවස ය.
   3. මහානාම රජු දවස ය.
   4. වළගම්බා රජු දවස ය.

38. සමන්තපාසාදිකාව කිනම් පෙළ කෘතියක් සඳහා ලියූ අටුවා කෘතියක් ද?
   1. දීඝ නිකාය සඳහා ය.
   2. විනය පිටකය සඳහා ය.
   3. කතාවත්ථු ප්‍රකරණය සඳහා ය.
   4. මනෝරථපූරණී සඳහා ය.

39. බුද්ධමිත්ත තෙරුන්ගේ සමාරාධනයෙන් රචනා කළ අටුවා කෘතිය වන්නේ කුමක් ද?
   1. සුමංගල විලාසිනී
   2. පපඤ්චසූදනී
   3. සාරත්ථප්පකාසිනී
   4. මනෝරථපූරණී

40. උපසේන හිමියන් අටුවා කෘතියක් රචනා කළේ කිනම් පෙළ ග්‍රන්ථයට ද?
   1. නිද්දේස පාළියට ය.
   2. අපදාන පාළියට ය.
   3. පටිසම්භිදාමග්ගයට ය.
   4. බුද්ධවංසපාළියට ය.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020

## පාලි භාෂාව 2

## ආදර්ශ ප්‍රශ්න පත්‍ර - 12

කාලය පැය තුනයි.

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.**

**1 කොටසටත් 11 කොටසින් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**

**1.** (i) සිංහලට නගන්න.

අථ බො ආයසමා නන්දො තසසා රතතියා අචචයෙන යෙන හගවා තෙනුපසඞකමි. උපසඞකමිතවා හගවනතං අභිවාදෙතවා එකමනතං නිසීදි. එකමනතං නිසිනෙනා බො ආයසමා නන්දො හගවනතං එතදවොච: 'යං මෙ හනෙත හගවා පාටිහොගො; පඤ්චනනං අචඡරාසතානං පටිලාභාය කකුටපාදානං. මුඤ්චාමහං හනෙත හගවනතං එතසමා පටිසසවා''ති. මයාපි බො තෙ නන්ද චෙතසා චෙතො පරිචච විදිතො: ''නන්දො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුතතිං පඤ්ඤාවිමුතතිං දිටෙඨව ධමෙම සයං අභිඤ්ඤා සචඡිකතවා උපසමපජජ විහරතී''ති. දෙවතාපි මෙ එතමතථං ආරොචෙසි: ආයසමා හනෙත නන්දො හගවතො භාතා මාතුචඡාපුතෙතා ආසවානං ඛයා අනාසවං චෙතොවිමුතතිං පඤ්ඤාවිමුතතිං දිටෙඨව ධමෙම සයං අභිඤ්ඤා සචඡිකතවා උපසමපජජ විහරතී'ති. (ලකුණු 06 යි)

(ii) **සිංහලට නගන්න.**

සුදෙධ අනූනෙ මම භිකඛුසඞෙඝ - ලොකා ඉතො නිසසරිතුං කමනෙත,  
පභාතකාලෙ ව්‍යසනං ගභානං - දිසවාන නියාති ච චන්දලෙඛා.

පදෙතරා භිකඛුනියො ජිනගගං - තාරාව චන්දානුගතා සුමෙරුං,  
පදකඛිණං කතව නිපචච පාදෙ - ඨිතා මුඛනතං සමුදිකඛමානා.

''න තිතතපුබබං තව දසසනෙන - චකඛුං න සොතං තව භාසිතෙන,  
චිතතං මමං කෙවලමෙකමෙව - පපපුය්‍ය තං ධමමරසෙන තිතතිං. (ලකුණු 2X3 = 06යි)

**2.** (i). පාලියට නගන්න.

(අ) ඒ භික්ෂුව උදේ ම අවදි වී චෛත්‍ය මළුව අමදින්නේ ය.

(ආ) පින් කළ තැනැත්තා දෙලොව ම සතුටු වෙයි.

(ඉ) ධනපාල ඇතා රා කළ සොළසක් බී බුදුන් සමීපයට පැමිණියේ ය. (ලකුණු 2X3 = 06යි)

(ii) පහත දැක්වෙන ඡේදය කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අථ බො භිකඛවෙ කාළියා දාසියා එතදහොසි: සනතංයෙව බො මෙ අය්‍යා අජඣතතං කොපං න පාතුකරොති නො අසනතං මය්හමෙවෙතෙ කමමනතා සුසංවිහිතා, යෙන මෙ අය්‍යා සනතංයෙව අජඣතතං කොපං න පාතුකරොති නො අසනතං. යනනූනාහං භිය්‍යොසොමතතාය අය්‍යං වීමංසෙය්‍යනති. අථ බො භිකඛවෙ කාළී දාසී දිවාතරං උටඨාසි. අථ බො භිකඛවෙ වෙදෙහිකා ගහපතානි කාළිං දාසිං එතදවොච: හෙ ජෙ කාළීති. 'කිං අය්‍යෙ'ති? කිං ජෙ දිවාතරං උටඨාසීති? 'න බො අය්‍යෙ කිඤ්චී'ති නො වත රෙ කිඤ්චි පාපී දාසී. දිවාතරං උටඨාසීතී කුපිතා අනතතමනා අනතතමනවාචං නිචඡාරෙසි. අථ බො භිකඛවෙ කාළියා දාසියා එතදහොසි: සනතංයෙව බො මෙ අය්‍යා අජඣතතං

කොපං න පාතුකරොති නො අසන්තං. මය්හමෙවෙතෙ කම්මන්තා සුසංවිහිතා යෙන මෙ අය්‍යා සන්තංයෙව අජ්ඣත්තං න පාතුකරොති. නො අසන්තං. යන්නූනාහං හියෙ‍්‍යාසොමත්තාය අය්‍යං වීමංසෙය්‍යන්ති. අථ ඛො භික්ඛවෙ කාළී දාසී දිවාතරංයෙව උට්ඨාසි. අථ ඛො භික්ඛවෙ වෙදෙහිකා ගහපතානි කාළිං දාසිං එතදවොච. හෙ ජෙ කාළීති. 'කිං අය්‍යෙති? කිං ජෙ දිවාතරං උට්ඨාසීති? න ඛො අය්‍යෙ කිඤ්චීති. නො වත රෙ කිඤ්චි පාපී දාසී. දිවාතරං උට්ඨාසීති කුපිතා අනත්තමනා අග්ගළසූචිං ගහෙත්වා සීසෙ පහාරං අදාසි. සීසං වොභින්දි.

(අ) සිටුවරියගේ හා දාසියගේ නම් ලියන්න.

(ආ) දාසිය සිටුවරියගේ කෝපය පිරික්සා බැලුවේ කෙසේ ද?

(ඉ) දිවාතරං, අග්ගළසූචිං, අසන්තං, අජ්ඣත්තං යන පදවල අර්ථ ලියන්න.

(ඊ) ඉහත පාඨයෙන් සන්ධි පද දෙකක් උපුටා දක්වා විසන්ධි කරන්න. (ලකුණු 1+1+2+2 = 06යි)

## II කොටස

**3.** (i) ද්විජ අක්ෂරවල අක්ෂර උප්පත්ති ස්ථාන වෙන වෙනම දක්වන්න. (ලකුණු 2+4+6= 12යි)

(ii) පහත සඳහන් පද විසන්ධි කරන්න.

(i) එතදවොච (ii) කිඤ්චි

(iii) බහූපකාරා (iv) පාතොව

(v) පුථගෙව (vi) බුද්ධානසාසනං

(vii) සුමරති (viii) අක්කමති
